**වර්ෂ 2023. 01.04 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මූලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාවේ පෙ.ව. 9.30 වන විට සණ පූර්ණය නොමැති හෙයින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්. සෝමරත්න මහතා විසින් මහ සභාවේ කටයුතු පෙ.ව. 9.45 දක්වා කල්තැබීමට යෝජනා කල අතර එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ප්‍රේමා ගම්ලත් මිය විසින් ස්ථිර කරන ලදී.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

පැමිණීම - මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු.අ තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|
| 1. ගරු සභාපති | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමරත්න මල්කැකුල මහතා | පෙ.ව. 08.25 |
| 2. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ප්‍රේමා ගම්ලත් මිය | පෙ.ව. 08.30 |
| 3. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර් .සෝමරත්න මහතා | පෙ.ව. 09.17 |
| 4. . ගරු ප්‍රාසම | ශ්‍රී .ල.පො.පෙ | ජීවන් රණතුංගමහතා | පෙ.ව.9.25 |
| 5. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | ජී.ඒ.ජයසිංහ මහතා | පෙ.ව. 09.25 |
| 6. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.පී.තරංග නිල්මිණි මහතා | පෙ.ව. 9.30 |
| 7. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.එම්. ජයරත්න මහතා | පෙ.ව. 09.30 |
| 8. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | පී.ඩබ්.එස්.සම්පත් බොතේජු මහතා | පෙ.ව. 09.30 |
| 9. ගරු ප්‍රාසම | එ.ජා.ප | චන්ද්‍රලතා බන්ඩාර මිය | පෙ.ව. 09.37 |
| 10. ගරු ප්‍රාසම | එ.ජා.ප | ඉන්ද්‍රානි වික්‍රමසිංහ මිය | පෙ.ව. 09.38 |
| 11. ගරු ප්‍රාසම | එ.ජා.ප | නයනා ජීවනි අතුකෝරල මිය | පෙ.ව. 09.38 |
| 12. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා | පෙ.ව. 09.39 |
| 13. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මංගල කිත්සිරි ඩයස් මහතා | පෙ.ව. 09.40 |
| 14. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | චන්දිම යුරේශ් පතිරණ මයා | පෙ.ව. 09.40 |
| 15. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | දීප්ති චන්දන මහතා | පෙ.ව. 09.40 |
| 16. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කැළුම් ශ්‍රී ධර්මදාස මහතා | පෙ.ව. 09.45 |
| 17. රු ප්‍රාසම | එ.ජා.ප. | අයි.කේ.රංජන් ප්‍රදීප් මහතා | පෙ.ව. 09.50 |
| 18. ගරු ප්‍රාසම | ජ.වි.පෙ | එම්.ඩබ්.විකසිත පුෂ්පසූරිය මහතා | පෙ.ව. 09.50 |
| 19. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | එස්.ඩබ්.රන්ජිත් මෙන්ඩිස් මහතා | පෙ.ව. 09.52 |
| 20. ගරු උපසභාපති | ශ්‍රී.ල.පො.පෙ | ඒ.ජේ.අනිල් ලියනගේ මහතා | පෙ.ව. 10.00 |
| 21. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | රුවන් අශෝක පතිරන මහතා | පෙ.ව. 10.15 |
| 22. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | මාලනි පිරිස් මිය | පෙ.ව. 10.16 |
| 23. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ජී.ඩබ්.ජනක විමලසිරි මහතා | පෙ.ව. 10.18 |
| 24. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ඩබ්.එම්.මදූෂාණි වීරසිංහ මිය | පෙ.ව. 10.18. |
| 25. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.ඒ.දේවින්ද කුමාර මහතා | පෙ.ව. 10.20 |
| 26. ගරු ප්‍රාසම | එ.ජා.ප. | එම්.කේ. විජේසිරි මහතා | පෙ.ව. 10.20 |
| 27. ගරු ප්‍රාසම | එ.ජා.ප. | රනිල් එදිරිසිංහ මහතා | පෙ.ව.. 10.22 |
| 28. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.කේ. දයා කස්තුරි මිය | පෙ.ව. 10.25 |
| 29. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | රොෂාන් දේශප්‍රිය මහතා | පෙ.ව. 10.25 |
| 30. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එස්.ඒ.මහින්ද විජේකුමාර මහතා | පෙ.ව. 10.26 |
| 31. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | කේ.ඒ.අසංක දිල්ෂාන් මහතා | පෙ.ව. 10.27 |
| 32. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | ආර්.ඩිලාන් දර්ශන රණසිංහ මහතා | පෙ.ව. 10.27 |
| 33. ගරු ප්‍රාසම | එ.ජා.ප. | යසසිරි ප්‍රභාත් මහතා | පෙ.ව. 10.27 |
| 34. ගරු ප්‍රාසම | එ.ජ.නි.ස. | ඩබ්.කේ.තිලකාවති මිය | පෙ.ව. 10.48 |
| 35. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | බී.ජී.ජීවන් අබේවික්‍රමපාල මහතා | පෙ.ව. 10.49 |
| 36. ගරු ප්‍රාසම | ශ්‍රී.ල.පො.පෙ | එම්.ජී.ධනංජය වීරසේකර මහතා | පෙ.ව. 10.50 |
| 37. ගරු ප්‍රාසම | එ.ජා.ප. | කේ.එල්.එම්.ඩී.කරදන මිය | ප.ව. 10.50 |

01. පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරීම.

01-01.2022.12.09 මහා සභා රැස්වීම් වාර්තාව

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා :-</u>**

2022.12.09 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය :-</u>**

22.12.09 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

**<u>සංශෝධන අංක 01</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

මම කඩයක් සම්බන්ධ ලිපියක් පසුගිය මහා සභාවට ඉදිරිපත්කලා.ඒ ලිපිය සම්බන්ධව වාර්තාවේ නෑ. එසේම 22.12.09 වාර්තාවේ යෝජනා අංක 05-04 මගින් මම නඩුකාරදෙනිය වසමේ වොලිබෝල් පිටියේ ප්‍රතිසංස්කරනය කිරිම යෝජනාව යටතේ මේ පිටියේ ක්‍රීඩා භාන්ඩ දැමීමට

බාගෙට හදලා තියෙන මඩුවට ඒකේ වහලේ හදන්න ද්‍රව්‍ය ආධාර ඉල්ලුවේ.ක්‍රීඩා පිටියේ මඩුවේ වහලෙට ද්‍රව්‍ය ආධාර ලබාදීමට සහා සම්මත විය ලෙස සංශෝධනය විය යුතුයි.9 පිටුවේ "තණකොල "යන වචනය ලබකොල ලෙස මුද්‍රනය වි ඇත.එය නිවැරදි විය යුතුයි. 53 පිටුවේ ජල ව්‍යාපෘතිය සම්බන්දව "පෙත්සම් ගහන්නෙත් ඒ අය වෙන්නැති" ලෙස සඳහන් විය යුතුයි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

කඩ සම්බන්ද එම ලිපිය න්‍යාය පත්‍රෙය් නැත.ඉදිරි සභාවට යොමු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_202**2.12.09 **වන දින මහා සභා වාර්තාව ඉහත සංශෝධනයන්ට යටත්ව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

01- 02.2022.12.30 විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන එච්.එම්.සී.එස්.ධනවර්ධන මහතා :-</u>**

2022.12.30 වන දින විශේෂ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය :-**

2022.12.30 වන දින විශේෂ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉන්ද්‍රාණී වික්‍රමසිංහ මිය :-**

2022.12.30 වන දින විශේෂ සභා වාර්තාවේ 11 පිටුවේ පෙ.ව. 11.20ට මානෙල් වික්‍රමසිංහ මිය සභාගැබෙන් ඉවතට ගිය බව සඳහන් අතර එය ඉන්ද්‍රාණී වික්‍රමසිංහ මිය ලෙස නම සංශෝධනය විය යුතුය.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_**2022.12.30 වන දින විශේෂ සභා වාර්තාව ඉහත සංශෝධනයට යටත්ව **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

02.සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නොමැත.

03.ප්‍රාදේශිය සභාව අමතා එවනලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන

1. පළාත් පාලන කොමසාරිස්තුමන්විසින් යොමුකර ඇති වත්කම් හා බැරකම් ලබාගැනීම සම්බන්ද සිහිකැඳවීම.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

පළාත් පාලන කොමසාරිස්තුමන්විසින් 22.10.17 දින නැවතත් ලිපියක් යොමුකරමින් වත්කම් හා බැරකම් ප්‍රකාශ සම්බන්ධව සිහිකැඳවලා.මෙතෙක් ඒ ප්‍රකාශ දීලා නැති ගරු මන්ත්‍රිතුමන්ලා තුමියන්ලා ඒවා ලබා දෙන්න. සියළු දෙනට ඒ පෝරම දෙක බැගින් ලබාදීලා ඇති.වත්කමක් නැත්නම් ඒ බව හරි සඳහන් කරලා පෝරම දෙක දෙන්න.මේක නීතිමය අවශ්‍යතාවක්.

2. **ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

මෙම සභාවේ තීරනයක් අනුව 22.12.02 දිනැති ලිපිය මගින් ගැබිනි මව්වරුන් වෙත දෙන දීමනාව පැරණි ක්‍රමයට ලබාදෙන ලෙස ඉල්ලීමක් කුරුවිට ප්‍රාදේශිය ලේකම් වෙත යොමුකල අතර ඒ සඳහා පිලිතුරු ලෙස 22.12.13 දිනැති ලිපිය මගින් එම දීමනා ආධාර සියල්ල චක්‍ර ලේඛ පරිදි ලබාදෙන බව දන්වා ඇත.අදාල ලිපිය අවධානයට යොමු කරමි.

04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න නොමැත.

05.**යථා පරිදි කල් දී ඇති යෝජනා-**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

**05-01.කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල විසල් ජල යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් ජලනල එලීම සඳහා පළුදුකොට ඇති සියළු මාර්ග පිලිසකර කිරීමේ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල විසල් ජල යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් ජලනල එලීම සඳහා පළුදුකොට ඇති සියළු මාර්ග පිලිසකර කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
**කාර්මික නිලධාරි යොමු කර තොරතුරු අරන් කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
**විසල් නිසා නඩුකාරදෙනිය උඩ පාර බට එලන්න කාණු කපන්න කැඩුවා.සභාවෙන් කොන්ක්‍රිට් කල පාර.මැල්ලුම් දාලා වැහුවේ.දැන් හදපු පාර කඩාගෙන ගිහින්.දැන් ආරියරත්නගේ ගෙට වැටිලා.එතන බැම්මක් හරි හදලා දෙන්න.ගමනාගමනය නෑ.සභාවේ පාරක්.කඩිනමින් විසඳන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**විසල් ජලය සම්බන්ධව කටයුතු කල සියළු වසම්වල මේ ගැටළු තියෙනවා.ඒ තොරතුරු අරන් කාර්මික නිලධාරි යොමු කරලා කටයුතු කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමලසිරි ජයලත් මහතා
**පාරක් පළුදු උනා.පැතිබැම්ම බඳින්නත් අනුමත වුනා.ගිවිසුම් අත්සන් කලා.නමුත් වැඩේ කෙරුනේ නෑ.විසල් වැඩ කරන්නේ එකම කොන්ත්‍රාත් කරන කෙනෙක්ළු.තරංග කියලා.**
ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
**එහෙම කෙනෙක් පත් කරලා නෑ.දැනට මුදල් ඇවිත් නෑ. ආවාම මේ පාරවල් හදමු.මංගල මන්ත්‍රීතුමා කීවා වගේ කොන්ක්‍රිට් එකයි කාපට් එකයි අතර රඳා සිටිමක් නෑ.බැම්ම ගැන කාර්මික නිලධාරි වාර්තා ගත්තා.ඉදිරි කටයුතු කරනවා.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ_යෝජනාව අනුව
**කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල විසල් ජල යෝජනාක්‍රමය ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් ජලනල එලීම සඳහා පළුදුකොට ඇති සියළු මාර්ග පිලිසකර කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-02.පුස්සැල්ල වොලිබෝල් ක්‍රීඩා පිටිය අසල ප්‍රජා ශාලාව ඉදිකිරීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**පුස්සැල්ල වොලිබෝල් ක්‍රීඩා පිටිය අසල ප්‍රජා ශාලාව ඉදිකිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා
**මෙය එම ප්‍රෙද්ශයේ ජනතාවට විශාල අවශ්‍යතාවක්.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ_යෝජනාව අනුව පුස්සැල්ල වොලිබෝල් ක්‍රීඩා පිටිය අසල ප්‍රජා ශාලාව ඉදිකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.**

**05-03.එල්ලාවල ගංගාරාම විහාරාධිපති හා කිරිඇල්ල ශාසනාරක්ෂක බල මණ්ඩලයේ හිටපු සභාපති අති පූජ්‍ය ගන්නෝරුවේ විමලතිලක මාහිමිපානන්ගේ ආදාහන කටයුතු වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව සභා අරමුදලින් රු. 100000.00 ක් ලබා දීම සම්බන්ධ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**එල්ලාවල ගංගාරාම විහාරාධිපති හා කිරිඇල්ල ශාසනාරක්ෂක බල මණ්ඩලයේ හිටපු සභාපති අති පූජ්‍ය ගන්නෝරුවේ විමලතිලක මාහිමිපානන්ගේ ආදාහන කටයුතු වෙනුවෙන් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව සභා අරමුදලින් රු. 100000.00 ක් ලබා දීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

මෙම ස්වාමින් වහන්සේ සියම් නිකායේ අස්ගිරි මල්වතු පාර්ශවයේ අපේ පළාතේ ප්‍රධාන පන්සලේ .මහා සේවාවන් රැසක් සිදුකල ස්වාමීන් වහන්සේ නමක්.මම ගරු ආණ්ඩුකාරතුමා එක්ක කතාත් කලා.මෙම ප්‍රතිපාදනය ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය අරගෙන ගමේ

**පන්සලේ ගංගාරාම විහාරස්ථ දායක සභාවට දෙන්න. මේ ආදාහන කටයුත්තට හිමිවරු 180 නමක් වැඩියා.**
<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මෙම කටයුත්ත නීත්‍යානුකූලව සිදුකරන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ_යෝජනාව අනුව එල්ලාවල ගංගාරාම විහාරාධිපති හා කිරිඇල්ල ශාසනාරක්ෂක බල මණ්ඩලයේ හිටපු සභාපති අති පූජ්‍ය ගන්නෝරුවේ විමලතිලක මාහිමිපානන්ගේ ආදාහන කටයුතු වෙනුවෙන් සභා අරමුදලින් රු. 100000.00 ක් ලබා දීම ටත් ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

**05-04.දෙවිපහල ප්‍රධාන මාර්ගයේ සිට ඉහලගම විජයකුමාර මහතාගේ නිවස දක්වා ඇති පොදු මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය</u>**

**දෙවිපහල ප්‍රධාන මාර්ගයේ සිට ඉහලගම විජයකුමාර මහතාගේ නිවස දක්වා ඇති පොදු මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය ගේ</u> යෝජනාව අනුව දෙවිපහල ප්‍රධාන මාර්ගයේ සිට ඉහලගම විජයකුමාර මහතාගේ නිවස දක්වා ඇති පොදු මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**
**05-05.ආනන්දපුර ප්‍රධාන මාර්ගයේ සිට ජුසේ මහතාගේ නිවස දක්වා ඇති පොදු මාර්ගයේ**

**ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය</u>**

**ආනන්දපුර ප්‍රධාන මාර්ගයේ සිට ජුසේ මහතාගේ නිවස දක්වා ඇති පොදු මාර්ගයේ**

**ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය ගේ යෝජනාව අනුව ආනන්දපුර ප්‍රධාන මාර්ගයේ සිට ජුසේ මහතාගේ නිවස දක්වා ඇති පොදු මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිමට රු.500000.00 ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-06.කීරගල පහල කොටසේ ඇති ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිමට රු.50000.00 ක**

**ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය

**කීරගල පහල කොටසේ ඇති ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිමට රු.50000.00 ක**

**ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය ගේ යෝජනාව අනුව කීරගල පහල කොටසේ ඇති ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරිමට රු.50000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිනි ආනන්ද මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.

**05-07. අඩක් වැඩ නිමකර ඇති තලාවිටිය කේතුමති බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි සංවර්ධන කටයුතු සඳහා රු. 1500000.00 ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිනි ආනන්ද මහතා

**අඩක් වැඩ නිමකර ඇති තලාවිටිය කේතුමති බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි සංවර්ධන කටයුතු සඳහා රු. 1500000.00 ප්‍රතිපාදන ලබා දිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_** **<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිනි ආනන්ද මහතා ගේ</u>** **යෝජනාව අනුව අඩක් වැඩ නිමකර ඇති තලාවිටිය කේතුමති බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි සංවර්ධන කටයුතු සඳහා රු. 1500000.00 ප්‍රතිපාදන ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-08.පාසැල් ලමුන් ඉලක්ක කරගනිමින් මත්කුඩු හා මත්ද්‍රව්‍ය ලබාදෙන ජාවාරම්කරුවන්ට හා ඒවා බෙදාහරින්නන් හට දැඩිව නීතිය ක්‍රියාත්මක කරනලෙස අදාල අංශ දැනුවත්කරන ලෙස සිදුකරන යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිනි ආනන්ද මහතා</u>**

**පාසැල් ලමුන් ඉලක්ක කරගනිමින් මත්කුඩු හා මත්ද්‍රව්‍ය ලබාදෙන ජාවාරම්කරුවන්ට හා ඒවා බෙදාහරින්නන් හට දැඩිව නීතිය ක්‍රියාත්මක කරනලෙස අදාල අංශ දැනුවත් කිරීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිනි ආනන්ද මහතා</u>**

**මේ වෙන කොට අපේ පාසැල් ලමුන් විශාල ප්‍රමානයක් මේවාට ඇබ්බැහි වෙලා. අනාගත පරපුර.අයිස් නිසා රටේ අනාගතයම අඳුරේ.බෑග් චෙක් කරනවා ලමයින්ගේ බල්ලෝ පවා දාලා.**

**චෙක් කරන්න ඕනි මේ මත්දේ ගේන අයවයි.පොඩි ලමයි නෙමේ.නීතියෙන් මරණ දඩුවමයි දෙන්න ඕනි.වෙන දඬුවම් දීලා වැඩක් නෑ.අපි සභාවක් ලෙස තින්දු ගමු.රටට රජයට කියමු.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>**

**මේක එතුමාට විතරක් නෙමේ මේ අපි කාටත් පොදු ගැටළුවක්.එරත්නෙත් ලගදි මේ ලඟ දිනකදි සීඅයිඩී චෙක්කලා.මේවා කෙරෙන්නේ ඔන්ලයින්එ.ගස්ගල්යට පවා මේවාකෙරෙන තැන් වෙලා.එරත්නේ පාසැලෙත් දරුවන්ගේ බෑග් බැළුවා.අවාසනාවන්ත තත්වයක්.අපෙන් පස්සේ රටේ අනාගතය ඇත්තටම හිතා ගන්න බෑ.අපි සමාජයේ පොදු කටයුතු කරන අය.45 ම නමුත් මේවෙනකොට බොදු දේකට තරුන මැදිහත්වීම හරිම අඩුයි. ඒ අය වෙනම ලෝකවල .පෝන් එක එක්ක.දෙමව්පියන් හොයන දේත් මත් දේට වැය කරනවා. බරපතල කමක් නෑ ජීවිතේ.මේ මත්දේ ගලාගෙන ආවට ඒවා ගේන පිරිස් වලට දෙන දඬුවම් මදි.පොඩි පොඩි අන්ව අල්ලා හිරේ දැම්මට මදි.නිදහස් අනත් ආයේ කරන්නේත් ඒක.පාතාලයත් එහෙමයි. කව්රුත් බයයි.මේවා නැති කරන්න. අඩු ගානේ සතියකට සැරයකි හරි විසිට් එකක් දාලා ගම්වල හෙව්වොත් මේවා මර්දන ය වෙනවා.එරත්නෙත් අධික ලෙස තියෙනවා.අදාල අංශ දැනුවත් කරන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>**

විශාල පරිමානයේ වෙලෙඳුන් ඇල්ලුවට ඇපත්දීලා නිදොස් කරලා ගෙදර අරිනවා.පාසැල් ලමයින්ගේ බෑග් බලන එකත් හොඳයි. කොට කෙතනේ දුර දිග ගියේ මේ වගේ පොඩි දෙයක්.විශාල සාතන උනා.ඒ නිසා පරික්ෂා කරන එක හොඳයි.ඒ වගේමයි ආදර්ශ වියු යුතු අයත් මේ වැරදි දේ කරනවා. නම් ගම් උනත් කියන්නපුළුවන්.කසිප්පු බුරු ගැහිලි සේරම ගමේ කරනවා.මේ දේ හැම රජයක් යටතෙම වෙනවා. මේවා වෙනස් විය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

මේ ප්‍රශ්නය දැඩි පීඩනයක් රටට.අද පාසැල් පද්ධතියට පවා මේ උවදුර පැතිරිලා.නීතිහදන්නේ පාර්ලිමේන්තුව.රට වටේ මුහුදු සීමාව තිබුනත් මේ මත්ද්‍රව්‍ය සීමාවක් නැතිව රටටඑනවා.මේවාට දේශපාලකයොත් වග කියන්න ඕනි.මේක ජාවාරමක්. මේ තුලින් රටේ ශ්‍රම බලකාය බෙලහින වෙනවා.පිට රැටියෝ ඒකට කැමතියි.සමහරු මේ රටට මොනා උනත් තමන්ගේ වාසියට මේවා කරනවා.මිණී අළු පවා මේවාට දානවළු.මේවා ඉතාමත් අහිතකරයි මිනිසාට.විකෘති මානසිකත්ව නිසා අපේ අනාගතය අඳුරේ.හැකි විධිහට මේතත්වය ගමෙන් තුරන් කරන්න දායක වෙමු.මේවා අදාල අංශවලට දන්වමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දිම යුරේස් මහතා

සාමාන්‍යයෙන් ඇහැලියගොඩ පොලිසියට නඩු ගනනාවක්දාන්නවෙනවළු දිනකට මේ මත්ද්‍රව්‍ය ගැන.නමුත් මේවෙනකොට මත්ද්‍රව්‍ය ගෙනාපුවා ඉවරවෙලා.කානිවල් එක නිසා.නඩු තුනයි තිබිලා තියෙන්නේ.ඇහැලියගොඩ ගඟෙන් එහා හරිම භයානක විධිහට මත්ද්‍රව්‍ය .ඒවාට විරුද්ධව කතා කලාම පුදුම විධිහට ඒවා ආරංචි වෙන්නේ.ඒවාට විරුද්ධ නැති අයට සෙනඟත් ඕනි තරම් ඉන්නවා. මාධ්‍ය වගකියන්නත් ඕනි ප්‍රධාන වශයෙන්ම මේවාට.මේවා පුදුම විධිහට මත්ද්‍රව්‍ය පිලිබඳ ප්‍රචාරනය දෙන්නේ. පාසැල් බාලිකා පාසැල් නයිට් ක්ලබ්, පිරිහිලා.දැන් මේ බහුතරයක් බන්ධනාගාරවල.මූද වටෙනුයි මේ කුඩු ගේන්නේ.දේශපාලන අධිකාරිය පූර්න ලෙස වගකියන්න ඕනි මේවාට.මේවා නැතිකිරීමේ ශක්තිය ඒඅය සතුවිය යුතුයි.ගමෙන් ඔත්තු දෙන්නත් දැන් මිනිස්සු බයයි.ඉහල අයට හැකියි මේක නවත්තන්න.ඒත් කරන්නෑ ඒක තමන්ට පාඩු නිසා. ඒ අය වාසි ගන්නවා.මේ තත්වය කෙසේ හෝ වෙනස් විය යුතුයි රට ගොඩනැගීමට නම්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

ගමේ ශ්‍රමදානෙට අපි කිව්වම එන්නේ ටික දෙනයි. නමුත් මේ මත් ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රධානීන් කිව්වොත් ගමම එයි.ඒ ඒ අයගේ හැම දේටම උදව් කරන්න ශක්තිය ඒ මුදලාලිට තියෙන හින්දා.

කුඩු මුදලාලිලා ගමෙන් තුරන් කරන්න තනිව නම් කොහොමත්කටයුතු කරන්න බෑ.තමන් හුදකලා වෙනවා විතරයි. ඒකට ගමම එකතු වෙන්න ඕනි.අපේ අනාගත පරපුර අපරාදේ අඳුරටයි යන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

පොලිසියවත් මේව ඇල්ලුවේ නැති උනාට පතලේ අල්ලනවා.ගමේ තනියම කරන්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා

මේවා නවත්තපු කාලෙකුත් තිබුනා.කුලතුංග මහත්තයාගේ කාලෙදි .ඊයෙ මම දැක්කා මත්/දුම්වැටි සියයට 20 ක් මිල ඉහල දාලා.ආණ්ඩුව යැපෙන්නේ සුරාබදු වල අධික බදු දඩ ආදායම් මත.ඒ නිසා පොලිසියත් නඩු දාන්න ඕනි. මේ ආදායම් සභාවටත් ලැබෙනවා.රට සංවර්දනය වියු යුතුයි.මතින් තොරද විය යුතුයි. අතිතයෙත් තිබුනා මත් ද්‍රව්‍ය. ගොවියා කම්කරුවා ඇඟේ වෙහෙසට අමාරුවට සවසට රා ටිකක් බිව්වා.නමුත් පසුකාලිනව ක්‍රමයෙන් මේවගේ මිල රජයත් මැදිහත්වෙලා වැඩිකලා. ක්‍රමයෙන් නිතිවරෝධීව මේවා හොරෙන් පෙරුවා.ඒවා ශරීරයට අහිතකරයි.ලෙඩ වැඩියි.ශ්‍රම බලකාය බෙලහීන වෙනවා.විශාල අපරාධයක් රටට.බොන මිනිහා කීය දිලා හරි බොනවා.ගෙදරට කන්න නැතත් බොනවා.තරුන පරපුර මේකට ගොදුරුවෙලා. සාරධර්මයක් නෑ.කිසිම වැඩිහිටියෙක්ව ගනන් ගන්නේ නැති තත්වෙට පත්වෙලා.දිනෙන් දින පරිහානියට පරපුර යනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා</u>

මේ වෙනකොට ගම්වල පැතිරිලා මේ උවදුර.පොලිසි ගියත් මේක නවතින්නෑ.අපි කල හැකි හැමදෙයක්ම කරමු. මේක නවත්තන්න.නීතිය තදින්ම ක්‍රියාත්මක කරලා මේක නවත්තන්න බල කරමු.පාර්ලිමේන්තුවට වගකිමක් තියෙනවා මේ ගැන.ඒ අයට බොහෝවිට මේවාට බලපත්‍ර තියෙනවා.ඒ අය ලාභ උපයනවා.එක මන්ත්‍රී කෙනෙකුට 125 ක් බලපත්‍ර තියෙනවා කියලා ලංකාදීපෙ තිබුනා.පාසැල්වලදරුවන් පරික්ෂා කරනවා. නමුත් හැකි හැම විටම වගකිවයුතු මේ මත් බලවත්තු නිදහස් වෙලා යවනවා.කංජිපානි ඉම්රාන් .ඉන්දියාවට ගියේ කොහොමද?මේ කුඩු හරහා ලාභ උපයන සම්මාදම් පිරිස් වැඩියි.හඩ නැගුවට මදි.අපි උනත් මේ ඒවගේ මත් මුදලාලිලාගෙන් කිසිදු උදව්වක් ගැනීම ප්‍රතික්ෂේප කරන්න ඕනි. ඒවිට ඒ අයගේ උවමනා වෙනුවෙන් අපි මැදිහත්වෙන්න ඕනි නෑ.බේරගන්න පොලිසි යන්න ඕනි නෑ.හැකි සැම දෙයක්ම කරමු ජනතාව මේ මත් උවදුරින් මිදවිමට.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිහ මහතා</u>

මේ මත් උවදුරට විරුද්ද විය යුතු අයම ඒවාට පූර්න අනුග්‍රහයදිලා.වැඩිම මත්ද්‍රවයය වලට අදාල අත්අඩංගුවට ගැනිම් කලේ ගෝඨාභය ජනාධිපතිතුමාගේ කාලේ.රජයේ ආයතන වාහන වල මේවා ප්‍රවාහනය වෙලා.නිලධාරින් විශාල පිරිසක් පෝෂනය වෙලා මේ මත්ද්‍රව්‍ය වලින්.හරියට කරනවානම් එක සතියක් කැප වෙලා මේ උවදුර තුරන් කරන්න පුළුවන්.නඩු විතරයි.සාධනීය හැඟිමකින් විධිමත් වැඩපිලිවෙලක් ඕනි.පාලනය කල හැකියි.සමහර පොලිස් නිලධාරින්ව ඇගයිමට ලක් කලා මේ මත්ද්‍රව්‍ය වැටලිම් කරලා මත්ද්‍රව්‍ය තුරන් කිරිමට කැප වෙලා.නමුත් කොටසක් යැපෙන අය.ඇහැලියගොඩ සංගීතේ අස්සේ ප්‍රසිද්ධයේ අයිස් විකුනනවා.තත්වය ඒක.තෙසේ උනත් නිතිය මීට වඩා විධිමත්ව ක්‍රියාත්මක විය යුතුයි.දෙමව්පියොත් මේ වා වැලැක්විමට දැඩිව මැදිහත්විය යුතුයි.ලමයි පිලිබද දැඩි සෙවිල්ලනේ සිටිය යුතුයි.කතාව පමනක් මදි. මේ සම්බන්දව ප්රායෝගිකවම මැදිහත්වෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා</u>

අපි ගමෙන් පටන්ගමු.පොලිසිය,මන්ත්‍රිලා 5ක්විතර ආරක්ෂක කමිටුව ගමු.රත්නපුර පොලිස් අධිකාරිට දැනුමුදෙමු.නව වසරේ අපි පටන්ගමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය</u>

**අමද්‍යප රැස්වීම තියෙනවා. ඒදිනටම මේකත් කරමු.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**අපේ ගම්වලත් තියෙනවා. මේ ප්‍රශ්නය.අවුරුදු දෙකකට පෙර අපි සාකච්ඡා කරලා කුඩු බොන අය ඒකෙන් මිදවීමට බෙහෙත්දිලා යොමු කරලා ඒත් දෙමව්පියන් කැමති නෑ තමන්ගේ ලමයා කුඩුබොන බවවත් පිලිගන්න.දැන් ගමේ දහගුනයකින් වැඩියි මේ තත්වය.කටයුතුකරන්න ගියා.**

**ඥාතියෙක් උනත් මම ලෑස්ති නෑ කුඩු ගහලා මැරිලා ඉන්න කෙනෙකුගේ මරනෙටවත් යන්න.අපේ නෑදෑවෙන අයත් මේ ගොඩේ ඉන්නවා.රටේ තත්වය වැඩිවෙලා පාලනය කරගන්න බැරි වගකිව යුතු අයම මේවාගෙන් යැපෙන නිසා.ගමේ උනත් නොබොන අයෙක් හොයාගන්න බෑ.ඒ අය පාසැලෙන් පිට උන ගමන් ලමයින්වත් මේකට ඇදලා ගන්නවා.ගෑනු ලමයිනුත් මේවාට ඇබ්බැහි වෙලා.භයානකයි.මනස වෙනස් කරන්න තමා වෙන්නේ.දයා මන්ත්‍රීතුමියත් පටන් ගන්න. අපි හැම වසමේම කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

**හොඳ වැදගත් පවුලක් ගමේ හිටියා. දෙමව්පියෝ ගුරුවරු. නමුත් ඒ පුතා මතට ඇබ්බැහිවෙලා දැන් ඉන්න ගෙයි සේරම බඩු පවා විකුනනවා.ඛේදනීයයි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිනි ආනන්ද මහතා ගේ **යෝජනාව අනුව පාසැල් ලමුන් ඉලක්ක කරගනිමින් මත්කුඩු හා මත්ද්‍රව්‍ය ලබාදෙන ජාවාරම්කරුවන්ට හා ඒවා බෙදාහරින්නන් හට දැඩිව නීතිය ක්‍රියාත්මක කරනලෙස අදාල අංශ දැනුවත් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-09.තලාවිටිය පොදු සුසාන භූමියේ දැනට පවතින ගොඩනැගිල්ලේ වහලය දිරාපත්වී ඇති අතර නිසා එම ඉඩමේ ඇති කොස් ගස් වෙන්දේසි කර එම ගොඩනැගිල්ල සාදාගැනිම සම්බන්ධ යෝජනාව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණි මහතා

**තලාවිටිය පොදු සුසාන භූමියේ දැනට පවතින ගොඩනැගිල්ලේ වහලය දිරාපත්වී ඇති අතර නිසා එම ඉඩමේ ඇති කොස් ගස් වෙන්දේසි කර එම ගොඩනැගිල්ල සාදාගැනිමට යෝජනා කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කාර්මික නිලධාරි වාර්තා හා අවශ්‍ය අනෙක් වාර්තාගෙන අරන් මෙම කටයුත්ත නීත්‍යානුකූලව කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිනි ආනන්ද මහතා ගේ</u> **යෝජනාව අනුව තලාවිටිය පොදු සුසාන භූමියේ දැනට පවතින ගොඩනැගිල්ලේ වහලය දිරාපත්වී ඇති අතර නිසා එම ඉඩමේ ඇති කොස් ගස් වෙන්දේසි කර එම ගොඩනැගිල්ල සාදාගැනිම සම්බන්ධයෙන් කාර්මික නිලධාරි හා අවශ්‍ය අනෙක් වාර්තාගෙන නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>

**05-10. දැඩි ආර්ථික ගැටළු හා රෝගාබාධ නිසා පීඩාවට පත්ව සිටින කුරුවිට පදිංචි ඩී.එම්.චමිලා ශානේෂි මියගේ පවුල වෙත කරුණාසහගත දීමනාවක් ලබාදෙන ලෙස සිදු කරන යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය</u>

**දැඩි ආර්ථික ගැටළු හා රෝගාබාධ නිසා පීඩාවට පත්ව සිටින කුරුවිට පදිංචි ඩී.එම්.චමිලා ශානේෂි මියගේ පවුල වෙත කරුණාසහගත දීමනාවක් ලබාදිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය</u>

එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය</u>

**මේ සම්බන්ධයෙන් ඉල්ලිම් ලිපියක්ද ඇත.470/බී,හිග්ගස්හේන කුරුවිට පදිංචි චමිලා ශානේෂි මියගේ සැමියා හදිසි අනතුරකට ලක්ව වම්පාදය අහිමි වූඅතර දකුනු පාදයද තුන්පලකින් අස්ථි බිඳී ඇත.ඔහු තවමත් ජාතික රෝහලේ ප්‍රතිකාර ලබන අතර ප්‍රතිකාර, ගමන් වියදම් මෙන්ම දරුවන්ගේ ආහාර , ගෙදර වියදම් සදහා කිසිදු ආදායමක් නොමැති බැවින් අසරනව සිටින බවත් මෙම සියළු කටයුතු වෙනුවෙන් කල හැකි උපකාරයක් ඉල්ලා සිටි. ඒ නිසා මේ පවුල හට නීත්‍යානුකුලව කරුණාසහගත දීමනාවක් ලබාදෙනමෙන් ඉල්ලමි.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන ලබා දිමට කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය ගේ_යෝජනාව අනුව දැඩි ආර්ථික ගැටළු හා රෝගාබාධ නිසා පීඩාවට පත්ව සිටින කුරුවිට පදිංචි ඩී.එම්.චමිලා

**ශානේෂි මියගේ පවුල වෙත ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගෙන නීත්‍යානුකූලව කරුණාසහගත දීමනාවක් ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ජීවන් රණතුංග මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

**05-11.වනඉදල කැටිය දිදුල සේවා පියසේ දැල් ආවරනය යොදා ඉතිරි සංවර්ධන කටයුතු අවසන් කිරීමේ යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ජීවන් රණතුංග මහතා</u>**

**වනඉදල කැටිය දිදුල සේවා පියසේ දැල් ආවරනය යොදා ඉතිරි සංවර්ධන කටයුතු අවසන් කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ජීවන් රණතුංග මහතාගේ</u>**

**යෝජනාව අනුව වනඉදල කැටිය දිදුල සේවා පියසේ දැල් ආවරනය යොදා ඉතිරි සංවර්ධන කටයුතු අවසන් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා.</u>**

**05-12.දෙවිපහල හම්මනාව පාර සංවර්ධනය කිරිම සදහා රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාගැනිමේ යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා</u>**

**දෙවිපහල හම්මනාව පාර සංවර්ධනය කිරිම සදහා රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.**

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතාගේ</u>**

යෝජනාව අනුව දෙවිපහල හම්මනාව පාර සංවර්ධනය කිරිම සදහා රු.1000000.00 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මේ අවස්ථාවේ මාහට අවස්ථාවක් අවශ්‍යයි. කුරුවිට සභා වෙළද සංකීර්නයේ ඉහල මහලේ සම්මන්ත්‍රන ශාලාව ඉදිකිරිම දෙක අධියර සම්බන්දව ප්‍රකාශයක් කිරිමට.එම වෙළද සංකීර්නයේ සම්මන්ත්‍රන ශාලාව මේවනවිට පවතින මිල වැඩිවිම් මත පළාත් සභාවෙන් එම මිල වැඩිවිම් අනුමත කරලා.ඇස්තමේන්තුව ඇතුලේ.කාර්මික නිලධාරිට එන්නකීවා.

මේ අවස්ථාවේදි ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ යෝජනා කිරීමෙන් හා_ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ ස්ථිරත්වයෙන් මහා සභාව කාරක සභාවක් බවට පත්විය.

මෙහිදි කාර්මික නිලධාරිසමන්ත මහතා විසින් මෙම ඇස්තමේන්තුවේ තොරතුරු මහා සභාවට ඉදිරිපත්කලඅතර රුපියල් එක්කෝටි හැට අටලක්ෂයක මුදල හදිසි මිල වැඩිවිම්මත රු.2302501.39 දක්වා වැඩිපුර මිල වැඩිවීමක් සිදු වූ බව ප්‍රකාශ කලේය.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

මීට පෙර වාරික ගෙව්වානේද? මිට පෙර මේ ගොඩනැගිල්ල හදපු වෙලේ අපි ඒක සභාවෙන් අනුමැතිය දුන්නා වැඩිවිම් වලටත්.දැන් ආයෙත්. එස්එස්ආර් දාලාබැරිද?

<u>කාර්මික නිලධාරි සමන්ත මහතා</u>

මේ අන්තිම බිල.ද්‍රව්‍ය මිල වැඩිවිමයි වෙලා තියෙන්නේ.විසිතුන්ලක්ෂ දෙදාස්ගානක් තියෙනවා.

ගිවිසුම් අත්සන් කල කාලය තුල ගිවිසුම තුල මිල වැඩිවිම්.අධියර දෙකක්.මේකට එස්එස්ආර් ගලපන්න බෑ.මේක ද්‍රව්‍ය මිල වැඩිවිමක්.කර්මාන්ත මුදල ඇතුලත යන්නේ.ඉක්ටැඩ්( Ictad )ගිවිසුම් අනුව මේක හිමිකමක්.එක්කෝටිගානේ ඇස්තමේනතුව ඇතුලේ මේ මුදල තියෙනවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මේ මුදල ගෙවීම නිත්‍යානුකූලයි.කර්මාන්ත මුදල ඇතුලේ යන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

හිමිකම තිබුනට ඉල්ලන හැමදේම දෙන්නබෑ.2021 ත් මිල ගනන් වැඩිවිම් තිබුනා.දැනගෙනයි මේ කලේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

නිතර ඉල්ලිම් මිල වැඩිවිම් කොමසාරිස්ට දාලා අවශ්‍යනිර්දේශ අරන් ගෙවන්න.

කාර්මික නිලධාරි සමන්ත මහතා

ඒ නිර්දේශ සියල්ල අරන් තියෙන්නේ.

ලේකම් තුමිය-නොගෙවා සිටිම තුල නීතිය ඉදිරියටත් යන්න පුළුවන්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

මෙය යෝජනාවක් ලෙස ඉදිරි සභාවට දාන්න.මම විරුද්ධයි.මේගැන කිසිවක් දන්නේ නෑ.න්‍යායපත්‍රෙය් නෑ.මම විරුද්ධයි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මේක නියම ක්‍රමවේදයට කලේ.නමුත් ද්‍රව්‍ය නැතිඋනා.මමත් මැදිහත්වෙලා ඇතැම් ද්‍රව්‍ය අරන් දුන්නේ.මේක නිත්‍යානුකූල උනත් පොදු සභාතීරනය අවශ්‍යයි.ආයෙත් ඉදිරි සභාවට මාසයක් යනවා.ගැටළුවක් තියෙනම් විසදමු.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

පූර්ව දැනුම්දීමක් නෑ.ඇයි දෙසැම්බර් වනවිටවත් මේතත්වය සභාවට දැනුම්දුන්නැත්තේ?මට ප්‍රසාදයක්නෑ මේ ගැන.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

2021 ගිවිසුම් අත්සන් කලා නම් අපිට ගෙවන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයසිංහ මහතා

සිමෙන්ති මිල ඉහල ගියා.වැඩිවෙනකොට සභාවෙන් ඉල්ලිම් කරන්න තිබුනා.මේ අවස්ථාවේ දානඑක සැකයක්.වංචාවක් වෙලාද හිතන්න පුළුවන්.වසරත් අවසානයි.සේරම මන්ත්‍රිලට තියෙන්නේ ගැටළුවක්.ලක්ෂ 23 ක් වැඩිවෙනකොට එක පාරින් උනේ නෑ. ඉල්ලිම් කරන්න තිබුනා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මෙතුමා සභාව නොමග අරිනවා.කිසුදු වංචාවක් මෙතැන නෑ. සියල්ල නිවැරදියි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා

මිල වැඩිවිම් උනා.රු. 300 පටන්ගත්ත සිමෙන්ති 1100 වෙලා.රැඳවුම් හිලව් කලා ඇස්තමේන්තුව තුලම කලා.කොන්ත්‍රාත්කරුට හිමිකමක් තියෙනවා ඉල්ලන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මේ මිල වැඩිවුන විධිහ කාර්මික නිලධාරි හදන්න.මේක වෙන කෙනෙකුට දෙන්නත් තිබුනා.මිට පෙර නිම කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

ටෙන්ඩර් කලේ ක්‍රම වේදයට.මේ වැඩිවුන මිල එකතු කරලා එකපාර මුදල කිව්වේ.මාසේ මාසේ දැම්මේ නෑ.මේකේ කොපි දෙන්නම් බලන්න.කාර්තුව අවසානේ තමා ඉල්ලා තියෙන්නේ.

මේ අවස්ථාවේදි ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතාගේ යෝජනා කිරීමෙන් හා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහා සභාව බවට පත්විය.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

සම්මන්ත්‍රනශාලාව කටයුතු නිත්‍යානුකූලව ඇවිත් තියෙන්නේ.ඇස්තමේන්තුව ඇතුල කටයුතු.ගැටළු නෑ.සියළු නිර්දේශ ලිඛිතව තියෙනවා.න්‍යායපත්‍රයට දාලානෑ.වෙන සභාවකට දාන්නපුළුවන්.ගෙවන්නැතිව බෑ.එපා කියන අය අත උස්සන්න.සියළු නිලධාරින් අනුමැතිය දීලා.විශේෂ සභාවක් කැඳවනවා.එතෙක් කැමැත්ත අකැමැත්ත කියන්න.කාර්මික නිලධාරිපැහැදිලිකිරිම් මදිද?

මේ අවස්ථාවෙදී ගරු මංගල ඩයස් මහතා,අනිල් ලියනගේ මහතා,ජී.එම්.ජයරත්න මහතා ,ජයසිංහ මහතා,අසංක දිල්ෂාන් මහතා නයනා ජීවනි මෙනවිය,චන්ද්‍රා බණ්ඩාර මිය,දේවින්ද මහතා විජේසිරි මහතා ප්‍රභාත් මහතා, අත ඉස්සූ අතර ගරු අප සභාපති අනිල් ලියනගේ මහතා මෙවැනි යෝජනාවක් න්‍යායපත්‍රෙය් ඇතුලත්කර කටයුතු කලයුතුබවත් වගකීමක් ඇතිව කටයුතු කලයුතුබවත් අවධාරනය කලේය.නයනා ජීවනි මිය විසින් මේ සඳහා විශේෂ සභාවක් කැදවන ලෙස දැනුම්දුනි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>

කමිටුවක් දාන්න.එතකොට ගැටළුවක්නෑ.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

කමිටුවට පත්කරන්න පිරිස.ඒකට දාලා පස්සේ විශේෂ කමිටුවක් තියෙනවා.

මේ අවස්ථාවේදී ගරු ප්‍රාසම අසංක දිල්ෂාන් මහතා, ගරු ප්‍රාසම ජීඑම් ජයරත්න මහතා, ගරු ප්‍රාසම ඩිලාන් දර්ශන මහතා, ගරු ප්‍රාසම ජයසිංහ මහතා, ගරු ප්‍රාසම විජේසිරි මහතා, ගරු ප්‍රාසම දේවින්ද කුමාර මහතා,ගරු උපසභාපතිතුම,ඉන්ද්‍රාණි වික්‍රමසිංහ මිය ලේකම්තුමිය හා වෂය නිලධාරි කාර්මික නිලධාරිපිරිස මෙම කමිටුවට නම්කරන ලදී.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

කුතුහලයක් දිලා ජේෂ්ඨ මන්ත්‍රීවරු පසුපසට යාම උචිත නෑ.ඍජු ප්‍රතිපත්ති තිබිය යුතුයි.මුදල්කමිටුවට පවා එන්නෑ.යම් විධිහක අපහසුතාවයට පත්වෙනවා සියළු දෙනාම . මේ කටයුත්ත ක්‍රමවේදයකට ගන්න විධිහ යෝජනා කලාම ඒකටත් පස්ස ගහනවා නම් ඒක යුතුනෑ.විවේචන නිවැරදි ලෙස පමනක් කරන්න.වැරදි ආදර්ශ දෙන්න එපා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**ජේෂ්ය කියලා  කියන එකේ තේරුම ඇත්ත නෙමේ.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  කැළුම් ශ්‍රී ධර්මදාස  මහතා**

**මුනිවත රැකීම වැරදියි.එතුමන්ලාව ආදර්ශයට ගන්නේ හැමෝම.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මංගල ඩයස් මහතා**

**අපි කියනදේ විතරක් පිලිගන්න එපා.අපි අපේ අදහස් කීවේ. අයිටම් ගානේ වැඩිවන ගාන කියන්න.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**කමිටුවට ඉදිරිපත්කරලා විශේෂ සභාවට දානවා.2023.01.11 විශේෂ සභාව.පෙ.ව.9.30ට පවත්වනවා.න්‍යායපත්‍රය එවන්නම්. තව වට්ස්ඇප්දානවා.අනිවාර්යෙන් විශේෂ සභාවට සහභාගී වෙන්න.**

**යථා පරිදි කල් දී ඇති යෝජනා යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා.**

**05-13. කුරුවිට ප්‍රාදේශිය සභාවේ වාහන වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉන්ධන ලබාගැනීම සඳහා සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ ඇප තැම්පත් මුදලක් තැම්පත් කිරිම සම්බන්ද යෝජනාව.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ වාහන වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉන්ධන ලබාගැනීම සඳහා සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ ඇප තැම්පත් මුදලක් තැම්පත් කිරිමට යෝජනා කරමි.**

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා**

**එම යෝජනාව ස්ථිර කරමි**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

**මෙ සම්බන්ධයෙන් කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ සාමාන්‍යාධිකාරි විසින් ඉල්ලීම් ලිපියක්ද ඉදිරිපත්කර තියෙනවා.ඒ අනුව සභාව මගින් 2022 වර්ෂය සඳහා සමුපකාර සමිතියේ තැම්පත් කරන ලද රු.350000.00 ක මුදල අයවිය යුතු ඉන්ධන සඳහා හිලව්කරන බවත් 2023 වර්ෂයට අදාලව ණය පදනම මත ඉන්ධන ලබා ගැනීමට රු.800000.00 ක ඇප තැම්පත් මුදලක් සමුපකාර සමිතිය වෙත තැම්පත් කරන ලෙසත් දන්වා ඇත.ඒ අනුව අප සභාවට ණය පදනම මත ඉන්ධන ලබා ගැනීමට රු.800000.00 ක ඇප තැම්පත් මුදලක් සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය වෙත තැම්පත් කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ වාහන වෙනුවෙන් 2023 වර්ෂය තුල ඉන්ධන ලබාගැනීම සඳහා සී/ස කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතියේ රු.800000.00 ක ඇප තැම්පත් මුදලක් තැම්පත් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-14. කුරුවිට ප්‍රාදේශිය සභාවේ ණය හිමි ලේඛනයේ 2011 සිට 2019 දක්වා ඇති නය හිමි ශේෂ මුදල් ලේඛනයෙන් ඉවත් කිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ ණය හිමි ලේඛනයේ 2011 සිට 2019 දක්වා ඇති නය හිමි ශේෂ මුදල් ලේඛනයෙන් ඉවත් කිරිම සඳහා මහා සභා තීරනයක් ලබාදීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**2011 වර්ෂයේ සිට 2019 දක්වා කාලයට අදාළ ණයහිමි ගෙවීම් ශේෂ පහත සදහන් පරිදි ණයහිමි ලේඛනයේ මේ දක්වාම සඳහන්වන අතර ඒ පිලිබඳව නිරන්තරව විගනන විමසුමට ලක්ව ඇත.**

**එම ණය හිමි ශේෂ අතර සභාව විසින් නොගෙවා ඇති දැනට ගෙවීම් කිරිමට කල් ඉකුත්ව ඇති වෙනත් වැය ශීර්ෂ යටතේ ගෙවීම් කර ඇති හා ගෙවීම් සිදුකලපසු ඉතිරිය ලෙස සඳහන් වෙන් කිරිම් ඇති බව ගෙවීම් මුදල් ලේඛන හා වැය ලේඛනවලින් පැහිදිලි වන බව විසය නිලධාරි විසින් දක්වා ඇත.2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාලව ගෙවිම් සිදුකල පසු ඉතිරිය ලෙස ශේෂ සටහන්වන ණය හිමි වෙන් කිරීම් පිලිබඳව අදා විස්තර විෂය නිලධාරි විසින් පහත පරිදි ඉදිරිපත්කර ඇති අතර එම වෙන් කිරිම් ආදායමට ගැනිමට හා ඉන්පසු එම ණය හිමි ශේෂ ලේඛනයෙන් ඉවත් කිරිමටත් අවශ්‍ය කටයුතු කරමු.මෙම මුළු ශේෂ එකතුව රු.2152941.51 ක් වේ. තොරතුරු පහත දක්වා ඇත.**

| අනු අංකය | වර්ෂය | විස්තරය | ශේෂව ඇති ණයහිමි ගෙවීම් මුදල රු. |
|---|---|---|---|
| 1. | 2011 | විගණන දෙපාර්මේන්තුව-2011 විගණන ගාස්තු | 4594.18 |
| 2. | | මොහාන් එන්ටර්ප්‍රයිසස්-සන අපද්‍රව්‍ය ව්‍යාපෘතිය | 1237211.17 |
| 3. | | ඇඳිරියන්වල බටතොට ග්‍රාම සංවර්ධන සමිතිය-දෙවිපහල අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරිම | 4600.00 |
| 4. | | තෙප්පනාව,මැදගම ග්‍රාම සංවර්ධන සමිතිය-ගනේගල්ල මහ දෙල්ගහ මූකලාන පාර කොන්ක්‍රීට් කිරිම | 24175.00 |
| 5. | | බටහිර කාහේන්ගම සමෘද්ධි බලකාය-තෙප්පනාව රෝහල පිවිසුම බෝක්කුව තැනීම | 2005.83 |
| 6. | | තලාවිටිය පැරකුම් ගොවි සංවිධානය-තලාවිටිය පහලගම පාර කොන්ක්‍රීට් කිරිම | 4000.00 |
| 7. | | මෙනේරිපිටිය මැදවත්ත සමෘද්ධි බලකාය-අළු පොත පාර කොන්ක්‍රීට් කිරීම | 634.64 |
| 8. | | සුහද ප්‍රජා මණ්ඩලය-දික්දෙණිය ගොමල ඔය පාර බැම්ම බැඳීම - | 3889.59 |

| | | | |
|---|---|---|---|
| | | රුදවුම | |
| 9. | | මුණසිංහපුර ග්‍රාමීය සමෘද්ධි බලකාය-ඇල්ලගාව සිට ඇල්ලකන්ද පාර මුල කොටස දුෂ්කර ස්ථාන කොන්ක්‍රීට් කිරීම | 428.98 |
| 10. | | මැදවත්ත සමෘද්ධි බලකාය-තිරිවාන පැලවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2441.80 |
| 11. | | බෙන්දළුව ග්‍රාම සංවර්ධන සමිතිය-නාමල්දෙණිය ප්‍රජා ශාලාව අසල මාර්ගය | 6239.68 |
| 12. | | මැදවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය-බැද්දහේන පාර කොන්ක්‍රීට් කිරීම | 13108.00 |
| 13. | | බෙන්දළුව ග්‍රාම සංවර්ධන සමිතිය-මෙනේරිපිටිය ඉහළවත්ත පාර කොන්ක්‍රීට් කිරීම | 20055.16 |
| 14. | | හාන්දුකන්ද ජලයෝජනා ක්‍රමය යටතේ ටැංකි ඉදිකිරීම හා බට නෙලීම 10% | 8657.32 |
| | | **එකතුව** | **13,32,041.35** |
| 1. | 2012 | ඩී.එම් .ඩී . විලියම් අප්පුහාමි සහ පුත්‍රයෝ-ඉන්ධන ගාස්තුව - දෙසැම්බර් | 3873.00 |
| 2. | | බ්‍රවුන්ස් සහ සමාගම-270-680 අලුත් වැඩියාව සඳහා අමතර කොටස් | 2299.94 |
| 3. | | පුවක්ගහ වෙල වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය-මාතෘ සායනය බිමට සිමෙන්ති දැමීම | 9736.07 |
| 4. | | තෙප්පනාව ඉහලගම පැරකුම් ගොවි සංවිධාන සමිතිය තෙප්පනාව මැදගම ආරාමය හා වලගොඩැල්ල පාර වීරසේන මහතාගේ නිවස අසල සිට | 4900.00 |
| 5. | | මෙනේරිපිටිය ගොවි සංවර්ධන සමිතිය-මෙනේරිපිටිය ගලේගොඩවත්ත පාර ක්‍රොන්ක්‍රීට් කිරීම. | 135.00 |
| 6. | | බෙන්දළුව ග්‍රාම සංවර්ධන සමිතිය.- ලෙල්ලගොඩ ප්‍රජා ශාලාව අසල පැති බැම්ම ඉදි කිරීම | 1960.48 |
| 7. | | දෙල්ගමුව ග්‍රාම සංවර්ධන සමිතිය-හිස්ගස්වත්ත කණිෂ්ඨය අසල අතුරු මාර්ගය කොන්ක්‍රට් කිරීම | 817.20 |
| 8. | | මෙන්රිපිටිය මැදවත්ත සමෘද්ධි සමිතිය-වැලිහිඳ රවන පටුමග මාර්ගය පිළිසකර කිරීම | 194.80 |
| | | **එකතුව** | 23916.49 |
| 1. | 2013 | දෙල්ගමුව ග්‍රාම සංවර්ධන සමිතිය මෙනේරිපිටිය අළු පොත පාර පැති බැම්ම බැඳීම | 32.50 |
| 2. | | ලස්සකන්ද ග්‍රාමීය සමෘද්ධි බලකාය බොරළුව මඩොල් මණ්ඩිය ගම් සභාගාර පස් කපා ඉවත් කර පාර කොන්ක්‍රීට් කිරීම | 50.00 |
| 3. | | පත්බේරිය බටහිර ගොවි සංවිධානය -වැටුම්මල ප්‍රජා ශාලාව අලුත්වැඩියාව (ග්‍රිල් ගැසීම) | 10834.04 |
| 4. | | දෙල්ගමුව ග්‍රාම සංවර්ධන සමිතිය මෙනේරිපිටිය පාලම ළඟ කඩය අසල පෙට්ටි බෝක්කුව ඉදිකිරීම. | 200.00 |
| | | **එකතුව** | 11116.54 |
| 1. | 2014 | සී/ස රත්නපුර දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය -ලිපිද්‍රව්‍ය ලබා ගැනීම | 57485.00 |
| 2. | | නීතිඥ සනත් ආර්.පෙරේරා- නීතිඥ ගාස්තු | 18000.00 |
| 3. | | නීතිඥ හේමක සේනානායක- නීතිඥ ගාස්තු | 20000.00 |
| 4. | | සී/ස කුරුවිට විවිධ සේ.ස .සමිතිය- ද්‍රව්‍ය ලබා ගැනීම | 19043.25 |
| 5. | | කුරුවිට ග්‍රාමීය සමෘද්ධි සමිතිය පහල කුරුවිට තණ බිම් ක්‍රීඩා පිටිය අසල නාන ළිඳ තැනීම | 30716.85 |
| 6. | | බටහිර පත්බේරිය ගොවි සංවිධානය පොත්දෙණිය පන්සල අසලින් පාර කොන්ක්‍රීට් කිරීම | 5472.83 |
| 7. | | පාතගම ග්‍රාම සංවර්ධන සමිතිය දුම්මලේගොඩ කළුකැලේ පාර කැපීම | 6523.75 |
| 8. | | දොඩම්පෙ නාගොඩ සමෘද්ධි සමිතිය හල්පෙ පුංචි තැපල්ගම ප්‍රජාශාලාව පාර කොන්ක්‍රීට් කිරීම. | 2308.60 |
| 9. | | කැන්දලන්ද සංවර්ධන සමිතිය වගවත්ත අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 4083.33 |
| 10. | | තෙප්පනාව ඉහලගම ග්‍රාම සංවර්ධන සමිතිය කඳන්ගොඩ 53 කණුව අසලින් කුඹුරුවෙල පාර කොන්ක්‍රීට් කිරීම. | 8364.60 |
| 11. | | නාගොඩ සමෘද්ධි සමිතිය දොඩම්පෙ නාගොඩ ප්‍රජා ශාලාව පිවිසුම් මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 818.00 |

| | | | |
|---|---|---|---|
| 12. | | බටහිර කාහේන් ගම ග්‍රාමීය සමෘද්ධි බලකාය පොහොරබාව කොනේගෙදර වත්ත පාර කොන්ක්‍රීට් කිරීම. | 8396.55 |
| 13. | | ද /සූදාගල ග්‍රාමීය සමිතිය කනේගල්ල අතුරු පාර සඳහා හියුම් පයිප්ප ලබා දීම | 2400.00 |
| 14. | | පුවක්ගහවෙල වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය තුංඅදහේන අදිකාරිය මාර්ගය බෝකුව සඳහා පැති බැම්ම ඉදිකිරීම | 700.00 |
| 15. | | තෙප්පනාව පුබුදු සවිය ග්‍රාමීය සංවිධානය කඳන්ගොඩ ජනපදය අසලින් උඩපාර කොන්ක්‍රීට් කිරීම. | 147.48 |
| 16. | | තෙප්පනාව පුබුදු සවිය ග්‍රාමීය සංවිධානය විල්ලගස්වත්ත හරස් පාර කොන්ක්‍රීට් කිරීම. | 3557.50 |
| 17. | | තෙප්පනාව ඉහලගම ග්‍රාම සංවර්ධන සමිතිය -නාමල්දෙණිය අංක 05 අඹතලේ නිවස අසල මාර්ගය කොන්ක්‍රීට් කිරීම. | 12417.39 |
| 18. | | අමුහේන්කන්ද ගොවි සංවිධානය අමුහේන්කන්ද අතුරුපාර කොන්ක්‍රීට් කිරීම. | 5156.55 |
| 19. | | නාමල්දෙණිය ජනපදය ග්‍රාමීය සංවිධානය මෙනේරිපිටිය වතුපිටිය වත්ත පාර කොන්ක්‍රීට් කිරීම. | 492.00 |
| 20. | | වතුයාය සමෘද්ධි සමිතිය වතුයාය සුසාන භූමියේ සුසානාගාරය අ. වැ. හා ගොඩනැගිල්ලට අනතුරුදායක ගස් ඉවත් කිරීම | 2082.15 |
| 21. | | පරගලතැන්න ග්‍රාම සංවර්ධන සමිතිය පරගලතැන්න ක්‍රීඩා පිටියේ ප්‍රේක්ෂකාගාරය සඳහා විදුලිය ලබා දීම. | 1500.00 |
| 22. | | දෙල්ගමුව ග්‍රාම සංවර්ධන සමිතිය කඳන්ගොඩ ජනපදය නාන පීල්ල සංවර්ධනය කිරීම. | 9348.65 |
| | | **එකතුව** | 219014.48 |
| 1. | 2015 | ආර්.ඩී.අමරරත්ත්න-සිරි ඔටෝ ඉලෙක්ට්‍රිකල්56-5633 කැබ්රථය අලුත් වැඩියාව | 1000.00 |
| | | **එකතුව** | **1000.00** |
| 1. | 2017 | විගණන දෙපාර්තමේන්තුව- විගණන ගාස්තු | 37863.80 |
| | | **එකතුව** | **37863.80** |
| 1. | 2018 | තරංග නිල්මිණි ආනන්ද ජූනි ,ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් ඔක්තොම්බර්, නොවැම්බර් ,දෙසැම්බර් මාසවල ඉන්ධන දීමනාව. | 340.00 |
| 2. | | බී.ජී .ජීවන් අබේවික්‍රමපාල ජූනි ,ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් ඔක්තොම්බර්, නොවැම්බර් ,දෙසැම්බර් මාසවල ඉ. දීමනාව. | 340.00 |
| 3. | | ඩිලාන් දර්ශන රණසිංහ ජූනි ,ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් ඔක්තොම්බර්,නොවැම්බර්,දෙසැම්බර් මාසවල ඉන්ධන දීමනාව | 340.00 |
| 4. | | එස්. එච් .අසංක එරන්ද ජූනි ,ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් ඔක්තොම්බර්, නොවැම්බර් ,දෙසැම්බර් මාසවල ඉන්ධන දීමනාව | 334.00 |
| 5. | | එච් .කේ. එම්. ධනවර්ධන ජූනි ,ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් ඔක්තොම්බර්, නොවැම්බර් ,දෙසැම්බර් මාසවල ඉන්ධන දීමනාව | 334.00 |
| 6. | | බී.ආර්. ඒ .මුදිතා ශ්‍රීමතී ජූනි ,ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් ඔක්තොම්බර්,නොවැම්බර්,දෙසැම්බර් මාසවල ඉන්ධන දීමනාව. | 334.00 |
| 7. | | රනිල් එදිරිමසිංහ ජූනි ,ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර් ඔක්තොම්බර්,නොවැම්බර්,දෙසැම්බර් මාසවල ඉන්ධන දීමනාව. | 334.00 |
| 8. | | ඩබ්.එම්.මධුෂානි ජූනි ,ජූලි ,අගෝස්තු ,සැප්තැම්බර්,දෙසැම්බර් මාසවල දුරකථන දීමනාව ගෙවීම් | 2095.00 |
| 9. | | ඩයලොග් ඇසියටා P.L.C ප්‍රා.ස.ම. එම් මාලනී පිරිස් මියගේ දෙසැම්බර් මස දීමනාව | 1111.52 |
| 10. | | එම් .කේ විජේසිරි අගෝස්තු ,සැප්තැම්බර් ඔක්තොම්බර්,නොවැම්බර්,දෙසැම්බර් මාසවල දුරකථන දීමනාව ගෙවීම | 850.3.85 |
| 11. | | ඉන්ද්‍රාණී වික්‍රමසිංහ නොවැම්බර් මස දුරකථන දීමනාව ගෙවීම | 1547.99 |
| 12. | | ඩබ්.කේ . තිලකාවති ,සැප්තැම්බර් ,ඔක්තොම්බර් ,නොවැම්බර් දෙසැම්බර් මාසවල දුරකථන දීමනාව ගෙවීම. | 2208.16 |
| 13. | | ලේකම් ප්‍රධාන අමාත්‍යාංශය /පළාත් පාලන කොමසාරිස් 2018 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා උසාවි දඩ මුදලින් 1% ක කාර්ය මණ්ඩල දිරි දීමනා ගෙවීම. | 18847.59 |

| | | | |
|---|---|---|---|
| 14. | | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් පලාත් පාලන විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවීම -මාර්තු මාසය | 10588.36 |
| 15. | | යටිපච්ච පුබුදු ගොවි සංවිධානය යටිපච්ච ජයමාලි උයන මාර්ගය කොන්ක්‍රීට් කිරීම -වැඩ අවසන් හා 10% රඳවුම. | 3243.97 |
| 16. | | අඩවිකන්ද සමනල ගොවි සංවිධානය එරත්න මාර්ගයේ සිට කලායතනය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම වැඩ අවසන් කිරීම 10% රඳවුම | 147.71 |
| 17. | | කොස්ගල ග්‍රාම සංවර්ධන සමිතිය කිතුල්පේ කැන්දලන්ද මාර්ගය කොන්ක්‍රීට් කිරීම වැඩ අවසන් කිරීම 10% රඳවුම | 2395.26 |
| 18. | | අමුහේන්කන්ද ගොවි සංවිධානය අමුහේන්කන්ද පාර කොන්ක්‍රීට් කිරීම වැඩ අවසන් කිරීම - 10% රඳවුම | 685.64 |
| 19. | | අමුහේන්කන්ද ගොවි සංවිධානය එල්ලාවල වේවැල්දොල මාර්ගය සංවර්ධනය කිරීම -වැඩ අවසන් 10% රඳවුම | 9346.48 |
| 20. | | තලාවිටි පැරකුම් ගොවි සංවිධානය තලාවිටිය උඩගම පාර කොන්ක්‍රීට් කිරීම වැඩ අවසන් කිරීම වැඩ අවසන් හා 10% රඳවුම | 8072.59 |
| 21. | | තලාවිටිය පැරකුම් ගොවි සංවිධානය පොද්දෙණිය පන්සල පාර කොන්ක්‍රීට් කිරීම වැඩ අවසන් හා 10% රඳවුම | 9152.53 |
| 22. | | ගාමිණී රත්නායක 28671/M,28672/M,28673/M,28674/M,27111/L,30117/L අංක දරණ නඩු සඳහා නීතිඥ ගාස්තු ගෙවීම | 10000.00 |
| 23. | | පැලෑඳ හාඩ්වෙයාර් වීථි ලාම්පු සවිකිරීම සඳහා ලබාගත් වයර් සඳහා ගෙවීම | 11100.00 |
| 24. | | පැලෑඳ හාඩ්වෙයාර් කුරුවිට ප්‍රාදේශීය සභා බල සීමාවෙහි වීථි පහන් අළුත් වැඩියාව සඳහා ලබා ගත් විථි පහන් කට්ටල වෙනුවෙන් ගෙවීම | 63240.00 |
| 25. | | බෙන්දළුව /නාමල්දෙණිය ග්‍රාම සංවර්ධන සමිතිය බෙන්දළුව ප්‍රජාශාලාව සංවර්ධනය කිරීම වැඩ අවසන් 10% රඳවුම | 0.59 |
| 26. | | Union chemists (pvt )Ltd කිරිඇල්ල ආයුර්වේදය සඳහා අවශ්‍ය රුධිර පීඩන මානයක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම | 6000.00 |
| | | **එකතුව** | **162139.39** |
| 1. | 2019 | සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ අධිකාරිය - කාර්යාලීය කටයුතු සඳහා අවශ්‍ය ලේඛන හා අකෘති පත්‍ර මුද්‍රණය කර මිලදී ගැනීම | 0.34 |
| 2. | | ප්‍රා.ස.ම.ජීවන් අබේවික්‍රමපාල- ජනවාරි සිට දෙසැම්බර් දක්වා දූරකථන දීමනාව ගෙවීම | 31680.04 |
| 3. | | ප්‍රා.ස.ම.කේ.කේ.දයාවතී මිය- සැප්තැම්බර්,නොවැම්බර්,දෙසැම්බර් මාස සඳහා දූරකථන දීමනාව ගෙවීම | 8476.01 |
| 4. | | ප්‍රා.ස.ම.ධනංජය වීරසේකර මයා- ජූලි හා දෙසැම්බර් මස දූරකථන දීමනාව ගෙවීම | 3000.00 |
| 5. | | එම්.මාලනී පිරිස් මිය- ජූලි,අගෝස්තු,ඔක්තොම්බර්,නොවැම්බර්,දෙසැම්බර් මාස සඳහා දූරකථන දීමනාව ගෙවීම | 6347.60 |
| 6. | | මොබිටෙල් පුද්ගලික සමාගම- ජී.ඩබ්.ජනක විමලසිරි මයාගේ දෙසැම්බර් මස දූරකථන දීමනාව ගෙවීම | 1185.40 |
| 7. | | මොබිටෙල් පුද්ගලික සමාගම- ඩී.රවීන් විනෝද් මහතාගේ දෙසැම්බර් මස දූරකතන දීමනාව ගෙවීම | 449.03 |
| 8. | | පී.කේ.ලක්මාල් රුවන් කුමාර මයා- ජනවාරි,පෙබරවාරි,මාර්තු,අප්‍රේල්,මැයි හා දෙසැම්බර් මාස සඳහා දූරකතන දීමනාව ගෙවීම | 15000.00 |
| 9. | | ඩයලොග් ආසියාටා පී.එල්.සී.- රංජිත් මෙන්ඩිස්ගේ දෙසැම්බර් මස දූරකතන දීමනා ගෙවීම | 634.98 |
| 10. | | ජීවන් රණතුංග මයා- ජූලි,සැප්තැම්බර්,දෙසැම්බර්, මාස සඳහා දූරකතන දීමනා ගෙවීම | 5164.77 |
| 11. | | විගණකාධිපති- 2019 වර්ෂය සඳහා විගණන ගාස්තු ගෙවීම | 62600.00 |
| 12. | | ගාමිණී රත්නායක මයා- නිතීඥ ගාස්තු ගෙවීම | 11000.00 |
| 13. | | බී.එල්.ඒ.කන්ස්ට්‍රක්ෂන්- හින්ද විජේකුමාර මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ | 6000.00 |

| | | | |
|---|---|---|---|
| | | දෙමංහන්දිය මාර්ගය සඳහා ද්‍රව්‍ය ලබා දීම | |
| 14. | | බී.එල්.ඒ.කන්ස්ට්‍රක්ෂන්- මහින්ද විජේකුමාර මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වැලිහිඳ ඉහළ කොටස මාර්ගය සඳහා ද්‍රව්‍ය ලබා දීම | 9700.00 |
| 15. | | බී.එල්.ඒ.කන්ස්ට්‍රක්ෂන්- මහින්ද විජේකුමාර මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ වැලිහිඳ කීරගල මාර්ගය සඳහා ද්‍රව්‍ය ලබා දීම | 9700.00 |
| 16. | | නාමල්දෙණිය ග්‍රාම සංවර්ධන සමිතිය- පාලුවත්ත පීල්ල පාර කොන්ක්‍රීට් කිරීම | 117.62 |
| 17. | | බටහිර මුදුන්කොටුව නිර්මාණ ග්‍රාම සංවර්ධන සමිතිය- බෝටියාදෙණිය වත්ත පාර කොන්ක්‍රීට් කිරීම | 16369.04 |
| 18. | | ගොරකඇළ දීප්ති ග්‍රාම සංවර්ධන සමිති- කුරුගම්මෝදර මොරටුවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1686.67 |
| 19. | | ලස්සකන්ද ගොවි සංවිධානය- විතාරංපංගුව ප්‍රජාශාලාවේ වැසිකිළිය ඉදි කිරීම | 2503.34 |
| 20. | | ගොරකඇල දීප්ති ග්‍රාම සංවර්ධන සමිතිය- ගොන්වල සිට කැන්දලන්ද පාර කොන්ක්‍රීට් කිරීම | 3306.00 |
| 21. | | බටුහේනවත්ත ග්‍රාම සංවර්ධන සමිතිය- බටුහේන කොස්ගොඩ ප්‍රජා ශාලාව අසල ළිඳ අළුත්වැඩියා කිරීම | 9615.37 |
| 22. | | බටුහේන්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය- බටුහේන සුමුදු පෙර පාසලේ සෙල්ලම් මිදුල සකස් කිරීම | 0.96 |
| 23. | | ලස්සකන්ද ගොවි සංවිධානය- එරත්න ශ්‍රී පාද මාර්ග සුද්ද කිරීම | 2553.31 |
| 24. | | කිතුල්පේ ග්‍රාම සංවර්ධන සමිතිය- හල්පේ සමගි මාවත ජනක නිමල් නිවස අසල පාර කොන්ක්‍රීට් කිරීම | 3653.67 |
| 25. | | බටහිර පත්බේරිය ගොවි සංවිධානය- වැටුම්මල කරඳනගහහේන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1857.87 |
| 26. | | නාමල්දෙණිය ග්‍රාම සංවර්ධන සමිතිය- අළුපොත මාර්ගයේ වැල්ලලන්ද කුඹුර අසල පැති බැම්ම ඉදි කිරීම | 1357.69 |
| 27. | | අමුහේන්කන්ද ගොවි සංවිධානය- නාමල්දෙණිය ප්‍රජා මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම | 102.09 |
| 28. | | හල්පේ පැරකුම් ගොවි සංවිධානය- පුංචි තැපැල්ගම කන්ද උඩ ලීලා මල්කාන්ති මහත්මියගේ නිවස දෙසට කොන්ක්‍රීට් කිරීම | 1240.00 |
| 29. | | සුදාගල ගොවි සංවිධානය- දෙමැද උඩවත්ත පන්සල මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 692.77 |
| 30. | | උඩකඩ මෛත්‍රීක් වැඩිහිටි සමිතිය- එරත්න දැරණියගල මාර්ගයේ පැරණි ශ්‍රී පාද මාර්ගය සංවර්ධනය කිරීම | 755.78 |
| 31. | | කීරගල එකමුතු ගොවි සංවිධානය- කීරගල ජිනදාස මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 2653.01 |
| 32. | | බටහිර මුදුන්කොටුව නිර්මාණ ග්‍රාම සංවර්ධන සමිතිය- මාටුවාගල නො/05,හේන්යාය සඳහා නල ළිඳක් තනා ජලය ලබා දීම | 5213.45 |
| 33. | | බටහිර පත්බේරිය ගොවි සංවිධානය- පත්බේරිය පන්සල පසු කර නාන තොටුපළ ඉදි කිරීම | 8632.65 |
| 34. | | පැළෑඳ හාඩ්වෙයාර්- විදී පහන් අලුත්වැඩියාව සඳහා විදී පහන් කට්ටල 96 ක් මිලදී ගැනීම වෙනුවෙන් ගෙවීම | 132600.00 |
| | | එකතුව | **365849.46** |

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ ණය හිමි ලේඛනයේ 2011 සිට 2019 දක්වා ඇති ඉහත දක්වා ඇති පරිදි මුළු නය හිමි ශේෂය වන රු. 2152941.51 ක මුදල ආදායමට ගැනීමටත් ණය හිමි ලේඛනයෙන් ඉවත්කිරිමටත් මහා සභා ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-15.** කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආර්.එක්ස්. 2004 ගලි බවුසරයේ අළුත්වැඩියා කටයුතුකිරීම වෙනුවෙන් විමල් ඇග්‍රොටෙක් ආයතනය වෙත මහා සභා අනුමැතියට යටත්ව අංක 1949 හා 22.12.21 දරන වවුචර් පතින් රු.784110.00 මුදලක් ගෙවා ඇති අතර එම ගෙවීම වෙනුවෙන් මහා සභා අනුමැතියක් ලබාගැනීමේ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආර්.එක්ස්. 2004 ගලි බවුසරයේ අළුත්වැඩියා කටයුතුකිරීම වෙනුවෙන් විමල් ඇග්‍රොටෙක් ආයතනය වෙත මහා සභා අනුමැතියට යටත්ව අංක 1949 හා 22.12.21 දරන වවුචර් පතින් රු.784110.00 මුදලක් ගෙවා ඇති අතර එම ගෙවීම වෙනුවෙන් මහා සභා අනුමැතියක් ලබාදීමට යෝජනා කරමි.මෙය 2021.12.03 දිනැති සභාවේ කාර්මික කමිටුවේදී ගත් තීරනයක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණි මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>
අදාල අළුත්වැඩියාවන් නිසි පරිදි සිදු කර ඇත්ද?

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

සිදුකර ඇති අළුත්වැඩියාවන් සම්බන්ධව තොරතුරු ලබාදී ඇත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>
අළුත්වැඩියා කරලා මොකද කරන්නේ?.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

නිවිතිගල සභාවේ ගලි සේවා කටයුතු සඳහා ලබාදුන්නේ. අපේ ගලිත් ගන්නවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>
මුදල් අපතේ යාමක් සිදුවෙයිද?

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.
Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව
කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආර්.එක්ස්. 2004 ගලි බවුසරයේ අළුත්වැඩියා කටයුතුකිරීම වෙනුවෙන් විමල් ඇග්‍රොටෙක් ආයතනය වෙත මහා සභා අනුමැතියට යටත්ව අංක 1949 හා 22.12.21 දරන වවුචර් පතින් රු.784110.00 මුදලක් ගෙවා ඇති අතර එම ගෙවීම සඳහා මහා සභා අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx

**05-16.**එරත්න අඩවිකන්ද ජල පාරිභෝගික සමිතිය විසින් ඉදිරිපත්කර ඇති එරත්න අඩවිකන්ද ඉන්දොල ජල සමිතිය සඳහා 2022 වසර සඳහා වන සාමාජික මුදල ලබාදෙන ලෙස සිදු කර ඇති ඉල්ලිම සම්බන්ධ යෝජනාව

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**එරත්න අඩවිකන්ද ජල පාරිභෝගික සමිතිය විසින් ඉදිරිපත්කර ඇති එරත්න අඩවිකන්ද ඉන්දොල ජල සමිතිය සදහා 2022 වසර සදහා වන සාමාජික මුදල ලබාදෙන ලෙස සිදු කර ඇති ඉල්ලිම සම්බන්ධව මහා සභා තීරනයක් ගැනිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා

**මෙම යෝජනාව සම්බන්ධව කිසිදු විස්තරයක් නොදන්නා අතර එරත්න අඩවිකන්ද ඉන්දොල ජල සමිතිය සදහා 2022 වසර සදහා වන සාමාජික මුදල සභාව මගින් දරන්නේ ඇයි?**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**පෙර ඉදන් මේ බිල සභාව මගින් දරනවා.මේ සම්බන්ධව ගරු කැළුම් මන්ත්‍රිතුමා කරුනු බලන්න. ඉදිරි සභාවට යොමු කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව එරත්න අඩවිකන්ද ජල පාරිභෝගික සමිතිය විසින් ඉදිරිපත්කර ඇති එරත්න අඩවිකන්ද ඉන්දොල ජල සමිතිය සදහා 2022 වසර සදහා වන සාමාජික මුදල ලබාදෙන ලෙස සිදු කර ඇති ඉල්ලිම සම්බන්ධව මහා සභා තීරනයක් ගැනීම සඳහා කරුනු සොයා බලා ඉදිරි සභාවට යොමුකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-17.සණස රක්ෂන සමාගම විසින් ඉදිරිපත්කර ඇති 22.12.15 දිනැති ආයෝජන සැලස්ම පිලිබඳ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**සණස රක්ෂන සමාගම විසින් ඉදිරිපත්කර ඇති 22.12.15 දිනැති ආයෝජන සැලස්ම පිලිබඳ මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා

**එම යෝජනාව ස්පීර කරමි**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

**සණස රක්ෂන සමාගම අර්ධ රාජ්‍ය බැංකුවක්.ඒවා තුල සභා අරමුදල් ආයෝජනය කිරිම ගැටළුවක් විය හැකියි. එම ආයතන ඇවර කිරීමේ ඉඩකඩ වැඩියි.අපේ මුදල්වල සුරක්ෂිතභාවය පිලිබඳව වගකීම මදි.රජයේ බැංකු වල ගැටළුවක් නෑ.අපි රජයේ බැංකු වලිනුත් රේට් පෙන්වලා වැඩිකරන්න කියමු.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මේ සනසේ සියයට 28 ක් දෙනවළු පොලිය. කෙසේ උනත් අපි මෙම රජයේ බැංකු වලිනුත් මිල ගනන් කැඳවමු.එම බැංකු හා මෙම බැංකුව අතර පොලී අනුපාතයේ පරතරයේ සැලකියයුතු මට්ටමේ වෙනසක් ඇත්නම් සණස රක්ෂන සමාගමේ මුදල් ආයෝජනය කිරිම සම්බන්ධව ඉදිරි කටයුතු කරමු. ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගමු.බැරි නම් ඒබව දන්වමු.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාඑසේ කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව හා සණස රක්ෂන සමාගම විසින් ඉදිරිපත්කර ඇති 22.12.15 දිනැති ආයෝජන සැලැස්ම අනුව මුදල් තැම්පතු වෙනුවෙන් ලබාදෙන පොලි ප්‍රතිශත සම්බන්ධයෙන් රජයේ බැංකු වලිනුත් මිල ගනන් කැඳවීමටත් එම බැංකු හා මෙම බැංකුව අතර පොලී අනුපාතයේ පරතරයේ සැලකියයුතු මට්ටමේ වෙනසක් ඇත්නම් සණස රක්ෂන සමාගමේ මුදල් ආයෝජනය කිරිම පිලිබඳව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**5-18.කිරිඇල්ල ,එපිටවෙල ටැපර්ස් විලේජ් එස්ටේට් බංගලෝ ආයතනයේ 1 % බලපත්‍ර ගාස්තු නිදහස් කරදෙන ලෙස සිදුකර ඇති ඉල්ලිම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කිරිඇල්ල ,එපිටවෙල ටැපර්ස් විලේජ් එස්ටේට් බංගලෝ ආයතනයේ 1 % බලපත්‍ර ගාස්තු නිදහස් කරදෙන ලෙස සිදුකර ඇති ඉල්ලීම සම්බන්ධව මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා

**එම යෝජනාව ස්ථිර කරමි**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මෙම ආයතනය සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති අතර නමුත් මේ දක්වා සංචාරකයින් නොපැමිණි බවත් කොරෝනා වසංගතය හේතුවෙන් ව්‍යාපාර කටයුතු අඩපන වී ඇති බවත් දන්වා ඇත.2023 මාර්තු 31 දින මෙම ආයතනය වසා දැමීමට තීරනය කර ඇති බවත් සංචාරක මණ්ඩලයට ඒබව දැනුම් දීමට නියමිත බවත් එසේ වසා දැමූ බවට ලියකියවිලි සභාවට ලබාදීමට නියමිත බවත් මෙම හේතු මත 1% බදු ගාස්තුවෙන් නිදහස් කර දීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා ඇත.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

වෙනත් අයත් මෙසේ සහන ඉල්ලයි.වැහුවා නම් ග්‍රාම සේවක ලිපියකුත් අවශ්‍යයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

සංචාරක මණ්ඩලයෙන් වැසුබවට ලිපිය ආපසු බදු ගාස්තු නිදහස් කරන්න. එතෙක් සියළු අයකිිරීම් ලබාගත යුතුයි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

එසේ කටයුතු කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව හා කිරිඇල්ල ,එපිටවෙල ටැපර්ස් විලේජ් එස්ටේට් බංගලෝ ආයතනයේ 1 % බලපත්‍ර ගාස්තු නිදහස් කරදෙන ලෙස සිදුකර ඇති ඉල්ලීම අනුව සලකා බලා** සංචාරක මණ්ඩලයෙන් මෙම ආයතනය වැසුබවට ලිපියක් සභාව වෙත ලබාදීමෙන් පසු 1% බදු ගාස්තුවෙන් නිදහස් කිරීමටත් එතෙක් අයවියයුතු සියළු නීත්‍යානුකූල අයකිරීම් ලබාගැනීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-19.එල්ලාවල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ඇති අප ප්‍රාදේශිය සභාව සතු බහුකාර්ය ගොඩනැගිල්ල මහජන පුස්තකාලයක් ලෙස ස්ථාපනය කිරිම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**එල්ලාවල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ඇති අප ප්‍රාදේශිය සභාව සතු බහුකාර්ය ගොඩනැගිල්ල මහජන පුස්තකාලයක් ලෙස ස්ථාපනය කිරිමට යෝජනා කරමි.**

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**එම යෝජනාව ස්ථිර කරමි.මෙම සභාව සතු මෙම බහුකාර්ය ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට නියමිත මහජන පුස්ථකාලය සදහා අළුත්වැඩියා කටයුතු හා අවශ්‍ය උපකරන මිලදීගැනිමට වැයවන මුදල වන රු.368413.24 ක ඇස්තමේන්තු මුදල සභා අරමුදලින් දැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ගමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව **එල්ලාවල ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ ඇති අප ප්‍රාදේශිය සභාව සතු බහුකාර්ය ගොඩනැගිල්ල මහජන පුස්තකාලයක් ලෙස ස්ථාපනය කිරීමටත් මෙම බහුකාර්ය ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට නියමිත මහජන පුස්ථකාලය සදහා අළුත්වැඩියා කටයුතු හා අවශ්‍ය උපකරන මිලදීගැනීමට වැයවන මුදල වන රු.368413.24 ක ඇස්තමේන්තු මුදල සභා අරමුදලින් දැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

2022.01.04 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පවත්වන ලද මහා සභාවේ යෝජනා අංක 05- 20 හි උද්‍ධෘතය

**05-20.** **කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආදාහනාගාරයේ හිටපු සේවකයෙකු වන වසන්ත කුමාර ගෙන් ආදාහනාගාරයට සිදුවූ අක්‍රමිකතා හා අප්‍රසාදය නිසා නැවත ඔහුව ආදාහනාගාරයේ සේවයට නොගැනීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආදාහනාගාරයේ හිටපු සේවකයෙකු වන වසන්ත කුමාර ගෙන් ආදාහනාගාරයට සිදුවූ අක්‍රමිකතා හා අප්‍රසාදය නිසා නැවත ඔහුව ආදාහනාගාරයේ සේවයට නොගැනීම සම්බන්ධව මහා සභාතීරනයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග ආනන්ද මහතා
**එම යෝජනාව ස්ථිර කරමි**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මම විශේෂයෙන් මේ යෝජනාව ගෙනාවේ මේ සේවකයා සභාවට විශාල අප්‍රසාදයක් ගෙනාවේ.සල්ලි ඉල්ලා මිනිස්සුන්ගෙන්.එක දවසක් ආර්ටි.එස්.එකෙන්.ඉල්ලලා.මේවා ඉතාමත් සභාවට ලැජ්ජාවක්.දැඩි අපහසුතාවයට පත්උනා මම.තව දවසක් යනකොට උඩුකය ඇඳුම් නැතිව කෑම කනවා.වැඩ නෑ.වෙනතැනකට ගත්තාම වැඩට ආවේ නෑ.සේවය හැරගිය ලිපිය ගැහුවා.පස්සේ කොමසාරිස්තුමාටත් දැනුම් දුන්නා.පස්සේ ආයේ ආවා රැකියාව ඕනි කායලා.ආදාහනාගාරයම ඉල්ලනවා.තනතුර වැඩක්ෂේත්‍ර කම්කරු.මම එකඟ නෑ.දැන් ගෙදර ගිහින් දෙන තනතුරේ වැඩ කරන්න කැමති නෑ.ආදාහනාගාරයේ හිටි කාලේ වොෂර් කඩලා ,මිණී අළු පවා ගෙනිහින්.ඒ වගේ කෙනෙක් ආයේ එතන වැඩට දාන්න බෑ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

**මේ සේවකයා ස්ථිරද?ඇත්තටම මේ විධිහට අක්‍රමිකතා උනා නම් ඒපිලිබඳව පරීක්ෂනයක් කරලා විනය පරික්ෂනයක් තියලා කොමසාරිස් මගින් යම් කටයුත්තක් කරන්නයි තිබුනේ.මේක රාජකාරි කටයුත්තක්.සභා යෝජනාවක් ගන්න තීරන ගන්න දෙයක් නෙමෙයි.වැඩට එන්නේ නැත්නම් සේවය අතැර ගියාසේ සලකන්න.මෙහාට එපා කියලා අරින්න, වෙන දිහාවකට යොමු කරන්න.ඒ වගේ දෙයක් කරනවා හැර මේවා සභා යෝජනා නෙමෙයි.ආයේ මේවාගේ යෝජනා දාන්න එපා.මේවා නීත්‍යානුකූල නෑ.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මම එකඟ නෑ.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

**මේවා සභාවට දාන්නඑපා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**

**මෙවැනි යෝජනා ඉදිරිපත්කිරීම වැරදියි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා**

**පටලවන්න එපා.මම කැමති නෑ.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා**

**සේවය හැරගියාසේ සලකන්න.මේ වෙනකොට එයා ආදාහනාගාරයේ ඉන්ජින් වලට බරපතල හානි කරලා.අපිට හදන්න කීයක් ගියාද?රාජකාරි පැහැර හරිනවානම් එපා.කුනුගොඩවල්.අපකිර්තියක් විතරයි.ආදාහනාගාරයට යන්නේ කෙනෙක් අසරන වෙලා. ඒ පීඩාව වැඩි කරනවානම් විධිමත් ක්‍රියා ගන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කම්පැනියට එක්ලක්ෂ ගානක් ගෙව්වා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා**

**සභාදේපලට හානි කරනවා නම් හොඳක් නෑ.තීරන සෘජුව ගන්න.ඉල්ලලා සල්ලි ගන්න එක හරි නෑ. කැමැත්තෙන් සමහරු දෙනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ ජයසිංහ මහතා**

**මේවගේ දේ වලදි විනය කරුන විමසලා චෝදනා පත්‍ර දීලා විගනන පරීක්ෂන තියලා තීන්දු ගන්න එක. මහා සභා තීරන නෙමෙයි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**සීයකට විතර කතා කරලා කියලා මේකේ සේවයට ගන්න කියන්න කියලා.ඉදිරි ක්‍රියාමාර්ග නීත්‍යානුකූලව ගමු.මේ සේවකයාව නැවත ආදාහනාගාර සේවයට නොගෙන ඉමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ ආදාහනාගාරයේ හිටපු සේවකයෙකු වන වසන්ත කුමාර ගෙන් ආදාහනාගාරයට සිදුවූ අක්‍රමිකතා හා අප්‍රසාදය නිසා නැවත ඔහුව ආදාහනාගාරයේ සේවයට නොගැනීම ට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

2022.01.04 දින කුරුවිට **ප්‍රාදේශිය සභාවේ පවත්වන ලද** මහා **සභාවේ යෝජනා** අංක 05- 20 හි උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට**

**05-21.කුරුවිටප්‍රාදේශිය සභාවේ ඇප තැම්පත් ලේඛනයේ 2009,2010,2011,2013,2015,2016,2017 වර්ෂවල ගිවිසුම් ඇප තැම්පත් කිරීමේදි සිදුවි ඇති ප්‍රමාද දෝෂ නිවැරදි කිරිම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

**කුරුවිටප්‍රාදේශිය සභාවේ ඇප තැම්පත් ලේඛනයේ 2009,2010,2011,2013,2015,2016,2017 වර්ෂවල ගිවිසුම් ඇප තැම්පත් කිරීමේදි සිදුවි ඇති ප්‍රමාද දෝෂ නිවැරදි කිරිම සම්බන්ධව සභා තීරනයක් ගැනීම සඳහා යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණී මහතා</u>**

**එම යෝජනාව ස්ථිර කරමි**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

**මෙය ඇප තැම්පත් වීමේදි සිදුවි ඇති දෝෂයක්. 2009 වර්ෂයේ සිට.මෙය නිරවුල් කල යුතු අතර මෙය නීත්‍යානුකූල කටයුත්තක්. 2009,2010,2011,2013,2015,2016,2017 වර්ෂවල ගිවිසුම් ඇප තැම්පත් කිරීමේදී ඒ සමග VAT ,NBT ද සටහන් කර ඇත.මෙම ප්‍රමාද දෝෂ තව දුරටත් ඉදිරියට ගෙන යාමට සුදුසු නොවන අතර 2021 තැම්පත් ලේඛනයේද මෙම ශේෂ සටහන් කර ඇත.මෙම දෝෂ නිවැරදි කර2022 ලේඛනයේ ඉදිරියට ගෙනයායුතුමෙමගිවිසුම්ඇප සටහන්කර කර තැබීම කල යුතුය.එබැවින් මෙම ශේෂය වන රු.83112.40 ක මුදල පහත සඳහන් පරිදි තැම්පත් ලේඛනයෙන් අඩු කර සටහන් කල යුතුය.**

| වර්ෂය | VAT | NBT |
|---|---|---|
| 2009 | 41560.00 | 10170.00 |
| 2010 | 2790.00 | 697.50 |
| 2011 | 540.00 | 135.00 |
| 2013 | 18324.00 | 3054.00 |
| 2015 | - | 850.00 |
| 2016 | - | 4841.90 |
| 2017 | - | 150.00 |
| අඩු කල යුතු මුළු ශේෂය | 63214.00 | 19898.40 |

අඩු කල යුතු මුළු ශේෂය රු. -83112.40කි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මෙවැනි අඩුපාඩු බොහොමයක් සභාවට ඉදිරිපත් කරනවා.මේවා මුලින් සිදු කරන විට අධීක්ෂනයක් වෙන්නේ නැත්ද?මේවා මුලින්ම නිවැරදි විය යුතුදේවල්.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

**මේ පැරණි කාලේ ඒවත් තාම නිවැරදි වෙලා නෑ. ඒ කාලෙත් අපි හිටියා.මේ තොරතුරු කලමනාකරන කමිටු වල කතා කරන්න. නිවැරදි කරන්න. දත්ත නිවැරදි කරන්න. ඇත්තටම කව්රු හරි හොයාගත්තමයි කටයුතු කරන්නේ.විෂය එක්ක කතා කරලා ආයතනයේ කටයුතු නිවැරදිව සිදු කරන්න ක්‍රම වේද අනුගමනය කරන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**මේ කටයුත්ත මා අතින් සිදුවූ වරදක් නෙමෙයි.මේකේ මුදල් ගැටළුවක් නෑ.වසර ගානක් තිබුන ලේඛණ දෝෂයක් නිවැරදි කිරිමක් විතරයි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

**නිවැරදි කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx**_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව කුරුවිටප්‍රාදේශිය සභාවේ ඇප තැම්පත් ලේඛනයේ **2009,2010,2011,2013,2015,2016,2017** වර්ෂවල ගිවිසුම් ඇප තැම්පත් කිරීමේදි සිදුවි ඇති ප්‍රමාද දෝෂ නිවැරදි කිරිම සඳහා රු.**83112.40** ක මුදලක් ඉහත දක්වා ඇති පරිදි නීත්‍යානුකූලව තැම්පත් ලේඛනයෙන් අඩු කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

**05-22.**කුරුවිට ප්‍රාදේශීය සභාවේ **2008** ඇප තැම්පත් ලේඛනයේ ඇති ප්‍රමාද දෝෂ නිවැරදි කිරිම සම්බන්ධ යෝජනාව.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2008 ඇප තැම්පත් ලේඛනයේ ඇති ප්‍රමාද දෝෂ නිවැරදි කිරිම සම්බන්ධව මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිණි මහතා

**එම යෝජනාව ස්ථීර කරමි**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මෙයත් ප්‍රමාද දෝෂයක් මත සිදුවු කරුනක්.නීත්‍යානුකුලව මෙය නිරවුල් කල හැකි දෙයක්.**

විෂය මගින් දක්වා ඇති පරිදි

ප්‍රමාදදෝෂයක් මත 2008 තැන්පත් ලේඛණයේ කාර්මික නිලධාරි එම්.ඒ.ටී.ශිරන්ති මියගේ ණය හා වාරික පොලිය රු.1025.47 ක් තැන්පත් ලෙස සටහන් කර ඇත. එය මේ දක්වා ඉදිරියට ගෙනවිත් ඇත. විගණනයට 2021 ශේෂය දීමේදී ද මෙම ශේෂය දී ඇත.

2022 තැන්පත් ලේඛණයේ මෙම ප්‍රමාදදෝෂ නිවැරදි කල යුතුය, එනම්,මෙම ශේෂය වන රු.**1025.47** අඩු කර සටහන් කිරීම කල යුතුය.
ඇයගේ වැටුපෙන් කපා තිබූ අනෙකුත් සියළුම මුදල් නිරවුල් කර තැන්පත් ලේඛණයෙන් ඉවත් කර ,ඇයගේ ආපදා ණය මුදලින් අයවිය යුතු ශේෂයට ගලපා ඇත.එනම් එය නිරවුල් කර ඇත. පරික්ෂා කර බැලීමේදී 2008 වැටුප් ලේඛණයේ මෙවැනි මුදලක් කපා නැති බව පෙනී ගොස් ඇති අතර කපා ඇති මුදල පමණක් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.ඒ පහත පරිදි වේ.

| තැන්පතු දිනය | ලදුපත් අංකය | තැන්පත්කරුගේ නම සහ ලිපිනය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|---|
| 2008.2.16 | 1553 XE | සභාපති,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව | | 350.00 |
| 2008.03. | 1566 XE | ලේකම්,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව | - එම - | 350.00 |
| 2008.4.30 | 1580 XE | සභාපති,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව | - එම - | 310.00 |
| 2008.7.21 | 1669 XE | සභාපති,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව | - එම - | 4.97 |
| | 1681 XE | සභාපති,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව | - එම - | 10.50 |
| | | | එකතුව | 1025.47 |

**ඒ අනුව ප්‍රමාදදෝෂයක් මත සටහන් කර ඇති, මෙම ශේෂය වන රු.1025.47 ,2022 තැන්පත් ලේඛණයේ අඩු කර සටහන් කල යුතුය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

**නිවැරදි කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2008 ඇප තැම්පත් ලේඛනයේ ඇති ප්‍රමාද දෝෂ නිවැරදි කිරිම සම්බන්ධව ඉහත දක්වා ඇති පරිදි රු.1025.47** ක් තැම්පත් ලේඛනයේ අඩු කර නීත්‍යානුකූලව සටහන් කිරීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-23. කුරුවිට ප්‍රාදේශීය සභාවේ පුහුවල කනත්තවත්තපිලිබඳ නඩුව හා එල්ලාවල පහලගම නාබොක්ක මාර්ගය සම්බන්ධ නඩු කටයුතු වෙනුවෙන් නඩු ගාස්තු වැඩිකිරිම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ පුහුවල කනත්තවත්තපිලිබඳ නඩුව හා එල්ලාවල පහලගම නාබොක්ක මාර්ගය සම්බන්ධ නඩු කටයුතු වෙනුවෙන් නඩු ගාස්තු වැඩිකිරිම සම්බන්ධව සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**මෙම නඩු ජනක සුමේධ මහතා සභාවේ නීතිඥවරයා ලෙස නම් කිරීමට ප්‍රථම වෙනත් නීතිඥයන් විසින් මෙහෙයවන ලද නඩු.එහි නඩු ගාස්තු ඉහල දමා තියෙනවා.අංක 28885- පුහුවල කනත්තවත්තපිලිබඳ නඩුවට රු.25000.00 ට ඉහල මුදලක් හා හා අංක** CA(PHC)2017 **එල්ලාවල පහලගම නාබොක්ක මාර්ගය සම්බන්ධ නඩුවට 22.12.18 දින පෙනී සිටිම වෙනුවෙන් රු.20000.00 ක් හා එහි විධානය සඳහා 23 ජනවාරි මස රු.100000.00 ට වැඩි මුදලක් ලෙස නඩු ගාස්තු සඳහන් වි තියෙනවා.මේ සම්බන්ධව තීරන ගත යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**ඒ නීතිඥයෝ එක්ක කථා කරලා සුමේධ නිතිඥ මහතාට වගකීම පවරන්න.මේ සභා නිතිඥමහතාගේ මගපෙන්විම මත ඉදිරි කටයුතු කරන්න.මේ ජනතා බදු මුදල් .මේ මුදල ගෙවීම අනුමත කල නොහැකියි.සභාවේ නිතිඥ උපදෙස් අනුව ඉදිරි කටයුතු කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**සභාවේ නිතිඥ උපදෙස් අනුව ඉදිරි කටයුතු කරමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx_ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල_මහතාගේ_යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ පුහුවල කනත්තවත්තපිලිබඳ නඩුව හා එල්ලාවල පහලගම**

නාබොක්ක මාර්ගය සම්බන්ධ නඩු කටයුතු වෙනුවෙන් නඩු ගාස්තු වැඩිකිරිම සම්බන්ධව අනුමැතිය ලබා නොදීමටත් සහා නිතිඥ ජනක සුමේධ මහතාගේ මගපෙන්විම මත ඉදිරි කටයුතු සිදු කිරීමටත් ඒකමතිකව මහා සහා සම්මත විය.Xxxxxxxxxxxxx

**05-24.** ඇස්තමේන්තු

**05-24-01.**මෙනේරිපිටිය ඇතුල් මාර්ගය නඩත්තු කිරිම රු.**823774.92**

**05-24-02** ගලහිටිය මිගස්තැන්න මාර්ගයේ බෝක්ක්‍රුවඅළුත්වැඩියාකිරිම හා මතුපිට කොන්ක්‍රිට් කිරිම. (විසල්) රු.**2590747.41**

**5-24-03.**මෙනේරිපිටය මැල්වත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරිම.රු.**1426747.27**

**5-24-04.**ගලහිටිය මිගස්තැන්න මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරිම රු.**1267587.62**

**5-24-05.**පුස්සැල්ල වාඩියවත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරිම රු.**736476.08**

**5-24-06.**තිරිවාන පරනවත්ත මාර්ගය මතුපිට අළුත්වැඩියා කිරිම රු.**1260996.47**

**5-24-07.**ගලහිටියකන්ද මාර්ගය මතුපිට අවත්වැඩියා කිරිම. රු.**640768.10**

**5-24-08** තිරිවාන ජේරගහවත්තමාර්ගයමතුපිට අළුත්වැඩියා කිරිම රු.**669390.50**

**06.**<u>කාරක සභාවල වාර්තා</u>

06-01 මුදල් කමිටු වාර්තාව -22.12.19 හා 22.12.30 වාර්තා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

22.12.19 හා 22.12.30 වන දින මුදල් කමිටු වාර්තා සඳහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි දයා කස්තුරි මිය :-</u>

හා 22.12.30 වන දින මුදල් කමිටු වාර්තා සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීම සුදුසු බවට යෝජනා ස්තිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

මම මේ සභාවේ දිර්ඝ කාලයක් වැඩකලේ මම මින් ලබාගත් අත්දැකීම් එක්කයි.මට පුළුවන් දේ කලේ.මම මේ සභාවේ සෑම සතයක්ම රකින්න හැකි හැම විටම උත්සහා කලා.මම ජේෂ්ඨ මන්ත්‍රි කෙනෙක් කියලා මාව අගයන්න ඕනි නෑ.වසර 5ක් තිස්සේ මේකේ ඉන්නකොට කවරුත් ජේෂ්ඨයි තමා.දිගු කාලයක් නිවැරදි කරගන්න කීව බොහෝ දේ නිවැරදි උනේ නෑ.මමනොවැම්බර් කීවා සභාපතිතුමාගේ කැබිරථය සම්බන්ධව .නමුත් ක්‍රියාත්මක උනේ නෑ.දැන් නිවැරදි නෑ.මාව අනුගමනය කරන්න එපා.මම කියන්නේ වැරදි නම් වැරදි.මිලග වසරේ ඒ වැරදි වෙන්න බෑ. පසුගිය කොන්ත්‍රාත් වලට මුදල් ගෙව්වේ හදිසියේ.එකපාරට බෑ.සොයා බලා අදහස් ගන්න ඕනි.ඒක කීවාම ඒක සභාවට වාසි දෙයක් නම් ඒගැන සොයා බලන්න ඕනි.කිරිඇල්ල උඩ තට්ටුව ගැන කීවාට ඒක උනේ නෑ.පුස්තකාලය අතුරු ඇස්තමේන්තු හැදුවා.නමුත් අනුමතකලා.මේවා අවධානෙන් බලන්න. මේ සියල්ල ජනතා මුදල්.මට තර්ක එපා වෙලා.ප්‍රථිපල නැති නිසා.මට ඇත්තටම කලකිරිලා.ඒ නිසා

මින් ඉදිරියට හරිනම් හරි.වැරදි නම් වැරදි.විතරයි.මට කමිටු වලට එන්න බෑ.දීර්ඝ දුරක් විශාල වියදමක් දරාගෙන මම එන්න ඕනි.අයුතු ලෙස හම්බ කල මුදල් මට නෑ.මම ආර්ථිකය අපහසුවෙන් ගොඩනගන්නේ.විශාල වගකීමක් මට තියෙනවා. මට ප්‍රමුඛත්වයක් ඒ කටයුතු වලට දෙන්න වෙනවා.කෙසේ වුවත් සිදුවෙන ඇතැම් දේවල් ගැන ඇත්තටම කනගාටුයි.

ඉන්ධන වියදම්වල 12 මාසේ කියලා සඳහන් උනත් 10 වෙනි මාසේ ඒවත් තියෙනවා.ඉන්ධන ගහනකොට මීටරයත් ලියන්න.ඒවා නිවැරදි වෙන්න ඕනි.234 කැබ් එක අළුත්වැඩියාව ට රු. 71200.00 ක්.ඒක දැන් දුවන්න පුළුවන්ද?

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-</u>

ආදායම් බලපත්‍රය් ගැටළුවක් තියෙනවා.පලාත් ප්‍රවාහන කොමසාර්ස් මගින් කරගන්නවා.නමුත් ඉන්ෂුවරන්ස් ගන්න පුළුවන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

මෙ වාහනය දුවන්න බැරිව තිබුන බව දැනුම් දීලා තියන්න ඕනි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා විසින් අංක 236,සම්බන්ධව ගැටළු නිරාකරනය කර ගත් අතර අංක 237 විදි පහක් සඳහා වයර් රෝල් මිලදි ගැනීමේදි එම වර්ගය පිලිබඳව මනාව විමසා බලා නිසි ප්‍රමිතියේ හා වංචා සිදුනොවන පරිදි කටයුතු කල යුතු බව අවධාරනය කරන ලදී.එසේම නඩු වලට ප්‍රතිවිරෝදතා සැකසිම වෙනුවෙන් රු.90000.00 වැනි මුදලක් වැයකිරිම හේතුවෙන් මෙම මුදල් විශාල ප්‍රමාණයක් නිසා කඩිනමින් මේ නඩු අවසන් කරගැනීමට කටයුතු කලයුතු බව සඳහන් කරනලදී.එසේම අංක 241 ඇඹිලි සලකුනු යන්ත්‍රය සඳහා යාවත්කාලීන කිරිමට ගෙවීම් කිරිම සම්බන්ධයෙන් ඒ අය විසින්ම එම යාවත්කාලින කිරිම සිදුකිරිමට බැඳී සිටින්නේද යන්න ගිවිසුමේ පරීක්ෂා කිරිමටත් දැනුම් දෙන ලදී.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>

අපි ඔබතුමාව තමා අනුගමනය කරන්නේ.ඒක එකපාරට කල දෙයක් නෙමෙ.සමච්චලේට හෝ විහිළුවට ලක්කරන්නේ නෑ.දැනුම අවබෝධය අවශ්‍යයි.ඒක මේ මුළු ජීවිතේටම වැදගත්.ඔබතුමන්ලා වගේ අය මේ සභාවේ සිටිය යුතුයි.ජේෂ්ඨ පලපුරුදු අවංක මන්ත්‍රිවරයෙක්.ඇත්තටම එතුමාටත් ආර්ථික ගැටළු තියෙනවා.සභාවෙන් හම්බ කලේ නෑ.මැණික් ආකර වගේ තියෙන කළු ගඟ අයිනේ ඉන්නේ.නමුත් ඒවා කලේ නෑ.ගඳ ගහන වැඩ කලේ නෑ.ඇත්තටම ඔබතුමා මේ සභාවේ සිටියම යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

මම කිසි විටෙක ද්වේෂ සහගතව කතා කරන්නේ නෑ. නමුත් මේ පුරුද්ද හයියෙන් කතා කරලා.එතුමා ඇත්තයි කතා කලේ.එතුමා කීවේ යම් යම් යෝජනා කලාට ඒවා සිදුවෙන් නැත්නම් පලක් නෑ.සභාවට ගත යුතු සේවය ගන්නෑ. එතුමාගෙන්.ජේෂ්ඨ මන්ත්‍රි වරයෙකු ලෙස ඇත්තටම එතුමාව අගය කල යුතුයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

කැළුම් මන්ත්‍රි තුමා කීවේ මගට ගිහින් අතඅරිනවා කියලා.නමුත් හදිස්සියේ තීන්දු දෙන්න බෑ.න්‍යාය පත්‍රෙය් ඒ යෝජනාව නෑ.තිබුනා නම් ඒ ගැන සොයා බලන්න තිබුනා.කිසිදු අවකාශයක් නැතිවයි මේ කටයුත්ත උනේ.මට දැණුම පමනයි තියෙන්නේ.1990 ගනන්වල සිට යෝජනාව ඉදිරිපත් කරලයි අපි සාකච්ජා කලේ. නමුත් දැන්?අපිව අධෛර්ය වෙනවා.මා සභාවට ආ කාලේ සිටම වාහන වලට ගිය වියදම් වෙන වෙනම තියෙනවා.කාර්මික ඥානයක් නැතත් මේ තොරතුරු එක්ක ගොඩක් දේවල් නිගමනය කල හැකියි.තේරුම් ගත හැකියි.හිතාගන්න බෑ ඇතැම් අවස්ථාවල මේ තරම් වියදමක් යයිද කියලා.මේ තොරතුරු යාවත්කාලීන වෙනවා.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

අපි හැමෝටමආර්ථික ගැටළු තියෙනවා.මම හිතන්නේ මාසික දීමනාව දෙන්නේ සියළු කමිටු වලට එනවටත් එක්ක.වැරදි හඳා ගමු.නමුත් ජේෂ්ඨ මන්ත්‍රී වරයෙකු ලෙස සියළු අදහස් දක්වලා පස්සේ කමිටුවට එන්න බෑ කීවාම කනගාටුයි.ප්‍රශ්නයක්.ජවිපෙන් කීවා හොරයක් කියලා.ලිපිය තියෙද්දි .සියළු තොරතුරු නිවැරදිව තියෙද්දි.මොකක්හරි ගැටළුවක් නම් විසඳුමක් ඕනි.ජයරත්න මන්ත්‍රීතුමා එදා ඉදන්ම සභාවට වටිනා දේයි කිව්වේ.දැනුමක් ඇතිව.එතුමාගේ සියළු කටයුතු සාර්ථක වේවා කියලා පතනවා.
අංක 231 තොරතුරු පරීක්ෂා කල අතර ගරු රන්ජන් මන්ත්‍රීතුමා විසින් එම රථයේ අඩුපාඩු පරික්ෂා කොට එය නිවැරදිව ඇති බවට සඳහන් කරන ලදී.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx 22.12.19** හා 22.12.30 වන දින මුදල් කමිටු වාර්තා සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxx**

06-02 කාර්මික කමිටු වාර්තාව (2022.12.05)

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

2022.12.05 දින **කාර්මික කමිටු වාර්තාව** සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

22.12.05 දින කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි..

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිණී දයා කස්තුරි මිය-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා**

වොෂර් දානකොට පරන එක සභාවට භාර දෙනවද?

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා**

පැරණි එක සභාවට භාර දෙනවා කියලයි අපිට කියන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**

පහුගිය වෙන්දේසියේ ටයර් පරන ඒවා කැලි විතරයි.එකකට එකක් තිබ්බට ඒවා වෙනත් ඒවාද දන්නෙත් නෑ.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මේ කාර්මික කමිටුවට එන්න.රන්ජන් මන්ත්‍රීතුමා මහින්ද මන්ත්‍රීතුමා එනවා.වාහන හදන තැනටත් ගිහින් ඒවා සොයා බලනවා.ස්තුතියි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx 2022.12.05 දින කාර්මික කමිටු වාර්තාව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03 කුඩානගර ජලසම්පාදනක්‍රමයේ විධායක කමිටු රැස්වීම් වාර්තාව.(2022.12.12 )

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මහා සභාවේ දැන ගැනිම සඳහා ඉදිරිපත් කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

**ජලය නිසි ලෙස ජනතාවට දෙන්න අපි අනුමැතියක් දුන්නා මෝටරයක් ගේන්න.සවිකලාද?ක්‍රියාත්මකද?**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

**උත්තර දෙන්න බෑ.මේක කාරක සභාවක් බවට පත් කරන්න.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**මහා සභාව කාරක සභාවක් බවට පත් කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

**එම යෝජනාව ස්ථිර කරමි.**
**මහා සභාව කාරක සභාවක් බවට පත් විය.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

**ජල මෝටරය යහපත්ද?ජලය ලැබෙනවද?ගැටළු තියේද? කවදද නිවැරදි වෙන්නේ.එතෙක් විකල්ප තියේද?**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**ගෙනාවේ වොට් 37.අපේ කාර්මිකයෝ කීවේ ඒක අවත් නෑ.පරනයි බෑ කිව්වා.ලේකම් මසී කතා කලා.ඇහුවා.මේ මෝටරය හයි කරන්න බෑ කීවා.ඒ මෝටරය ගෙන්න ගත්තා.අළුත් එකක් නැති නිසා මේකේ අඩුපාඩු හදලා නැවත දෙන වා කීවා.**
**නව මෝටරයක් හෝ මුදල් ආපසු දෙනවා කිව්වා.සෙකන්ඩ් හෑන්ඩ් එකත් කැඩුනා.ටික දවසක් වැඩ කරන්නැතිව ගියා.දැනට පරන මෝටරයෙන් වතුර දෙනවා.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

**වෙන මුදල් නෑ.මේ කටයුතු කවදා වෙයිද?**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**නත්තලට නිවාඩු.හැකි ඉක්මනට දෙනවා කීවා.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

මුදල් ගත්තත් වැඩේ උනේ නෑ.අරමුණ ඉටු උනේ නෑ.මේවා අළුත්ද පරනද හොයාගන්න පුළුවන්.ජනවාරි මාසය තුලම මේ කටයුත්ත නිම කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මුදල් දුන්නත් වෙන තැනකුත් නෑ.ආයෙත් ගැටළුව.විසල් ජලය දෙන බවත් කියනවා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

මෝටරය නඩත්තු කරන්න. සභාව විසිරෙව්වොත් කිසිවක් බෑ.කඩිනමින් මෝටරය සවි කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

ඇහුම්කන් දෙන්න.මේක වැදගත් ප්‍රශ්නයක්.කමිටුවට ඇඟිල්ල දික් කරන්න එපා.මම සෑහීමට පත් වෙන්නෑ.ලලිත් කැඳවන්න.මේ පොම්පය ඔරිජිනල් උනත් කැඩුනා කීවනේ.වැඩි දුර මම කතා කරන්නෑ.මීට පස්සේ නව පො◌ාම්පය ගේන කොට ලලිත්ට යන්න පුළුවන්ද?

මේ අවස්ථාවේ ජල පොම්ප ක්‍රි◌ියාකරු ලලිත් මහතා කරුනු දැක්වූ අතර වෝටර් සීල් එකෙන් ජලය ගිය අතර නැවත නව මෝටරය ගෙනගොස් සකසා ගෙනාවද පිච්චුන නිසා මේ වනවිට පැරණි මෝටරය මගින් වතුර ලබාදීමට පියවර ගෙන ඇති බවත් සඳහන් කලේය.නව මෝටරයක් වසර 5ක් 10ක් කිසිදු අළුත්වැඩියාවක් නොමැතිව දිවිය හැකි බවත් මෙමම පොම්පය රෙපෙයාර් එකක් බවද සඳහන් කලේය.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

මුදල් නැවත දෙයි.ලේකම්තුමිය කතා කලා.මෝටරය ගෙන්න ගන්න.මෝටරය නැතුව වතුරත් නෑ.ලංකා ටෙක් එකෙන් ගෙනත් තියෙන්නේ.

## 07 ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

07-01 -2022 නොවැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

2022 නොවැම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx 2022 නොවැම්බර් මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

## 07-02 2022 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාව

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

2022 **දෙසැම්බර්** මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-

2022 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx 2022 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

## 08.වෙනත් කරුණු

**8-1 ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

**අපි බොහෝ කාලයක් මේ සභා ගර්භයේ සාකච්ඡා කලා.තර්ක කලා.අයෙකුට මේ ස්ථානයේ සේවය වෙනුවෙන් මහජන ඡන්දයෙන් එන්න ලැබීම භාග්‍යයක්.ලේකම් තුමිය ඇතුව කාර්ය මණ්ඩලයෙන් දැඩි සහායක් අපිට ලැබුණා.අපිට හැමෝම සතුටු කරන්න බෑ.නමුත් ජහුතර ජනතාව සතුටු වන ආකාරයෙන් කටයුතු කලා කියලා මම හිතනවා.මම හිතනව මේ සියළු දෙනාටම ලබන මැතිවරනයෙනුත් ජය ලබන්න හැකි වෙනවා කියලා.නව මැතිවරනය ජය ලබා තවත් විශාල සේවාවන් රැසක් ජනතාවට සිදු කිරීමට හැකිවේවා කියලා සුභ පතමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා

**මමත් හිතනවා මේක අවසන් සභාව වෙයි කියලා සභා වාරයේ.විශේෂයෙන් මම කියනවා මේ මගේ අවසන් සභාවත් වෙයි. මේක මේ සභා වාරයේ අවසන් සභාව උනොත් මීට පස්සේ සභාවේ මම ඉන්න එකක් නෑ. මගේ පියානන් 1965 සිට මේ සභාවේ නියෝජනය කලා.හිටියා.ඒ ආභාෂයයි මට ආවෙත්.මට ගමේ මුළු ජනතාව ඡන්දය දුන්නා.තාමත් දෙනවා.මම ඉස්සරලාම සමූපකාරයේ අධ්‍යක්ෂ දූරයේ හිටියා.තුන්වරක් තරග කරලා තුන් වරම දිනුවා.ප්‍රභල දේශපාලකයන් සමග තරඟ කරලා ,ප්‍රභල ව්‍යාපාරිකයින් මුදල් වියදම්කරලත් කරගන්න බැරිඋන ඡන්දය මම සියයට අසුවක් අරන් ස්වාධීනව ජය ගත්තා.තුන්වෙනියට වැඩි ඡන්ද අරන් මම මේ සභාවට ආවේ.මේ සියල්ල මැද මම දැඩිලෙස ලෙඩ උනා.මට මේ මන්ත්‍රිධූරය මගේ විවේකය මුළුමනින්ම නැති කරනවා.පීඩනයක්. ඒත් මම ඡන්දය ඉල්ලුවොත් දිනයි.මේ රටේ ව්‍යාකූල තත්වයත් නිසා මට කල කිරෙනවා.මම ආයේ තරඟ කරන්නෑ.නමුත් දේශපාලනය අත් අරින්නෑ.ඡන්දය ඉල්ලන්නෑ.ගමෙන් සුදුසු කෙනා ඉල්ලයි.ඒ පත්වෙන කෙනාට සුභ පතනවා.**

**කිසිවෙකුට මේ මගේ සේවා කාලය තුල හිත රිදුනා නම් සමාවෙන්න.හිතේ කිසිදු තරහක් කහටක් නෑ.මම හිතනවා මගෙන් වරදක් වෙලත් නෑ.ඉදිරියේදි මේ විධිහට සභාවට නාවත් සියළු දෙනා එක්ක සහෝදරත්වය වෙනසක් නෑ. සියළු දෙනාට ජය පතමි.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

**මමත් යම් අරගල තත්වයකයි නීතිමය පදනමක් මත මේ උසාවි අධිකරන නඩු තීන්දු අරගෙනයි මන්ත්‍රි ධූරය ගත්තේ.ඒ අධිකරන තීන්දු කාටත් පොදුයි.ජනතා අභිලාශ ජනතා සේවය එක්ක අපි හිටියා. ඒනිසා මේ තත්වය සමාජ ගත වෙලා අපි ජනතාවට සේවය කරන බව.ගමේ මිනිස්සු ඡන්දය දෙන්නේ ඒකයි.දීප්ති මන්ත්‍රිතුමාටත් එහෙමයි.රනිල් මහත්තයගේ මහින්ද මහත්තයාගේ දේශපාලනය මට ගෝචර නෑ.ඒ වගෙමයි මගේ මිතුරු ගරු සභාපති මල්කැකුල මහත්තයා එක්ක මම වාද කලා.නමුත් සමගි උනා. එකඟත්ව දුන්නා. අපේ වැඩ විපක්ෂ උනත් ප්‍රතිගාමී නෙමෙයි.මංගල මන්ත්‍රිතුමාගෙයි මගෙයි දේශපාලනය අහසයි පොලවයි වගේ.නමුත් පනත ගැන ඉගෙන ගත්තා මංගල මන්ත්‍රිතුමාගෙන්.2001 අපිත් පත් උනා කිරිඇල්ලේ**

**මන්ත්‍රීවරු ලෙස.සියළු දේට සියළු දෙනාට ස්තුතියි.ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයට දුන්න සහායට ස්තුතියි.එළඹෙන ජන්දෙදි සියළු දෙනාට විශිෂ්ඨ ජයක් පතමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්ම දාස මහතා

**මම රත්නපුර දිස්ත්‍රික්කයේ හොඳම මනාප ප්‍රතිශතය සියයට 70.2 ක විශිෂ්ට ජයක් ලබලයි සභාවට ආවේ.ගරු මල්කැකුල සභාපතිතුමා එක්ක එකතු වෙලා බොහෝ සේවාවන් ගමට කලා.සභාවේ මන්ත්‍රී කෙනෙක් වෙලා වැඩක්නෑ ගමට කියන දේ අපි වෙනස් කලා.හෙට විසිරෙව්වත් අපි මේ සහෝදරත්වයෙන් ඉමු.සැමට සුභ පතමි.**

**08-02.** ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

**සභාකර්මාන්ත සදහා අනුමැතිය ලබාගැනීම සම්බන්ධ ලිපිය සභාවට ඉදිරිපත්කරනවා.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**මේ කට යෝජනා අරන් මම ගියේ. ඇත්තටම දාපු සියළු සංවර්දන යෝජනා නඩත්තු කටයුතු.සභාවේ අනුමත කල ව්‍යාපෘති.පාර අබලක්, වතුර නෑ.ප්‍රජා ශාලාව මේ සියල්ල නඩත්තු.ලේකම් කානි සාධ්‍යතා වාර්තා අරන් අනුමත කලා. ගිවිසුම් අත්සන් කරනවා කියලා.ප්‍රධාන අමාත්‍යංශෙ ලේකම් නිර්දේශ කරලා.කෙමසාරිස් කියලා තියෙන්නේ ආරම්භ කරලා කටයුතු කරන්න කියලා.අධ්‍යාපනය බෑ.සෞඛ්‍ය බෑ.මේ තියෙන යෝජනා සියල්ල නඩත්තු තමා.ඉලක්කම් එහේ මෙහේ වෙලා. ඒවා නිවැරදිකරන්න. ලක්ෂ දෙකට රු. 20000.00 දාලා.නිලධාරින් නීතිමය වගකිමක් ඇතිවයි වැඩ කරන්නේමේ සතිය තුල අධීක්ෂනය කරලා වැඩ කරමු.සහාය දෙන්න.ගිහින් බලන්න.නඩත්තු නැති ඒවා නෑ.කඩිනම් කරන්න.කොමසාරිස්ට කතා කරලා විශේෂ සභා දාලා හරි මේ කටයුතු කරන්න. නැත්නම් බැරිවෙයි.පොත් දෙන එකත් කඩිනම් කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා
**45 ටම සමානව දෙනවද?**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**මෙතුමා පරිපූරක ගෙනාව. එදා අපි විරුද්ධ උනා.නමුත් බැහැලා ගියේ නෑ.ධනවර්ධන මන්ත්‍රීතුමා හිටියා.කව්රුවත් එපා කීවාද අහන්න.වාද එපා. පාසැල්වලටයි දෙන්නේ. මට ඕනි අයට නෙමේ.**

**නිත්‍යානුකූලව.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනී මිය.
**අපිට අයදුම් පත්‍ර දුන්නෑ.සමහරු නම් එකතු කරනවා.**

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා
**නම් දෙන්නේ විදුහල්පති.කොට්ටාසෙ මන්ත්‍රීලා එකතුවෙලා මේක කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා

මට පුද්ගලික ප්‍රශ්නයක් වෙලයි ගියේ.ගෙදරින් හදිසි පනිවිඩයක් ආවේ.මගේ කොට්ටාසේ සියළු ලමයිපොත් දෙන්න සුදුසුකම් තියෙන ලමයි.ලගුකාගම ශාන්ත ජෝකිම් පාසැල්වල.අන්තඅය පිට පාසැල්වලට යනවා.විදුහල්පති නිර්දේශ දෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනී මිය.</u>
කොට්ඨාසේ මන්ත්‍රිලා 26 ටළු දෙන්නේ. මන්ත්‍රිලා 45 ක් ඉන්නවා.සමව දෙනවද?සම අයිතිය දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>
10 වසර. පාසැල් තුනක ලමයි කොට්ඨාසේ ඉන්නවා.විදුහල්පති නිර්දේශ දෙනවා.ලැයිස්තු සභාවට එවන්න කීවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
මේ කටයුත්ත හෝ එකතු වෙලා කරන්න.විදුහල්පති අත්සන් කරලා ලැයිස්තු ඕනි. ගරු ආණ්ඩුකාරතුමා අනුමැතිය දුන්නම ක්‍රමවේදයට කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>
විජය කුමාරතුංග එකේ නම් ලැයිස්තුව මාත් ගත්තා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ඉන්ද්‍රාණී වික්‍රමසිංහ මිය.</u>
ඒ මුදල බෙදලා දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>
මුදල් නෙමෙයි.පාසැල් තෝරගෙන පොත්දෙමු.

සභාවේ ගෝෂා.....

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනී මිය.</u>
මෙතුවක් දුන්න විධිහටම මේකත් දෙන්න.ඒ වගේම සභාවේ කතාකරන විධිහ අශෝභනයි.මේ සම්බන්ධව අවධානය යොමු කරන්න. මෙතැන සිටින සියළු දෙනාම එකයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>
අපි කිසිදා තර්ක කලාට සභාවේ ගරුත්වය කෙලසන ලෙස කතා කරලා නෑ.ආණ්ඩු පක්ෂෙ උනත් නොවුනත් අපි සභාවේ ගෞරවයක් රැකිය යුතුයි.ඒ පාසැලේ පොත් දෙන දවසට මමත් ජීවන් මන්ත්‍රිතුමාත් එනවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>
කොට්ඨාසෙ මන්ත්‍රීලා එකතු වෙලා එක තීරනයකට එන්න.වෙන වෙනම බෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
පොත්දෙනකොාට සභාපතිතුමත් එන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් රණතුංග මහතා</u>
භේදයකින් තොරව සමගියෙන් මේ කටයුත්තකරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන මහතා</u>

**කොට්ඨාසේ ලමයි විවිධ පාසැල් වලට යන්නේ.පාතගම,පහල කුරුවිට,කඳන්ගොඩ,තෙප්පනාව,කුරුවිට පාසැල් වලට යනවා.විජයකුමාරතුංග එකටත් යනවා.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**
**විදුහල්පති මගින් අදාල කොට්ටාසේ ලමයින්ට දෙන ක්‍රමය හදාගමු.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය**

**දෙව්පහල 180 ක් ඉන්නවා.120-200 පොත් හොඳයි.වතුයායේ ලමයි කුරුවිටටත් එනවා.දෙව්පහලත් ඉන්නවා.වත්තේ පාසැල 250 කට දෙන්න ඕනි.**

## 09.හදිසි යෝජනා

**09-01.ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**
පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/AD/1/7/2022/03 හා 2023.01.03 දිනැති ලිපිය අනුව සභික වරුන්ගේ මාසික දීමනාව ගෙවීම් කිරිම සම්බන්ද ලිපිය අනුව සුදුසු මහා සභා තීරනයක් ගැනීමට යෝජනා කරමි.හදිසි කාරනාවක් නිසා හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**
එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**
මෙම ලිපිය සියළු පළාත් පාලන ආයතන ප්‍රධානින් හා නාගරික කොමසාරිස් ඇතුළු ප්‍රධාන පරිපාලන නිලධාරින් වෙන යොමු කර ඇත.සභිකයන්ගේ මාසික දිමනා ගෙවීම සම්බන්ධයෙන් ගැටළු සහගත තත්ව විගණනය විසින් අනාවරනය කර දෙපාර්තමේන්තුව වෙතද පිලිතුරු අපේක්ෂාවෙන් දැනුම්දී ඇති බවත් එබැවින් ඉදිරියට මාසික දිමනා ගෙවීමේදි 2005.06.08 දිනැති අංක 1396/18 ගැසට් පත්‍රය මගින් විෂය භාර අමාත්‍යවරයා පනවන ලද රීති අනුව කටයුතු කරන ලෙසත් සම්පූර්න මසක කාලයක් ආවරණය නොවන අවස්ථාවල දින ගනනට අනුපාතිකව ගනනය කර දීමනා ගෙවන ලෙසත් දන්වා ඇත.

අපි සභා තීරනයක් අනුවයි පසුගිය වසරේ සෑම මසකම දෙවන සතියේ සිකුරාදා මෙම සභාව පැවැත්වුවේ.එසේම සභාවයි තින්දු කලේ මෙවර සභා දිනය වෙනස් කරලා කලින් තියන්න.
එතකොට සභා රැස්විම් වලට අදාලවයි මේ දීමනාව ගෙවන්නේ.ඒ නිසා රැස්වීම තිබ්බා.මේ දීමනාව ගෙවිය යුතුයි.කියන මතයේ මම ඉන්නේ.නමුත් ගිය ගමන මෙහෙම වෙලා ආපසු ගෙවන්නත් සිද්ධ උනා.
**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**
ඔය ලියුම ගහලා තියෙන්නේ අද රෑ විසුරවයි කියලා.මේ ගැන විමසන්න.අපේ ධූර කාලය මාර්තු දක්වා තියෙනවා.
**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**
අපි සාමාන්‍යයන් මේ ගෙවිම් කරන්නේ සභා දිනයේදි.මාසික මහා සභා රැස්වීමේදී.ලේකම් මිස් මේගැන කොමසාරිස් විමසන්න.විසුරුවොත් කියලානේ මේ තත්වය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

සභාව සංස්ථාපනය කලේ 10 දින.තව දවස් දෙකයි 10 ට.එසේම මේ මහා සභා රැස්වීමට ආවමයි ගෙවන්න තියෙන්නේ.අපියි මේ සභා දින තීන්දු කරන්නේ.

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**</u>
අද 04. ඒනිසා දින 9 ක් අඩු කරන්න වෙයි.දුරකථන දීමනා. සභා රැස්වීම් .මේ දින 9 ට අදාල මුදල දෙන්න පුළුවන්.මේක මාසික දිමනාව. මේ තත්වය කොමසාරිස්ට පෙන්වා දෙන්න.
<u>**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**</u>
ගරු සභාපතිතුමා කොමසාරිස්තුමාට මෙ තත්වය පහදා දෙන්න.අහන්න.
මෙම අවස්ථාවේදි ගරු සභාපති ප්‍රේමරත්න **මල්කැකුල මහතා විසින් දුරකථන ඇමතුමක් ලබා ගන්නා ලදී.**

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**</u>
පළාත් පාලන කොමසාරිස් තුමා කියනවා විගනනයෙන් මේ ගැටළු ගැන කියන බවත් සභා තීරනයක් ගෙන කටයුතු කරන ලෙසත්.මම හිතන්නේ මේ සභා දීමනාව ගැනීමයි සුදුසු.විගනනය කියනවා නම් මේක වැරදියි කියලා අපි ආපහු අයකර ගන්නවට එකඟයි.මම යෝජනා කරන්නේ මේ දීමනාව ගන්නත් ගැටළුවක් උනොත් ගෙවීමටත් එකඟයි කියලා.

එසේම ලිඛිතව අත්සන් ගන්න සියළු ගරු මන්ත්‍රිතුමන්ලාගෙන් 23.01.04 දින මහා සභාවේදි ගනු ලැබූ තීරනය අනුව මෙම මාසික දීමනාව ලබාගන්නා අතර යම් හෙයකින් මෙම මුදල ආපසු ගෙවීමට සිදු වුවහොත් නැවත ගෙවීමටත් එකඟයි කියලා .
<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි දේවින්ද කුමාර මහතා**</u>
ස්ථිරයි. අපි එහෙම කරමු.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු සභාපති <u>ප්‍රේමරත්න මල්කැකුල</u> මහතාගේ හදිසි _යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ** සභික වරුන්ගේ මාසික දීමනාව 2023.01.04 දින පැවති මහා සභාව එදිනද ගෙවිම් කිරීමටත් යම් හෙයකින් මෙම මුදල ආපසු ගෙවීමට සිදු වුවහොත් නැවත ගෙවීමටත් එකඟත්වය පල කොට ලිඛිතව අත්සන් ලබාගැනීමටත් **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

09-02.නිවාඩු අනුමත කිරීම

<u>**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා**</u>
ගරු ප්‍රාසම මුදිතා ශ්‍රිමතී මිය ,අයි.කේ.කුලරත්න මහතා ඩී.එම්. ශානක දර්ශන මහතා ,රවීන් විනෝද් මහතාඑස්.එච්.අසංක එරන්ද මහතා, ගරු ප්‍රාසම පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා , ගරු ප්‍රාසම එස්.රත්නසිරි මහතා , එච්.ඩබ්. ජයලත් මහතා හදිසියේ **,අසනිප වි ඇති අතර නිවාඩු ලබා දිමට යෝජනා කරමි.හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.**

ගරු ප්‍රාසම මංගල ඩයස් මහතා
එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx** ගරු ප්‍රාසම මුදිතා ශ්‍රිමතී මිය ,අයි.කේ.කුලරත්න මහතා ඩී.එම්. ශානක දර්ශන මහතා ,රවීන් විනෝද් මහතාඑස්.එච්.අසංක එරන්ද මහතා, ගරු ප්‍රාසම පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා , ගරු ප්‍රාසම

එස්.රත්නසිරි මහතා , එච්.ඩබ්. ජයලත් මහතා හදිසියේ **,අසනිප වි ඇති අතර නිවාඩු අනුමත කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

- **ස්තුතිය.**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**

අද දින මහා සභාවේ සංග්‍රහ කටයුතු සිදු කල ගරුදේවින්ද කුමාර මන්ත්‍රිතුමාට හා රන්ජන් ප්‍රදීප් මන්ත්‍රිතුමාට විශේෂයෙන් ස්තුතිය පල කරමි.සභාවට සහභාගි වි සහාය දුන් සියළු දෙනාටත් ස්තුතිය පල කරමි.

සභාවේ කටයුතු ප.ව. 3.30 ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ<br>
සභාපති,<br>
ප්‍රාදේශීය සභාව,<br>
කුරුවිට.

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)

02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)

03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)

04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන් සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන් හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට

05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට

06.ප්‍රජා සංවර්ධන නිලධාරී - (දැ.ගැ.පි)

2021.12.10 වන දින පැවති මහා සභා වාර්තාව සභා සම්මත කිරිම

**ප්‍රේමරත්න මල්කැකුල,**
**ගරු සභාපති,**
**ප්‍රාදේශිය සභාව ,**
**කුරුවිට.**

2. **සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන -නොමැත.**

## 3. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද ලිපි සංදේශ , පෙත්සම්, පැමිණිලි, හා සන්නිවේදන -නොමැත

## 4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න :- නොමැත

## 5. යථා පරිදි කල්දී ඇති යෝජනා :-

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :**

05-01 කුරුවිට නගරය හා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අලලා ආකර්ශනීය සංචාරක ස්ථාන සඳහා දේශීය හා විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීම සඳහා නව වසරේ විශේෂ වැඩ පිළිවෙලක් සැකසීම සම්බන්ධ යෝජනාව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා -**

කුරුවිට නගරය හා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අලලා ආකර්ශනීය සංචාරක ස්ථාන සඳහා දේශීය හා විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීම සඳහා නව වසරේ විශේෂ වැඩ පිළිවෙලක් සැකසීමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා -**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා -**

2022 වසරේ අපගේ නිල කාලය පූර්න වීමට තිබුනද රජය මගින් එය 2023 මාර්තු 13 තෙක් දීර්ග කර ඇත.පසුගිය කාලයේ රටේ මෙන්ම ලෝකයේ තිබූ අර්බුධ හමුවේ අපිට වැඩ කිරීමට තිබූ කාලය බොහෝ අහිමි වි ගියා.2018 වසරේ ආවත් යහ පාලන සමය යටතේ අපිට වැඩ කිරිමට ප්‍රතිපාදන ලබා දීම නිසි පරිදි සිදු වුනේ නෑ.පළාත් සභා වේ අනුග්‍රහයද කිසි ලෙස ලබා

දුන්නේ නෑ.වසර 2 ක් කොරෝනා නිසා අහිමි වී ගියා.පළාත් පාලන ආයතන ලෙස වැඩ කිරිමට කටයුතු රැසක් තිබුනත් ඒවා කල නෙ◌ාහැකි වුනා.

මේ තත්වය හමුවේ රජය අපේ කාලය වසර 1 කින් දීර්ග කලේ වැඩ කිරිමටයි.මේ වසර පාට පක්ෂ භේදයකින් තොරව වැඩ කරන වසරක් කර ගමු.ලෙඩ රෝග නිසා රට අගාධයට වැටිලා ඇතැම් කාල වල පාලකයන් රට අගාධයට ඇද දමලා.රටේ ජනතා මුදල් නාස්ති කරලා.කෝටි 117 පමන කිරි ගවයන් ගේන්න ආධාර ලැබී තිබුනත් එක කිරි ගවයෙක් ගෙනත් නෑ.කුකුල් ගොවිපොලවල් අරඹලා නෑ.ඒ මුදල් පුද්ගලික පරිහරනය කරලා. හිටපු ආණ්ඩුත් කරලා.අපිට වර්තමානයේ වන්දි ගෙවන්න වෙලා. අපි පාලක පක්ෂයේ හිටියත් විපක්ෂයේ හිටියත් බාධා කිරිම් පමණයි.සිදුවන්නේ .රට අගාධයට වැටිලා.රටේ ඒක පුද්ගලික ආදායම පහල වැටිල, විදුලිය ගැටළු,ගෑස් ගැටළු,කෘෂි කර්මාන්තය අඩපන වෙල,ඇත්ත නීරස උනත් ඇත්ත ඒකයි.මේවා වසංගන්න බෑ.අපි සභාවක් ලෙස නැගී සිටිමු.කුරුවිට හදමු.මා වසර 25 මේ සභාව නියෝජනය කල මන්ත්‍රි වරයෙක්. පාලක පක්ෂය මට අදාල නෑ.මම වැඩ කලා ජනතාවට.එ.ජාප. රජයේ සභාපති යටතේත් වැඩ කලා.බාධා කලේ නෑ.සේවය කිරීමට සහාය දුන්නා.සෙනරත් අප්පෝට උදව් කලා.එතුමා මටත් ජනතා සේවයට උදව් කලා. මල්කැකුල සභාපතිතුමා පාලන යුග 3ක් නියෝජනය කරනවා.මම උදව් කරනවා.මේ වසරේ අපි මේ සභා ගොඩනැගිලි නොව ජනතාවට සෘජුව සේවය වෙන කටයුතු කරමු.අපි සබාවට ආදායම් ගමු.කුරුවිට ට විශාල ධනස්කන්ධයක් ඇද ගත හැකියි.විදේශ සංචාරකයන් දැන් එනවා.ඩොලර් ගෙන්න ගන්න ක්‍රම හදමු.

කුරුවිට සුන්දර නගරයක්.කුරු ගග එසේම සුන්දර පැහැදිලි ජලය පිරි ගඟක්.සංචාරකයින් මේ දෙස බල බලා යනවා.විධමත් නාන තොටක් නෑ.අපි ඒ අවට පරිශ්‍රය සංචාරක සිත් ඇදගන්නා ලෙස හදමු.

මෙම ප්‍රදේශයේ මැණික් තියෙනවා. බේරුවල මැණික් නැති උනත් මැණික් සම්බන්ධ මධ්‍යස්ථානයක්. රත්නපුර මැණික් තියෙනවා. අතිගරු ජනපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජෙම් සිටි සංකල්පයක් ලෙස වැඩි දියුණු කිරිමට පියවර අරන්.කුරුවිටත් මැණික් ගනුදෙණු වන ස්ථානයක් උනත් අපිට නිශ්චිත ස්ථානයක් පහසුකම් නෑ. දුම්රිය දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිල්ල සංවර්ධනය වන විට එහි කුටියක් නිම් මැණික් ,ස්වර්ණාභරන කුටියක් ලෙස පවත්වාගෙන යමු.විදේශිකයන් පවා මැණික් පිලිබඳ සොයා බැලුවත් ඔවුන්ටත් ඒ පිලිබද කටයුතු සම්බන්ද කරගන්න නිශ්චිත තැනක් නෑ. මේ වසර තුල එවැනි මැණික් අලෙවි කල හැකි ව්‍යාපාරික ස්ථාන කීපයක් හදලා දෙන්න. ඉතා වටිනා කටයුත්තක් වේවි.

කුරුවිට නගරය තව දුරටත් අලංකාර විය යුතුයි.අපි ඩෙංගු ශ්‍රමදාන තිබ්බා.ලේකම්තුමිය ඇතු ව සියළු දෙනාගේ සහබාගීත්වයෙන්. එහෙත් නගරය අක්‍රමවත්. එක් වර්ගයක් එකම ස්ථානයක පෙල ගස්වන්නේ නම් වඩාත් සුන්දරයි.අලෙවි කුටි පවා එකම ස්ථානයක ස්ථානගත කිරිම වඩා සැලසුම් සහගතයි.

කුඩ සෙරෙප්පු හදන පිරිස නගරයේ සුන්දරම තැන .මේ අය අපිට වැදගත්.ඒත් ඒ අය සිටින ස්ථානය වෙනස් විය යුතුයි. විවේක ගැනිමට හදපු බංකු තිබුනත් ඒවායේ අල ,බෝංචි .ඇත්තටම ඉතා අක්‍රමවත්. මේ පිරිසට ගැලපෙන තැන් සකසලා දෙන්න.

ත්‍රි වීල් රථ ගාල් හැම තැනම බෑ. පාරිභොගිකයන්ට වාහන දාගන්න තැනක් නෑ.මේව අඩුපාඩු.

වෑන් රථ ගාලටත් ස්ථානයත් දෙන්න.වෑන් රථ නගරෙන් ඉවත තැනක් සුදුසුයි.මේවා ගැන සාකච්ජා තියලා මේ සියළු ජීවන වෘත්තීන්ට තැනක් දෙමු.

කාර්යාලය හැදුවා ඇති මේ වසරේ ජනතාවට මුල් තැන දෙමු. කෝටි ගානක් වැඩ කලා අපි නගරයට.ඒ සම්මන්ත්‍රන ශාලාව ප්‍රජාව වෙනුවෙන් අපි මේ වසරේ විවෘත කරමු.

අපේ ක්‍රිඩා පිටිය අති සුන්දරයි.මෙය නිතර උනන්දු වෙන තැනක්.අසංක මහතා මේ ගැන නිතර සොයා බලනවා.මෙය තව දුරටත් ඵලදායී ආදායම් වැඩි තැනක් කරමු.

නගරය නිරන්තර පවිත්‍රව තබා ගැනිමට සේවකයන් 2 ක් වත් යොදවමු. අත් කරත්ත දෙකක් දීලා නිතර කසල ඉවත් කරවමු.බුලත් කෙල තැන තැන.පරිසර පොලිස් ඒකකය සමග, නව පොලිස් ස්ථානාධිපතිතුමා සමග එකතු වී සාකච්ජා කරලා නගරය පවිත්‍රව සුන්දරව තබා ගැනිමට කටයුතු කරමු. විදේශිය ආකර්ශනය දිනාගත් නගරයක් බිහි කරමු.

කුරුවිට බටතොට, බටදොඹ ලෙන ,යන මාර්ග සකසමු.දිවා ගුහාව රථගාලක් හදමු.
බෝපත් ඇල්ල සංචාරක නිකේතනය හදමු.බේරුවල විදේශින් යන්නේ ඔවුන්ට ආකර්ශනය වන පරිදි තියෙන නිසයි. අපිත් ඒ වගේ කරමු.ධන කුවේරයින් ඒවි.

අපි මේ වසර අපිට ආදායම් වැඩි වෙන වැඩ කරන වසරක් කරමු. සභාවේ කීර්ති නාමයට නගරයේ පිරිසිදු කම ප්‍රභල දායකත්වයක් දෙන්නේ.එසේම වැඩිම ආදායම් සභාවට දෙන්නේ මේ නගරය.ඒ නිසා මේ නගරයට උපරිම සාධාරනය කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා</u>

මෙම සභාව කුරුවිට හා කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ දෙකෙන් සමන්විතයි.කුරුවිට නගරය සංවර්ධනය උනත් කිරිඇල්ල එසේ නෑ.අවම පහසුකම් වත්නෑ.වැසිකිලියක් විධිමත් ලෙස නෑ.බස් නැවතුම් පල,ක්‍රිඩා පිටිය. මේවා ඉබා ගාතේ.ක්‍රිඩා පිටිය ඉඩම සබාවට නිසි පරිදි පවරාගෙනත් නෑ.වසර 4 ක් ගියත් කිරිඇල්ල එතනමයි. එක පැත්තක් විතරක් නෙමෙයි. මේ සංවර්ධනය විමධ්‍යගත කරන්න. එසේම මෙ වසර තුල අපේ සභාවේ කිසිම නිශ්පාදනයක් නෑ.
විකල්ප නෑ.විථි ලාම්පු, පාරවල් අපිට අත්‍යවශයයි.ඒ වගේම අපිට සභා ආදායම් වැඩි කර ගත යුතුයි.නව වසරේ වත් කිරිඇල්ල සංවර්ධනය කරන්න.අඩුපාඩු සකසන්න.කුරුවිටත් සංවර්දනය කරන්න.අධිවේගි මාර්ගය එනවළු.හැරනියාවක මැණික් ගන්න ස්ථානයට කිසි දු පහසුකමක් නෑ.පරන ආදායම් මාර්ගම විතරක් නෙමේ.නව ආදායම් සොයන්න.කිරිඇල්ල සංවර් ධනය වේගවත් කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ශාන් මහතා</u>

**සෝමරත්න මන්ත්‍රී තුමාගේ යෝජනාව ස්ථිර කරමි.මාත් වසර 13 ක් සබාව නියෝජනය කලා.සේවාවන් විශාල කොටසක් කලා.සභාපතිවරු 2 ක් යටතේ හිටියා. දැන් අපේ කාලය වසරකින් දීර්ඝ කරලා.මේ වසරේ අපි ජනතාවට වැඩි සේවයක් කරමු.ක්‍රිඩා පිටිය දැන් තණකොල කපන යන්ත්‍රය ගැන මම මේ තාක් කතා කලා.මේ මාසේ විශාල ආදායමක් ලබලා.ලක්ෂ 1 ½ පමන. සභා ආදායම්.කර්මාන්ත පුරයෙන් අපි ආදායම වසරකට ලක්ෂ 15**

විතර වෙන විධිහට සහා ආදායම් වරිපනම් සොයා දුන්නා. සභාපතිතුමා වීපීලාම්පු ලබා දෙනබව දැනුම් දුන්නා.ඒ අයගේ කසල ලෙස තියෙන්නේ එදිනෙදා සේවක දිවා ආහාරය සමග රැස් වෙන දේ විතරයි. සතියට දින 2 ක් ට්‍රැක්ටරය ඇරියත් ඇති.
බටතොට ශ්‍රීපාද පාර විශාල පිරිසක් යනවා.නාන්න ගිහින් වතුර එකවර විශාල ලෙස ඇවිත් මිනිස්සු මැරෙනවා.බටතොට නාන තොටක් හදන්න තැන නොමිලේ දෙන්න අය ඉන්නවා.ආරක්ෂක තොටක්. සිරිපා වන්දනාවේ යන අයට මේක වැදගත්.වලදුරේ පෙට්ටිවලත් තොටක් ලෙස ජනයා ගැවසෙන මනාප තැනක්. බෝපත් ඇල්ල ජනයා දින 4 ට 20000 විතර ඇවිත්. අපි ලයිට් දැම්මා රැටත් නාන්න පුළුවන් හරි වටිනවා.
ඇල්ල හෝටලයක් සැකසීම සංචාරක ආකර්ශනයට ඉතා වැදගත්. අපේ සභාවට එවැනි ආදායමක් නෑ.සම්මන්ත්‍රන ශාලාවක් එක්ක හෝටලය මේ තැනට ඉතා වටිනවා. අපි කතරගම හෝටල් ඇනවුම් කරනවා වගේ අපේ හෝටලයත් ජනතාව බුක් කරයි. මේක නිවාඩු නිකේතනයක් ලෙස පවත්වාගෙන ගිය හැකියි.සබාපතිතුමා,ලබන මාසේ සංචාරක අමාත්‍යාංශයට ගිහින් අපි ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා සමග කතා කරලා පියවර ගමු.එජාප බේදයක් නෑ අපි ඉදිරි කටයුතු කරමු. පක්ෂ භේද අනවශ්‍යයි.

අපි අපේ දරුවන්ට අපි වටිනා ප්‍රදේශයක් හදමු. ව්‍යාපෘති වාර්තා හදලා සියළු පක්ෂ එකතු වෙලා අපි ඉල්ලමු.මේ කාලේ ව්‍යයාපෘති වලට මුදල් දෙනවා. කුරුවිට නගරයේ සම්මන්ත්‍රන ශාලාව වටිනවා.පෙර පාසැල් උත්සව ආදියටත් රත්නපුර නගර ශාලාව,ග්‍රෑන්ඩ් ගාර්ඩියන් හෝටලය ඇනවුම් කරන්නේ. අපිට පිටින් කෑම ගේන්න කියලා පාර්කිං හදලා උත්සව වලට දෙන්න පුළුවන්. අපේ සභා ගොඩනැගිලි නෙමේ දැන් වටින්නේ.සියළු දෙනා සම්බන්ධ වෙලා අපි ජනතා මෙහෙය කරමු.
මම මීට පෙර හැම සභාවකදීම ක්‍රිඩා පිටියට අවශ්‍ය තණකොල කපන යන්ත්‍රය ගැන කීවා.එහි අතවශ්‍යතාවය පෙන්වා දුන්නා.දැන් අවසන් වතාවට ත් මම මේ තණකොල කපන යන්ත්‍රය ඉල්ලා සිටිනවා. තව දුරටත් මීට පසුව මේ ඉල්ලීම සිදු කරන්නේ නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි නයනා ජීවනි අතුකෝරල මිය.</u>

ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාව ස්තිර කරමි. මේ රටේ ප්‍රෙද්ශයේ ජනතාව මේ වන විට දුක්ඛිත තත්වයකට වැටිලා.පීඩාවට පත් වෙලා.ගෑස්, එලවලු,ගිනිගණන්.දරුවන්ට නිසි පෝෂනයක් නෑ. මෙවැනි තත්වයක් යටතේ අපි අපේ ප්‍රදේශයේ ජනතාවගේ තත්වය නගා සිටුවියයුතුයි.
මධ්‍යම සංස්කෘතික අරමුදල සහායත් අරන් මේ යෝජනා ක්‍රයාත්මක කරමු.තව දැනුම තියෙන පරිනත අයත් ගමු.මන්ත්‍රි යෝජනා ගෙන සංචාරක පුරවරය ක් ලෙස නගා සිටුවීමෙන් ජනතාව අත මුදල් ගැවසෙයි. දෙල්ගමුව රජමහා විහාරය ඓතිහාසික උනත් තාම සංවර්ධනයක් නෑ.
දළදා වහන්සේ කාලයක් වැඩ සිටි ඒ බිම ඒ වගේ අනුරුවක් සකසලා,සංචාරක ජනතාවට වැඳපුදාගෙන ඒ ගමන්ම බොපත් ඇල්ල දෙවිපහල දොඩං ඇල්ල ,ආදිය සංවර්දනය කිරීමෙන් ආදායම් මේ ප්‍රෙද්ශයට උත්පාදනය වේවි.පක්ෂ විපන්ෂ බේදයකින් තොරව අපි වැඩ කරමු.තාමත් නගරය ලොකු වෙනසක් වෙලා නෑ.නගරයේ මැද තිබුන කඩ ටික කැඩිලා ඉඩ

වැඩි වෙලා .කුඩා කාලේ දැක්ක දේමයි.දුම්රිය ගොඩනැගිල්ල හදන තැන සංදාරක පුරවරයට අවශය දේ සකසන්න. සංචාරක ආකර්ශනය වන ලෙස හදන්න.නාන තොට ඒ විධිහමයි.මේ වසරේ වැඩ කරලා නගර සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කරලා සංචාරක පුරයක් ලෙස මේ නගරය සකසමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා</u>

මෙම යෝජනාව පක්ෂ විපක්ෂ බේදයකින් තොරව අනුමත කලා. නමුත් කතාව පමනක් මදි.මේවා ක්‍රියාත්මක කලයුතුයි. ජනතාව අපිට බලය දුන්නේ වසර 4 ට.සදාචාරය අගය කරන්නේ නම් ජනතා තීරනයක් ගෙන නව සබාවක් පත් කිරිමට කටයුතු කල යුතුයි.නමුත් වසරකින් දීර්ග කරලා.නීතිමය ගැටළුවක් නෑ. නමුත් මේ දීර්ස කිරීම් බේදවාචකයක් උනා.මේ ජනතාවට දුෂ්කර අවස්ථාවේ ඡන්දය තිබ්බොත් එය අවාසියක්.හේතුව එයයි. මේ අවස්ථාවේ ලංකාවට දේශීය විදේශීය සංචාරකයන් ගෙන්වා ගැනීම ඉතා වැදගත්. ඩොලර් අර්බුධයක්.රට පෙරට යන්න නම් ඩොලර් අවශායි. මේ පුරය හැම දෙයින්ම ආඩ්‍යයි.පාරිසරික ඓතිහාසික ආගමික අතින් සශ්‍රීකයි. නමුත් පලක් ගෙන නෑ. සැළසුම් නෑ.මේ ප්‍රෙද්ශයේ බුද්ධිය පරිනත අය ඕනතරම් ඉන්නවා. අදහස් ගතහැකි.ඒත් අදහස් ගත්තත් ක්‍රියාත්මක නෑ.ඒ නිසා සංචාරකයන් ගෙන්වා ගැනිමට සාකච්චාවට වඩා ක්‍රියාත්මක විම වැදගත්. බටදොඹ ලෙන,බටතොට ලෙන,ගංගා දියඇලි,සිරිපා පෙදෙස් හරහා රටේ සංචාරය කල හැකියි. දැනුවත් කරන්න.මධ්‍යම සංස්කෘතික නිලධාරීන්ගේද සහාය ගෙන මධ්‍යස්ථානයක් සේ දෙස් විදෙස් සංචාරකයන් දැනුවත් කරන්න.ලංකාවේ ජනතාවට නව ආදායම් අවශායි.
කතාවෙන් ඔබ්බට ගිහින් කඩිනමින් ක්‍රියාත්මක කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා</u>

යෝජනාව ස්ථිර කරමි.හැම සභා වාරේම කථා වෙනවා කුරුවිට නගරය දියුනු කල යුතු බව.
අපිත් කියනවා.එය ප්‍රධාන නගරය.මෙය විවේකයේ නගරය.වෙළඳ නගරය.අපේ කාලයේ අපි මේ සංවර්දනයන් කලාම අපේ දරුවෝ පවා ඒගැන සතුටු වේවි.නගරයේ වැසිකිළිය කඩිනමින් කල් නොයවා හදන්න.සැලසුම් සහගතව නගරය ගොඩනගන්න.
එරත්නද සංචාරක පුරයක් ලෙස ඒකාබද්ධව සංවර්ධනය කල හැකියි.විදේශ ආකර්ශනය ලබා ගත හැකියි.සැලසුම් කරන්න.සිරිපා මාර්ගය,මන්නකැති ඇල්ල,වර්නගල ,එසේම පොඩි ඇලි කීපයක් තියෙනවා.විශ්‍රාම ශාලාවක් හදන්න පුළුවන්. ශීත ගඟුල අසලට වීදි පහන් දෙකක් යෙදීම හරිම වැදගත්උනා.දැන් දවාල වගේ.ඒ වෙනුවෙන් ගරු සභාපතිතුමාටත් ලේකම් තුමියටත් ස්තුතියි. වර්නගල ඉඩමක් තෝරාගෙන දෙස් විදෙස් සංචාරකයන්ට විශ්‍රාම ශාලාවක් සැකසීම ඉතා වටිනවා. නතර වෙන්න තැනක් නෑ.සාමාන්‍ය එකක් ඇති.ආදායම් ලැබේවි.වර්නගලට කොළඹ පවා ජේනවා.දියඇලි රැසක් තියෙනවා.ගරු ඇමතිතුමා හමු වෙලා අපි කතා කරමු. වාර්තාවක් හදාගෙන අපි වියදම් ඉල්ලමු.මේ රටට මේ වෙලේ ඩොලර් ඕනි.රටේ ආකර්ශනීය ස්ථාන වැඩිදියුනු කරලා අපි ආදායම් ගමු.එරත්න පමනක් නෙමේ.අපි මේ වගේ ස්ථාන සියල්ල සොයා බලා ඒවා සියල්ලට සැලසුම් සහගතව දියුණු කිරිමට අධාර ඉල්ලමු.අපි කතා කරන දේට වටිනාකමක් දෙමු.මේ ඇතැම් අය රජයේ

**ප්‍රභල මැති ඇමතිවරුන් සමග ගනුදෙනු ඇති පිරිස්.ඉතින් අපි එම සබදතා ප්‍රයෝජනයට ගෙන ජනයාට සේවයක් කරමු.සභා වාර්තාවට විතරක් සීමා නොවී ක්‍රියාත්මක කරමු. දෙල්ගමුව අපේ මුදුන් මල්කඩක්.අපිට බැරි උනා එය ට සාධාරනයක් කරන්න. මේ ස්ථානයේ දළදා මැදුරේ අනුරුවක් හදලා ජනතාවට විවෘත කරමු.දිවා ගුහාව ආදීස්ථාන දියුනු කලාම දෙස් විදෙස් සංචාරකයන් ඒවි.ඕනෑම සහායක් දෙන්න සූදානම්.ගිය වසරට වඩා ආදායම් වැඩි කරගෙන අපි මේ ගමන යමු. ගරු සභාපතිතුමා පෙරමුන ගන්න.විද්වතුන් සමග කතා කරලා අපි මේ ප්‍රදේශය  දියුණු කර ගමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  දීප්ති විජේසිරි මහතා</u>

**ඉතා වැදගත් යෝජනාවක්.අපි පතල් කර්මාන්තය කරගෙන යන කොට විදේශ සංචාරකයින් එනවා බලන්න.ඒ අය හිතන්නේ කපා ඔප දාපු මැනික් පොලවෙන් එනවා කියලා.නැරඹීමට හරිම ආසයි.එය සංචාරක ආකර්ශනය ගන්න අවස්ථාවක්.ඒකට වැඩපිලිවෙලක් සකසන්න.එසේම සංචාරකයන්ට මග පෙන්වන් න ස්ථානයක් හදන්න. මැනික් මිලදී ගැනීමටත් කැමතියි.බටු ගෙදරට තායි අය එනවා වගේ අපිත් ස්ථානයක් හදමු.සංචාරකයන් එයි.ඒ අයට ඉන්න තැනකුත් හැදුවාම ආදායම් අපේ ප්‍රෙද්ශයටමයි.**
**ජ.වි.පෙ.ගරු මන්ත්‍රිතුමා කිවා ප්‍රාදේශිය සභා කාලය දිර්ග කිරිම වැරදි බවක්.2015 ඉවර වෙලා ඒ රජය වසර 2 ½ ක් වග විභාගයකින් තොරව නීතියක් නැතිව හිටිවග සම්බන්ධ යෙන් අමතක වී ඇත.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  ඩිලාන් රණසිංහ මහතා</u>
සියල්ලන්ට දැනෙන යෝජනාවක්.මුළු  කුරුවිට ම සංචාරක පෙදෙසක් ලෙස සැකසුවොත් කුරුවිට කේන්ද්‍ර කොටගෙන දින කීපයක් සං චාරය කල හැකියි. මේ සඳහා සියළු දෙනා එක් තැනකට ගෙනත් වීඩියෝ දර්ශනයක් පෙන්විය හැකියි.මැණික් වගේම තවත් මේ පැත්තට ආවේනික සුන්දර දේ පෙන්විය හැකියි.
උදාහරනයක් ලෙස ලබන සතියේ නෙදර්ලන්තයෙන් එනවා පිරිසක් කෝපි පැක්ටරිය බලන්න.එය කුඩයි.නමුත් ලොව දෙවෙනි නිශ්පාදන කර්මාන්තය.රටවල් 17 ක් ඇවිත් මේ නිෂ්පාදනය බලන්න.මේ වගේ ගුණාත්මක දේ එක් තැනක සිට පෙන්වූවාම එය ඉතා වැදගත් මග පෙන්විමක් වෙයි.
මේ වගේ දේ කරද්දි පක්ෂ විපක්ෂ විෂය  පරිනත බුද්ධිය ඇති අයගෙන් කමිටුවක් හදන්න.වගකීමක් ඇති කමිටුවක්.මේ මාස 12 තුල හොඳ පිලිතුරක් ලබා ගත හැකියි.කුරුවිට

නගරයේ වැසිකිලිය ලක්ෂ 70 ක ඇස්තමේන්තු හදලා ටෙන්ඩර් කරන්න හදලා.ස්ලැබ් දාලා ඒක උඩ වෙලද සංකීර්ණයක් හැදුව හැකියි.ගරු වාසුදේව මැතිතුමාගේ ප්‍රතිපාදන මතයි හැදෙන්නේ.මේ වසර නිම වෙන්න පෙර නවීන වැසිකිලි පද්ධතියක් ජනතාවට දෙනවා. සහා ආදායම් වැඩිවේවි.ප්‍රශ්න විසඳාගෙන සංවර්ධනය කිරිමට නායකත්වය දායකත්වය දෙමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

මෙම යෝජනාව පිලිබද ඉතා එකඟයි.වසර 4 ක් ඉදලා මේ අවසන් වසරේ හෝ මේවා ක්‍රියාත්මක කලොත් වැදගත් වේවි.කෙතෙක් කතා කලත් වැදගත් දේ කෙරුනේ නෑ.ප්‍රතිපාදන ලැබී සංවර්ධනය වීම ඉතා වැදගත්.එසේම එතුලින් ආදායම් ලැබෙනු ඇත.ගැටළුව වන්නේ මේ අවස්ථාව වන විටත් වැසිකිලියට යාම ගැටළුවක් විමයි. වසරක් යන තුරු නව වැසිකිලිය ඉදිවීම සිදුවන්නේ.එතෙක් ජනතාවට එයට යාමට තත්වයක් හැදිය යුතුයි.එය ගරා වැටෙමින්.දොර කැඩී ඇත.තීන්ත ගාල හාපික් දාලා නිසි ලෙස පවිත්‍ර කරවලා දොර හදන්න.ඒ ඇති.පිරිමින් සඳහා ඇති ස්ථානයත් කැඩී ඇත.එය සවි කරන්න.මාහට අතේ වියදමින් කල හැකි වුවත් ඒ සඳහා අවසරයක් අවශ්‍ය වේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා</u>**

ලබන මාසේ ඒ ගොඩනැගිල්ල කඩනවා.විකල්ප තීරනය කර ඇත.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

එසේම සිරිපා වන්දනාවේ යන පිරිසට වැසිකිලි යන්න තැනක් නෑ.ඒ බස් රථය ප.ව.4.30ට නවතිනවා.100,200 ක්ට නවාතැන්පලක් නෑ.ප.ව.6.30 තෙක් අපි බසයක් දානවා.අපි ඇල්ල සංවර්ධනයට ඉඩම් පෙන්වා දුන්නත් ඒවා වෙන අය සතු කර ගන්නාතෙක් ලබා ගැනිමට කටයුතු නොකිරිම තුලින් ඒ ඉඩම් අහිමි උනා.ගිය රජය සමයේ අපේ ධුර කාලය අවසන් උනත් ජන්දෙ තිබ්බේ නෑ. කොමසාරිස් පාලනයක් දැම්මා.මේ වගේ කල් යාම් 91-97 දෙවතාවක් උනා.මං විරුද්ධ උනා. අපි පෙලපාලි ගියා ජන්දය තියන්න කියලා.මේ ජන්දෙත් පැවැත්විය යුතුයි.අපි පුළුවන් විධිහට කොට්ඨාශයට වැඩ කලා.මේ වසර කියලා වෙනම වැඩ කියලා විශේෂ නෑ.ජීවිත කාලෙම කොවිඩ් එක්ක ඉන්න වෙන්නත් පුළුවන්.දරාගත හැකි සංවර්ධනයක් කරන්න.ඒවා තිරසාරව කල යුතු වුවත් ස්තිර යයි දෙයක් ලොව නැති නිසා දරාගත හැකි දේ කරන්න.වැසිකිලිය වුවත් දරා ගත හැකි තරමට කිරීම වැදගත්. බුද්ධිය ඇති අයගේ උපදෙස් වැදගත්.පොහොර ප්‍රශ්නය වුවත් බුද්ධිමත් උපදෙස් මත ජයගතහැකිව තිබූ ගැටළුවක් වේ.අතිගරු ජනපතිතුමන් සමගද මේ තේ පෝර පිලිබඳව මා කතා කලා.සංවර්ධනයේදී මුදල් බෙදියාම පිලිබඳව මා මීට පෙර කතා කලා. වසමට බෙදිය යුතු බව මා කිවා.කෙසේ වෙතත් ක්‍රමානුකූලව සැලසුම් සහිතව කටයුතු කරන්නේ නම් සහයෝගය ලබා දෙමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා-</u>**

ප.ව. 8.30ට බස් රථයක් දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**සෝමරත්න මන්ත්‍රිතුමාගේ යෝජනාව ස්තිර කරමි. මෙමකාලය තුල අපි කීප වතාවක් මෙම යෝජනාව කලා.විශාල ලෙස සැලසුම් කලත් ඒවා ක්‍රියාත්මක උනේ නෑ.විදේශිකයින් මෙම ප්‍රදේශ වලට එන්නේ මෙහි තිබෙන පාරිසරික, ඓතිහාසික ආකර්ශනය නිසයි.ඒනිසා මුළු මනින් කොන්ක්‍රිට් කිරිම සුදුසු නෑ.ඒකිබද්ධ වැඩපිලිවෙලක් හදලා ලබන සභාවේ සිට ක්‍රියාවට නංවමු.**

**පළාත් පාලන ආයතනයක් ලෙස අපිට අනෙක් ආයතන වලට වැඩි ආර්ථික අතින් වටිනා සංචාරක ආකර්ශනීය ස්ථාන ඇත. ඇල්ල ප්‍රධාන ආදායම් උත්පාදන මාර්ගයක් වන අතර විධිමත්ව භෞතික ඥානය භාවිත කර සැලසුම් කරන්න.මේවා වචන පේලි පමනක් නොවිය යුතුයි. කුරුවිට මැණික් ගැන කතා කලා.අපිට ඵලදායිවන ලෙස කුඩා සැලැස්මක් හදා අපි ක්‍රියාත්මක කරමු. පසුගිය වසරෙත් අදහස් දැක්වූවා.ජනතා අභිලාශ වැදගත්.මෙම යෝජනාවට ප්‍රමුඛතාවය දි කටයුතු කරන්න.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

**දීර්ඝ අදහස් දැක්වීමක්.අපි පසුගිය වසර වල් තුල විශාල වැඩ කොටසක් කලා. නමකෝටි දාහත්ලක්ෂයක වැඩ කලා.කුරුවිට නගරයට කෝටි 31/2 යි,කිරිඇල්ලට කෝටි ½ , අනෙක් වා මන්ත්‍රි ප්‍රතිපාදන.ගරු සෝමරත්න මන්ත්‍රිතුමා එක්ව නැගී සිටිමු කිවේ ආණ්ඩුවට විරුද්ධව නොවේ.වැඩ කිරිම සදහායි. අපි හදපු ආණ්ඩුව තුලයි අපි ඉන්නේ. අපි සභාවට පත්වන විට ඒ පැවති රජයෙන් ප්‍රතිපාදන ලැබුනේ නෑ.ඒත ඒ පක්ෂේ හිටි අය ගොඩක් වැඩ කිරිම ගැන සතුටුයි. මේ වෙන විට මුදල් එක කොට්ඨාශයකට ලක්ෂ 70 පමන ලබා දිලා.පක්ෂ විපක්ෂ හැමෝටම දෙනවා. අතිගරු ජනපතිතුමාට,අතිගරු අගමැතිතුමා ඇතුළු මැති ඇමතිවරුන්ට ස්තුතිය පුද කරමි. මේ අවස්ථාව වන විට පුස්තකාල ගොඩනැගිල්ලේ අඩක් වැඩ නිමි හා සබාව වටා බැම්ම කොටසක් සිදු කිරිම මේවා ඉතා වැදගත් .සභාවට අනාගතයේ පත්ව එන අයට ත් මේවා වැදගත්.පුස්තකාලය පුර්න ලෙස වැඩ නිම කර ජනතාවට ලබා දියයුතුයි.එය අත්‍යාවශ්‍ය ජනතා ඉල්ලිම්.කුරුවිට නගරය සභාවේ හදවතයි.කිරිඇල්ල ට අවධානය මදි බවක් ප්‍රකාශඋනා.භෞතික පිහිටිම එක්ක ගැටළු ඇත. ගරු ශානක මහතා කිරිඇල්ල සම්බන්ධ ගැටළු ඉදිරිපත් කලා.ඒ සම්බන්ධයෙන්ද හැකි පියවර කඩිනමින් ගමු. වසර 4 කින් නොහැකි වූ දේ එක් වසරකින් බැරි වුවත් අපි කල හැකි දේවල් ටික කරමු. කඩිනමින් මේ සංචාරක ආකර්ශනිය ස්ථාන සම්බන්ධයෙන් කටයුතු කිරිමට සුදුසු පිරිස කැඳවා සාකච්ජාවක් සිදු කර අදහස් ගෙන කටයුතු කරමු.ලබන මාසේ මුල මෙම සාකච්ජාව කැඳවීමට ලේකම්තුමිය පියවර ගන්න. සුදුස අය නම් කර කැදවන්න.**

**බෝපත් ඇල්ල සම්බන්ධයෙන්ව්‍යාපෘති වාර්තාවක් අදාල අමාත්‍යංශයට භාරදී ප්‍රහල දේශපාලන අධිකාරියේ සහාය ඇතිව මුදල් ලබා ගැනීමට කටයුතු කරමු.ගරු කැළුම් මන්ත්‍රි තුමාද මේ සංචාරක ආකර්ශනීය ස්ථාන සම්බන්ධ කටයුතු වලට සහාය ලබා දෙන්න.ගරු ඩිලාන් මන්ත්‍රි තුමාට ස්තුතිවන්ත වෙමි.කුරුවිට නගරයේ ගැටළුවක්ව පවතින වැසිකිලිය සම්බන්ද කටයුතු ලබන මස ඇරඹීම දැඩි සතුටක්. සියළු අතින් ජනතාවට ආර්ථික ශක්තියක් පහසුවක් ඇතිවන කටයුතු සිදු කිරිම ඉතා සතුටක්. මාධ්‍යද මේ අවස්ථාවේ සිටින අතර**

**එතුමන්ලාද මෙම සංචාරක කටයුතු සඳහා අදහස් සහාය ලබා දෙන්න. බොපත් ඇල්ල නිවැරදි දත්ත අනුව මෙම මස ආදායම රු.දෙලක්ෂ තිස් එක්දාස් හයසීයක් වන අතර ක්‍රීඩා පිටිය රු.17000.00 පමන වේ. ප්‍රාදේශීය සභාවක් ලෙස කල හැකි ටික අපි කරමු.කිරිඇල්ල වැසිකිලිය සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය හරහා ඉදිරි කටයුතු කරනවා.මේ වසර තුල සියළු ගරු මන්ත්‍රීතුමන්ලා අනෙක් සභා වලට වඩා යම් වැඩක් කලා.කෝටි ගානක් වියදම් කලත් තම නම යටින් ගැහුවොත් හොඳයි.මේ වසරේ සිටවත් කරමු.ජනතාව දැනුවත් වෙන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** කුරුවිට නගරය හා කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය අලලා ආකර්ශනීය සංචාරක ස්ථාන සඳහා දේශීය හා විදේශීය සංචාරකයින් ගෙන්වා ගැනීම සඳහා නව වසරේ විශේෂ වැඩ පිලිවෙලක් සැකසීම සම්බන්ධව මූලික කටයුතු කිරීමට සුදුසු පිරිස කැඳවා සාකච්ජාවක් සිදුකර අදහස් ගෙන ඉදිරි කටයුතු කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05 – 02 කුරුවිට නගරයේ පවිත්‍රතාවය පවත්වා ගෙන යාම සඳහා පරිසර පොලිස් ඒකකය සමඟ විශේෂ වැඩපිලිවෙලක් සැකසීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

<u>මෙම යෝජනාව පිලිබඳ අදහස්ද ඉදිරිපත් කල අතර</u> කුරුවිට නගරයේ පවිත්‍රතාවය පවත්වා ගෙන යාම සඳහා පරිසර පොලිස් ඒකකය සමඟ විශේෂ වැඩපිලිවෙලක් සැකසීම සම්බන්ධවද ඉදිරියේදී කැඳවීමට නියමිත සාකච්ජාවේ දි අදහස් ගෙන ක්‍රියාත්මක කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා -</u>**

**<u>එම යෝජනාව ස්ථිර කරමි.</u>**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx_ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** කුරුවිට නගරයේ පවිත්‍රතාවය පවත්වා ගෙන යාම සඳහා පරිසර පොලිස් ඒකකය සමඟ විශේෂ වැඩපිලිවෙලක් සැකසීම සම්බන්ධවද ඉදිරියේදී කැඳවීමට නියමිත සාකච්ජාවේ දි අදහස් ගෙන ක්‍රියාත්මක කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :**

**05- 03 යටිපච්ච ජයවර්ධන මාවත මාර්ගයේ ජයවර්ධන මහතාගේ නිවස අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරිම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමේ යෝජනාව ( රු. 400000.00)**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා**

**යටිපච්ච ජයවර්ධන මාවත මාර්ගයේ ජයවර්ධන මහතාගේ නිවස අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 400000.00 ක ප්‍රතිපාදන ලබා දිමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා _විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව යටිපච්ච ජයවර්ධන මාවත මාර්ගයේ ජයවර්ධන මහතාගේ නිවස අසල සිට ඉදිරියට මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා රු. 400000.00 ක ප්‍රතිපාදන ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05- 04 මඩල මහගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා**
**මෙය මහගස්වත්තලෙස සංශෝදනය විය යුතුයි.ඒ අනුව මඩල මහගස්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා _විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව මඩල මහගස්වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05- 05 යටිපච්ච සදුන් මහතාගේ නිවස අසලින් දකුණට මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා**

**මෙම යෝජනාව සංශෝදනය කරමි. ඒ අනුව යටිපච්ච සදුන් මහතාගේ නිවස අසලින් දකුණට මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ යෝජනාව වෙනුවට යටිපච්ච හම්පලදෙනිය ධර්මදාස මහතාගේ නිවස අසලින් වමට මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.කේ.ලක්මාල් රුවන් කුමාර මහතා _විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව යටිපච්ච හම්පලදෙනිය ධර්මදාස මහතාගේ නිවස අසලින් වමට මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :**

**05- 06 නඩුකාරදෙනිය රම්‍ය පෙදෙස කට්ටිකරන ලද ඉඩමෙන් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති භූමිය හරහා ගම්පුබුදු මාවත සම්බන්ධ කිරීමට මාර්ග කොටසක් වෙන්කර දෙන ලෙස කරනු ලබන යෝජනාව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

**නඩුකාරදෙනිය රම්‍ය පෙදෙස කට්ටිකරන ලද ඉඩමෙන් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති භූමිය හරහා ගම්පුබුදු මාවත සම්බන්ධ කිරීමට මාර්ග කොටසක් වෙන්කර දීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් _විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව නඩුකාරදෙනිය රම්‍ය පෙදෙස කට්ටිකරන ලද ඉඩමෙන් ප්‍රාදේශීය සභාවට ලබා දී ඇති භූමිය හරහා ගම්පුබුදු මාවත සම්බන්ධ කිරීමට මාර්ග කොටසක් වෙන්කර දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05-07 ගම්පුබුදු මාවත බුදුමැදුර අසල පහල පාර කොන්ක්‍රීට් කිරීමේ යෝජනාව (රු.500000.00)**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

**ගම්පුබුදු මාවත බුදුමැදුර අසල පහල පාර කොන්ක්‍රීට් කිරීමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබා දීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් _විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව ගම්පුබුදු මාවත බුදුමැදුර අසල පහල පාර කොන්ක්‍රීට් කිරීමට රු.500000.00 ක ප්‍රතිපාදන ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05- 08 ගම්පුබුදු මාවත හරස් පාර කොන්ක්‍රීට් කිරීමේ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

**ගම්පුබුදු මාවත හරස් පාර කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින්**
**_විසින්_ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව ගම්පුබුදු මාවත හරස් පාර කොන්ක්‍රීට් කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :**

**2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-09 හි උද්ධෘතය**

**05- 09 නැ/ මුදුන්කොටුව අම්පිටිකන්ද මාර්ගය වෙන්කර සභාවට පවරා ගැනීමේ යෝජනාව**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා**

**මෙම මාර්ගය මියනදෙනිය වසමට අයිති වේ. මාර්ගය සෘජුව භාවිතා කරන පවුල් ඒකක 20ක් සිටි. රජයේ ඉඩම් හරහා මාර්ගය යන අතර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් මුල් කොටස කොන්ක්‍රිට් කලා. මැද කොටස කොන්ක්‍රිට් කර නොමැති අතර ඉතිරි කොටසට ඉඩම් දෙන්න පිරිස කැමතියි. ආරන්‍ය සේනාසනයක්ද ඇති අතර ප්‍රජා ජල ව්‍යාපෘතියක්ද එනවා.සියළු කටයුතු සඳහා මාර්ගය අවශ්‍යයි.බිම් සවිය මගින් මැනීම් කටයුතු සිදු වන අතර නැ/ මුදුන්කොටුව අම්පිටිකන්ද මාර්ගය වෙන්කර නිත්‍යානුකූලව සභාවට පවරා ගන්නා ලෙස යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා**

**එම යෝජනාව ස්ථිර කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව අතර නැ/ මුදුන්කොටුව අම්පිටිකන්ද මාර්ගය වෙන්කර නිත්‍යානුකූලව සභාවට පවරා ගැනීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-09 හි සත්‍ය උද්ධෘතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :

**05- 10බෝපත් ඇල්ල නැරඹීමට එන මහජනතාව සඳහා බෝට්ටු සංචාර කිරිමට බෝට්ටුවක් ලබාදීම සම්බන්ධ යෝජනාව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා**

**බෝපත් ඇල්ල නැරඹීමට එන මහජනතාව සඳහා බෝට්ටු සංචාර කිරිමට බෝට්ටුවක් ලබාදීමට යෝජනා කරමි. මේ දිනවල සියළු දෙනා උණ ගස් බැඳපු පහුරකින් වෙටේට යනවා. දිස්ත්‍රික් ලේකම්තුමියත් ඒ පහුරෙන් එදා ගියේ.සබාවෙන් හෝ පුද්ගලිකව හෝ සුදුසු සංචාරක බෝට්ටුවක් සේවයේ යොදවන්න.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

**සබාවට කලින් දුන්නා.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**

**එය මෙම ස්ථානයට සුදුසු නොමැති එකක්.සභාවේ බෝට්ටුවක් තිබුනත් මෙතැන යන්න බෑ.සුදුසු බෝට්ටුවක් ලබා ගමු.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx** **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා විසින්** **ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව බෝපත් ඇල්ල නැරඹීමට එන මහජනතාව සඳහා බෝට්ටු සංචාර කිරිමට සුදුසු බෝට්ටුවක් ලබාදීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05- 11 බෝපත් ඇල්ල නැරඹීමට එන සංචාරකයින් සඳහා බෝපත් ඇල්ල පාක් එකේ( රථ ගාලේ ) සිට බෝපත් ඇල්ල දක්වා යාමට කැබ් රථ 02ක් (සුදුසු රථ 02 )ලබාදීම සම්බන්ධ යෝජනාව.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා**

**බෝපත් ඇල්ල නැරඹීමට එන සංචාරකයින් සඳහා බෝපත් ඇල්ල පාක් එකේ( රථ ගාලේ ) සිට බෝපත් ඇල්ල දක්වා යාමට කැබ් රථ 02ක් (සුදුසු රථ 02 )ලබාදීමට යෝජනා කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා**

**දැනට රථගාලේ වාහන දැම්මම එතන ඉදන් පයින් යන්නේ .සමහරු රථගාලේ නතර නොකර මත් යනවා.බයිසිකල් පාර දිගේ යනවා. සබාවෙන් හෝ පුද්ගලිකව හෝ මෙම සංචාරයට සුදුසු වාහන 2ක් දෙන්න.කැබ් සර්විස් හෝ සුදුසුයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා**

**ජනතාව පයින් යාම තුලින් දෙපස පොඩි කඩ තියෙන අයගේ ජීවනෝපායට සහායක් වෙනවා.**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-**

**එම කඩ සියල්ල ඉදිරියේදී රථගාලට යැවෙනවා.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා**

**එතෙක් සංචාරක ජනතාව පයින් ගියොත් හොඳයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා**

දුන්හිදටත් පයින් යන්නේ.දෙපස සිරි නරඹමින්.යන්න බැරි අයට රෝද පුටු තියෙනවා.විදේශ රටවල බැටරියෙන් දුවන ලෙස සකසා ඇති වාහනත් හොඳයි. ඇවිදින්න බැරි අයට ඒ වාහන දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

ඇල්ල නැරඹීමට,පරිසරය රස විදීමට සුදුසුයි.සියළු වෙළඳ කුටි එක තැනකට ගේන්න ඕනි.කැලි කසල ඉවත් වෙන්න ඕනි.සුන්දරව තියෙන්න ඕනි.ගරු ප්‍රසන්න රණතුංග ඇමතිතුමාගෙන් ඉල්ලන්න.දුම් නැති ගැලපෙන එකක්.අමතර ආදායමකුත් එනවා.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>

සුදුසු යෝජනාවක්.අවශ්‍ය පිරිසට පයින් යන්න පුළුවන්.බොලේරෝ කැබ් එක හදලා ඒ සඳහා යෙදවීමත් කල හැකියි.වාර්තාවක් හදලා සුදුසු දන්න අයෙකු මගින් ක්‍රමවේදයකට හදවමු. තක්සේරුවක් ගත යුතුයි. එසේම දුම් නැති සුදුසු වාහනයක් ලබා ගැනීම මේ සම්බන්ධයෙන්ද තොරතුරු සොයා බලා ඉදිරියේදි කටයුතු කරමු. දැනුවත් කරන්නම්.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා විසින්</u> ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව බෝපත් ඇල්ල නැරඹීමට එන සංචාරකයින් සඳහා බෝපත් ඇල්ල පාක් එකේ( රථ ගාලේ ) සිට බෝපත් ඇල්ල දක්වා යාමට කැබ් රථ 02ක් (සුදුසු රථ 02 )ලබාදීම සම්බන්ධව පියවර ගැනීම සඳහාමෙම සභාව සතු බොලේරෝ කැබ් යන්ත්‍රය යෙදවීමේ හැකියාව පිලිබද හා වෙනත් සුදුසු වාහනයක් ලබා ගැනීම පිලිබඳ තොරතුරු සොයා බලා ඉදිරියේදි කටයුතු කිරිමට හා සබාව දැනුවත් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05- 12 දෙහිත්ත හබරළහේන පාර සංවර්ධනය කිරීමේ යෝජනාව.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා</u>

දෙහිත්ත හබරළහේන පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>

**<u>එම යෝජනාව ස්ථිර කරමි.</u>**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංජිත් මෙන්ඩිස් මහතා විසින්</u> ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව දෙහිත්ත හබරළහේන පාර සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ප්‍රේමා ගම්ලත් මිය විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :</u>**

**05-13 දෙවිපහල සූදාගල මාර්ගයේ ලසන්ත මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කරගැනීම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාගැනීම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ප්‍රේමා ගම්ලත් මිය</u>**
**මෙම යෝජනාවේ සූදාගල යන්න සූදනගල ලෙස විය යුතුයි.ඒ අනුව දෙවිපහල සූදනගල මාර්ගයේ ලසන්ත මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කරගැනීම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**
**<u>එම යෝජනාව ස්ථිර කරමි.</u>**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ප්‍රේමා ගම්ලත් මිය විසින්</u> ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව දෙවිපහල සූදනගල මාර්ගයේ ලසන්ත මහතාගේ නිවස දක්වා ඇති මාර්ගයේ ඉතිරි කොටස කොන්ක්‍රිට් කරගැනීම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05- 14 කොට්ඨාශයේ අවශ්‍යතාවය සඳහා රු.200000.00ක හියුම් පයිප්ප ලබා ගැනීමේ යෝජනාව.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ප්‍රේමා ගම්ලත් මිය</u>**

**කොට්ඨාශයේ අවශ්‍යතාවය සඳහා රු.200000.00ක හියුම් පයිප්ප මිලදී ගෙන ලබා දෙන ලෙස යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**<u>එම යෝජනාව ස්ථිර කරමි.</u>**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ප්‍රේමා ගම්ලත් මිය විසින්</u> ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කොට්ඨාශයේ අවශ්‍යතාවය සඳහා රු.200000.00ක හියුම් පයිප්ප මිලදී ගෙන ලබා දීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**05- 15 දෙනිත්ත වැරැව මුකලාන මාර්ගය කොන්ක්‍රිට් කිරිම සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබාගැනීම සම්බන්ධ යෝජනාව.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ප්‍රේමා ගම්ලත් මිය</u>**

**දෙනිත්ත වැරැව මුකලාන මාර්ගය කොන්ක්‍රිට් කිරිමට සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබා දෙන ලෙස යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-</u>**

**<u>එම යෝජනාව ස්ථිර කරමි.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ප්‍රේමා ගම්ලත් මිය</u>**

**ගරු රංජිත් බණ්ඩාර මැතිතුමා දෙනිත්ත හපුගල මාර්ගය සඳහා රු.මිලියනයක් වෙන් කර ඇත.ඒ වෙනුවෙන් ස්තුතිය පල කරමි.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණි ප්‍රේමා ගම්ලත් මිය විසින්</u> ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව දෙනිත්ත වැරැව මුකලාන මාර්ගය කොන්ක්‍රිට් කිරිමට සඳහා රු.500000.00 ක ප්‍රතිපාදන ලබා දිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එච්.අසංක එරන්ද මහතා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනා :</u>**

## 2022.01.18 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-16 හි උද්ධෘතය

**05- 16 ඉඩංගොඩ පොදු ක්‍රීඩා පිටිය ප්‍රාදේශීය සභාවට විධිමත්ව අත්පත් කර ගැනීම සම්බන්ධ යෝජනාව**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එච්.අසංක එරන්ද මහතා

ඉඩංගොඩ පොදු ක්‍රීඩා පිටිය ප්‍රාදේශීය සභාවට විධිමත්ව අත්පත් කර ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එච්.අසංක එරන්ද මහතා

මෙම පිටිය ටික ටික මිනිසුන් අනවසරයෙන් අල්ලාගෙන එල්. ආර්.සී ඉඩම විධිමත්ව පවරාගෙන නෑ.අක්කර තුනක් පමන ඇත.කඩිනමින් පවරාගැනීමේ කටයුතු සිදු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා

මෙම පිටිය ප්‍රාෙද්ශීය සභාවට නිල ලෙස දුන් එකක්.මේ මුල් අවස්ථාවේ ගරු ධර්මසිරි පෙරේරා මහතා හිටියා.දෙවන අවස්ථාවේ මම ගියා.ඉඩංගොඩ වත්ත.විධාතාඑකට.පර්චස් 20 දුන්න.පොදු සුසාන භූමිය, සත්වපාලනය කරන විජේරත්න අක්කර බාගයක.බැකෝ කර්මාන්ත කරන කෙනා ඉඩම ආක්‍රමනය කරලා.මැනුම් නියෝග ගන්න පුද්ගලිකව හෝ. යෝජනාව කල ගරු මන්ත්‍රීතුමාත් සහභාගීවෙලා මැදිහත්ව කටයුතු කරන්න.මෙම ඉඩම නැති උනොත් දැඩි අලාභයක් වෙන්නේ.නගර සංවර්දනයට මේ ඉඩම හරිම වැදගත්.මේ වසරේ කිරිඇල්ල ප්‍රමුඛ කාරනයක ලෙස මෙය කරන්න.අධිවේගිමාර්ගය එහා පැත්තෙන්.ඉඩම් ප්‍රතිසංස්කරන කොමිෂමත් සහාය වන බව කිව්වා.කම්බි වැට ගහන්න.විශේෂ අවධානය දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජීවන් අබේවික්‍රම පාල මහතා -

බෝධිමළුව වසම අමුහේන්කන්ද ලමා සායනය ඉඩම තුල යම් පාර්ශවයක් විසින් ඉදි කිරීම් ද්‍රව්‍ය දාලා.මෙ සම්බන්ධයෙන් ලේකම්තුමියගේ දැනුම් දීමෙන් එල්ලාවල උප කාර්යාලයෙන් සොයා බැලුවා.නැවතත් ගැටළු විය හැකියි. අපිට අයත් දේපල.වට මැනලා අවුල නිරවුල් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තරංග නිල්මිනි ආනන්ද මහතා -

අම්බලම ස්ථානය පිටිපස්සේ අල්ලලා.නිරවුල් කර ගන්න.අවුරුදු 100 ට පැරනියි.සංරක්ෂනය කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-

කිරිඇල්ලපිටිය සඳහා මිල ගනන් කැදෙව්වත් ලබුනේ නෑ.පසුව කිරිඇල්ල ප්‍රාෙද්ශීය ලේකම් තුමාව දැනුවත්කරලා රජයේ මිනින් දෝරුට දැනුම් දුන්නා මනින්න කියලා.ඒ අනුව රජයේ මිනින් දෝරු මගින් ඉඩම මැනීම කටයුත්තට මැදිහත්වෙන්න.

**එසේම ගරු ජීවන් අබේවික්‍රම පාල මහතා පැවසූ පරිදි බෝධිමළුව අම්බලම ඒ ගොඩනැගිල්ල සභාවට අයිති.ලිඛිත සාක්කි නෑ.නමුත් මේ හදන ගොඩනැගිල්ල පිටිපස්සේ වෙල දක්වා.මේ සම්බන්ධයෙන් සොයා බලා නීතිමය පියවර ගමු.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

**බෝධිමළුවට මෙහා වම් අත පැත්තේ නාමල් දෙනියට කෙටි පාරක් ඇත.පැරනි සමාගම් මඩුව තිබූ ස්ථානයේ දැන් නිවසක් ඇත.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා :-</u>

**ජනතා අවශයතාවයට පෙර එම සමාගම් මඩුව පුද්ගලික ඉඩමක සැකසිමට ඉඩ දී ඇති  අතර එය දැන් ඉඩම හිමිකරු නිවෙස බවට පත් කර ඇත.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  එස්.එච්.අසංක එරන්ද මහතා</u>**
**<u>විසින්</u> ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව ඉඩංගොඩ පොදු  ක්‍රීඩා පිටිය  ප්‍රාදේශීය සභාවට විධිමත්ව අත්පත් කර ගැනීම  සම්බන්ධයෙන් කිරිඇල්ල ක්‍රීඩා පිටිය මැනීමට  සඳහා මිල ගනන් කැදෙව්වත් නොලැබීම හේතුවෙන් රජයේ මිනින් දෝරු මගින් ඉඩම මැනීමට දැනුම් දී ඇති අතර එම මැනීම කටයුත්තට  මැදිහත්විමට හා කඩිනම් කර ගැනිමට  ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-16  හි සත්‍ය උද්‍ෘතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

<u>කල්දී ඇති යෝජනා යටතේ ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා</u>

**05- 17** කුරුවිට නගරයේ බස්නැවතුම්පලෙහි ඇති තාවකාලික කඩ කාමර වල ලයිට් කණුවට මැදිව පවතින කඩ කාමරය සාධාරණ මාසික කුලියක් යටතේ ලබා දෙනලෙස සිනමාහල පාර ,එක්නැලිගොඩ. කුරුවිට එම්. අජිත් රුවන් කුමාර මයා විසින් ඉදිරිපත් කර ඉල්ලීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>
මෙම යෝජනාව පසුගිය සභාවාරයේ තීරණයක් ගත් යෝජනාවක් වුවත් එය න්‍යාය පත්‍රයේ ඇතුලත් වූවක් නොවේ.ඒ නිසා මෙම යෝජනාව නීත්‍යානුකූල කිරිම සඳහා නැවත සභාවට ඉදිරිපත් කර ඇත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි මහතා -</u>

මගේ කොට්ඨාශයේ පුද්ගලයෙකු මෙම කඩය මීට පෙර මෙම කඩය ඉල්ලුවා.ඒ අවස්ථාවේ කීවේ මෙම කඩය ටෙන්ඩර් කරන බවයි.ඒ අනුව මම ද එම පුද්ගලයා වෙත දැනුම් දුන්නේ කඩය ටෙන්ඩර් කරන බැවින් ටෙන්ඩර් කරන අවස්ථාවේ ඉල්ලුම් කර මිල ගානක් ඉදිරිපත් කරන ලෙසයි.නමුත් දැන් ඒ කඩය එක් පුද්ගලයෙකුගේ ඉල්ලීමට ලබා දෙන්න යනවා.මම ඉල්ලීම් කරනවා මෙම කඩය ටෙන්ඩර් කර ලබා දෙන ලෙස.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මෙය රීති ප්‍රශ්නයක්.මේ යෝජනාව කාගේද?අඩුපාඩු සහිතයි.යම් යෝජනාවක් ඉදිරිපත් කරන විට එය කාගේද යන්න සඳහන් විය යුතුයි.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>
න්‍යාය පත්‍රය මා විසින් අත්සන් කර ඉදිරිපත් කර ඇති අතරකල් දී ඇති යෝජනා යටතේ ගරු මන්ත්‍රිතුමන්ලා විසින් ඉදිරිපත් කර ඇති යෝජනා ඔබතුමන්ලාගේ නමින්ම එහි ඉදිරිපත් කර ඇත.අනෙකුත් යෝජනා මා විසින් මහා සභාවට ඉදිරිපත් කරන යෝජනාවේ.කෙසේ වෙතත් පහසුව සඳහා මෙම අනෙකුත් යෝජනා මා විසින් ඉදිරිපත් කරන යෝජනා ලෙස සඳහන් කරන්න.ඒ අනුව මෙම අවස්ථාවේ සංශෝදනයක් සිදු කර ගරු සභාපති තුමා විසින් කල්දී ඇති යෝජනා යටතේ ඉදිරිපත් කරනු ලබන අනෙකුත් යෝජනා ලෙස මෙම යෝජනා ඉදිරිපත් කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මෙම කඩය කීප දෙනෙක් ඉල්ලුවා.ටෙන්ඩර් දාන්න.සභාව මගින් මිල ගනන් කැඳවලා ඉල්ලන්න.කඩ කාමර දෙනකොට ලයිට් කණුව අස්සේ 2 ක් තිබුණ.මේක ටෙන්ඩර් කරන්න.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**

**ගරු ඒ.ඒ.විජේතුංග මහතා මගින් අයෙක් ඉල්ලුවා.දීප්ති මන්ත්‍රීතුමා ගේ ප්‍රදේශයේ අයෙක් ඉල්ලුවා.තැඹිලියන තවත් අයෙක් ඉල්ලුවා.නමුුුුුුත් ඒ වසරකට පමන පෙර. පසුගිය සභාවේ තීන්දුව ගත්තා.ඒඅවස්ථාවේ සබා එකගතාවය ලැබුණා.එමනිසා එම එකඟත්වය අනුවයි දුන්නේ.නැවත ආපසු ගන්නේ කෙසේද යන්න ගැටළුවක්.න්‍යාය පත්‍රෙය් නොතිබූ නිසා මෙය ඉදිරිපත් කලේ.නමුත් තීන්දුවක් ගත්තා .**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

මෙම යෝජනාව ලිඛිතව තිබුනත් න්‍යාය පත්‍රයේ තිබුනේ නැහැ. මෙම කඩ කාමරය ටෙන්ඩර් කරන්න.මිල ගනන් ලබාදෙයි.සභාවට ආදායම එනවා.මගේ මතය මෙය ටෙන්ඩර් කල යුතුයි.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>**

මේ සම්බන්ධයෙන් ආදායම් පරිපාලක යොමු කර වාර්තා ලබා ගත්තා. විදුලි කණුව අසල ,රාත්‍රියේ මිනිසුන් මුත්‍රා කරන ස්ථානයක් බවට පත්වූ තැනක්.සබා තීන්දුවක් ගත්තා.මෙය නීත්‍යානුකූල කල යුතු නිසා ඉදිරිපත් කලේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි මහතා -</u>**

එදා ඒ ඉල්ලූ පුද්ගලයාට මා දැනුම් දුන්නේ ටෙන්ඩර් කරයි කියලා.ඒ මිනිස්සු ඒ අවස්ථාවේ කතා වුනේ සිනමාහල පාර,එක්නැලිගොඩ,කුරුවිට තැඹිලියන වගේ ප්‍රදේශවල අයගෙන් ඉල්ලීමක් එනතුරු ඉන්නේ.ඒ අයටම විතරයි දෙන්නේ කියල.මේ තත්වය වැරදියි.ටෙන්ඩර් කරන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා -</u>**

මා මෙම ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රී වරයා වන අතර වසර දෙක තුනක් පමන මෙම කඩ කාමරය තිබෙන ස්ථානය වැසිකිලියක් ,කුඩු ගහන තැනක් වගේ පැවතුනා.ආසන්නයේ සිටින අයව දැනුවත් කලා.නමුත් ඉල්ලුවේ නැහැ. මෙම පුද්ගලයා ඉල්ලුවා.මෙම ස්ථානය තියෙන තත්වය බලන්න.අනිත් කාමරවල මුදලටයි තක්සේරු කරලා තියෙන්නේ.තාවකාලික බදු කඩයක්.මෙම ස්ථානය කවුරුත් අප්‍රිය කරන තැනක්.ඉල්ලු පුද්ගලයාට දුන්නාම එය ට විරුද්ධ වෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි මහතා -</u>**

වසර දෙකකට පෙර දුන්නේ නෑ.ඉල්ලීම් කලාට දුන්නේ නෑ.යෝජනා කලාට බැරි වුනා.කුරුවිට නගරය එක් කොටසකට පමනක් අයිති දෙයක් නොවන අතර පහල කුරුවිටටත් අවස්ථා ලබා දෙන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා -</u>**

සභාවේ ඉදිරිපත් කරන සියල්ල න්‍යාය පත්‍රයේ ඇතුලත් කල යුතුයි.මෙම ක්‍රමය වැරදි වන අතර මෙලෙස යෝජනා ඉදිරිපත් කල නොහැකියි.සම්මත වුවද ඒවා ක්‍රම වේදයට නොමැත.නමුත් ඒවා කඩිනමින් ක්‍රියාත්මකද වේ.නිසි ක්‍රම වේදයට ඉදිරිපත් කල යෝජනා පමනක් නීත්‍යානු කූල වේ.මින් ඉදිරියට හෝ  නිවැරදි වන්න.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල  මහතා :-</u>**

සභාවේ සම්මත වූ පසුව එය වැරදි බව ප්‍රකාශ කරනවා.ඒ සම්බන්ධ සියළු ආදායම් පාලක වාර්තා ජායාරූප ද  ඇත.  මෙය ක්‍රියාත්මක කිරිම වරදක් නම් මේ සම්බන්ධව ආපසු ක්‍රියාත්මක වන ආකාරයත් ප්‍රකාශ කල යුතුයි.ගියවර සභාවට ඉදිරිපත්කර සම්මත වූ යෝජනාව න්‍යාය පත්‍රයේ  නොතිබූ යෝජනාවක් නිසා මෙවර දැම්මේ.එය නිත්‍යානු කූල කිරිමටයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස්  මහතා</u>**

න්‍යාය පත්‍රයේ ඇතුලත් යෝජනා පමනක් නිත්‍යානු කූල වන අතර  යථා පරිදි කල්දී  ඇති යෝජනා හා හදිසි යෝජනා ක්‍රියාත්මක කල හැකියි.නමුත් වෙනත් කරුනු යටතේද  සදහන් කරන දේ  පිලිබඳව නීත්‍යානු කූල ව කටයුතු කරන්නබෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි  මහතා -</u>**

මෙම යෝජනාව සම්බන්ධයෙන් මා විරෝදතාවය දක්වන අතර බෙදීමක් ඉල්ලමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

කාලය නාස්ති විමක් සිදුවේ.නගරයේ කඩ පිලිබද කතා කරන විට ඒ සදහා අනුමැතිය දුන් අතර කුරුවිට නගරයේ හිස් ඉඩම් හෝ කඩ කාමර ඇත්නම් ඒවා සභාවට ආදායම් ලැබෙන ලෙස කටයුතු කිරීම වැදගත් වේ.මේ සම්බන්ධයෙන් ඉල්ලිම්  ගනනාවක් පැවති අතර නමුත් ක්‍රම වේදයක් තිබිය යුතුයි.ගරු සභාපතිතුමාට හා අනෙකුත් ගරු මන්ත්‍රි වරුන්ට යෝජනා ගෙන ආ හැකියි.අනෙක්වා ඉල්ලිම් ලිපි ලෙස ඉදිරිපත් කරන්න.යෝජනා උපරිම 3ක් ඉදිරිපත් කල හැකියි.කෙසේ වෙතත් මේ සම්බන්ධව නිශ්චිත තීන්දුවක් ගත යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

යෝජනා 3ක්ඉදිරිපත් කිරිම යන්න අපි විසින් හදාගත් ක්‍රම වේ.ඒවා පනතේ හෝ රීති වල නොමැත.පණත අනුව ඊට වැඩි ප්‍රමානයක් වුවත් පුළුවන්.

ගරු ප්‍රාසම අසංක දිල්ශාන් මහතා අවශ්‍ය තාවක් සදහා මහා සභාව දැනුවත් කර ප.ව. 12.05 ට සභා සර්හයෙන් ඉවත් වන ලදී.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

හිටපු උප සභාපති සිරිපාල මහතාගේ ඉල්ලීමට එකඟ වන අතර එතුමා මෙම සභාව නියෝජනය කරමින් හැකි උපරිමයෙන් ජනතාවට සේවය කල අයෙක්.දැන් ඉතාමත් අසරන තත්වයට පත්වු අවස්ථාවේ එතුමාගේ ඉල්ලීම ඉවත දමන්න බෑ.මේ කාරණය කතා කරලා එකගතාවයකට යමු.නීතියක් පවතින අතර යෝජනා ඉදිරිපත් කල හැක්කේ මහජන නියෝජිතයන්ට පමණයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා

මහජන නියෝජිතයන්ට හැර වෙනත් අයට යෝජනා ඉදිරිපත් කල නොහැක.ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන අනෙකුත් යෝජනා ලෙස දැමීමෙන් එම ගැටළුව නිරාකරනය වේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා -

ගරු සභාපතිතුමන් විසින් සංශෝධනයක් කර එසේ නිවැරදි කලා.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

සිරිපාල වීරසේකර මහතාගේද ඉදිරිපත් කර ඇත්තේ කඩයක් ඉල්ලීම පිලිබඳවයි.දෙකම ඉල්ලිම්.මේ ලිපි පිලිබඳව සභා තීරන ගත යුතු නිසා එ්වා මගේ යෝජනා ලෙස ඉදිරිපත් කලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි මහතා -

දේශපාලන සගයෙකුට කරන සහායක් ලෙස එම කඩය ලබාදීම සම්බන්ධයෙන් මා අදහස් දැක්වූවේ කඩය වෙන්දේසි කිරීමටත් එම මුදල අපි ගෙවිම සුදුසු බවත්ය.නොමැති නම් අපි ද අසරන වුවහොත් අපටත් මෙසේ කඩ වැනි දේ දීමට සිදු වෙවි. නරක පුර්වාදර්ශයක් වෙවි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

අප 45 දෙනා ගැන නොව අප කතා කලේ ගරු හිටපු උප සභාපති සිරිපාල වීරසේකර මහතා ගැනයි. එතුමා ඉතාමත් අසරන වෙලා.එතුමාට අපේ පස්සේ ඇවිත් ඉල්ලීම් කරන්න ඉඩ

තියන්න එපා.තනි තීරන ගන්න .ඒකමතික තීරන ගන්න.එතුමාට තාවකාලික කඩයක් දෙන්න.ජීවත්ව සිටින කාලෙයි උදව් කල යුත්තේ.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශානක දර්ශන මහතා -**</u>

සිරිපාල මහතාට එම කඩය දෙන්න.එසේම අර ඉතාමත් අශෝබන තත්වයේ ඇති ලයිට් කනුව අසල කඩයද එම ඉල්ලීම් කරන අයට දෙන්න.

<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි මහතා -**</u>

මා මෙම ස්ථානයෙන් එලියට යන විට සිරිපාල අප්පොට කඩය දෙනවට විරුද්ධ වූබවට ප්‍රචාරය වි තිබෙන්නටද හැකියාවක් ඇත.මා විරුද්ධ වීමක් නොව මෙය නරක පූර්වාදර්ශයක් වන බවයි සඳහන් කලේ.නමුත් සියළු දෙනා එකඟයිනම් මාද එකග වෙමි.
එතුමාට උදව් අවශ්‍ය නම් උදව් කල යුතුයි._**නමුත් අනෙක් කඩය පිලිබදව එසේ කල නොහැක.යම් ඉදිකිරිමක් එම ස්ථානයේ සිදු වේනම් ලබන මාසය වනතුරු නතර කරවන්න.**

<u>**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -**</u>

මීට
ලබන සභාවට කරුණු දක්වමි.
පෙර පදිංචියක් නැති අයට පවා දුන්නා.අධිහාර ආවේ නෑ.ටෙන්ඩර් නොකර දුන්නේ.අපි විරුද්ධ වුනා.සිරිපාල මහතාට කඩයක් දෙන්න.සංවර්ධන කටයුතු වලට ඒ ඉඩ අවශ්‍ය වුනොත් නැවත ගන්න.

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**</u>

මේ දෙකම ඉල්ලීම්.සභා තීන්දු ගෙන එම කඩය පිලිබදව ක්‍රියා කලේ.මේ පිලිබඳව බෙදීමක් විය යුතුද?
<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දීප්ති චන්දන විජේසිරි මහතා -**</u>
සිරිපාල මහතාගේ කඩය ගැන බෙදීමක් අවශ්‍ය නැත.
<u>**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා**</u>
එකම කාරණා පිලිබද දෙවිධිහකට ක්‍රියා කල නොහැක.
<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**</u>

**යෝජනා දෙකම කඩ පිලිබඳ ඉල්ලීම් වේ.මා මෙය මීට පෙරත් සඳහන් කලා. මේ කඩය පිලිබද කිප දෙනෙක් ඉල්ලීම් කලත් ඒ මීට වසර ගානකට පෙර.ඒ අවස්ථාවේ 4 ක් ඉල්ලීම් කලා.ඒ නිසා ටෙන්ඩර් කරමු කීවා.නමුත් එය ක්‍රියාත්මක වුනේ නෑ.මෙම ඉල්ලිම ගිය සභාවට**

**ඇවිත් තීන්දු ගෙන ක්‍රියා කලේ.නීත්‍යානුකූල කිරිමට සභාවට දැම්මේ.නමුත් මේ සම්බන්ධයෙන් ඇතිවූ තත්වය මත තව දුරටත් නීත්‍යානුකූලව සොයා බලා ඉදිරි සභාවට කරුණු ඉදිරිපත් කරන්නම්.ඒ අනුව අනුව කුරුවිට නගරයේ බස්නැවතුම්පලෙහි ඇති තාවකාලික කඩ කාමර වල ලයිට් කණුවට මැදිව පවතින කඩ කාමරය සාධාරණ මාසික කුලියක් යටතේ ලබා දෙන ලෙස සිනමාහල පාර ,එක්නැලිගොඩ. කුරුවිට එම්. අජිත් රුවන් කුමාර මයා විසින් ඉදිරිපත් කර ඉල්ලීම සම්බන්ධ යෝජනාව පිලිබඳව, තව දුරටත් එම කඩය සම්බන්ධ කටයුත්ත පිලිබඳව නීත්‍යානුකූලව** සොයා බලා ඉදිරි සභාවට කරුණු දැක්වීමට යෝජනා කරමි.එසේම සිරිපාල වීරසේකර මහතා විසින් සිදු කල කඩය ඉල්ලීම පිළිබද හා එම කටයුත්ත සම්බන්ධයෙන්ද ලබන සබාවට කරුනු දක්වමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා**

එම යෝජනාව ස්ථිර කරමි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්. ජයරත්න මහතා**

හැම මාසේම කඩ පිලිබද ගැටළු පවතී. තිබෙන සියළු හිස් කඩ සොයා බලා වෙන්දේසි කිරිම සුදුසු වේ.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

වෙනත් හිස් කඩ නොමැති අතර මෙම කඩ පිලිබද තව දුරටත් **නීත්‍යානුකූලව** සොයා බලා ඉදිරි සභාවට කරුණු දක්වමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට නගරයේ බස්නැවතුම්පලෙහි ඇති තාවකාලික කඩ කාමර වල ලයිට් කණුවට මැදිව පවතින කඩ කාමරය සාධාරණ මාසික කුලියක් යටතේ ලබා දෙන ලෙස සිනමාහල පාර ,එක්නැලිගොඩ. කුරුවිට එම්. අජිත් රුවන් කුමාර මයා විසින් ඉදිරිපත් කර ඉල්ලීම සම්බන්ධ යෝජනාව පිලිබඳව, තව දුරටත් එම කඩය සම්බන්ධ කටයුත්ත පිලිබඳව නීත්‍යානුකූලව** සොයා බලා ඉදිරි සභාවට කරුණු දැක්වීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-18 හි උද්‍ධෘතය**

**05- 18 යෝජිත කුරුවිට ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ප්‍රවේශ මාර්ගය පුළුල් කර හැරීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

යෝජිත කුරුවිට ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ප්‍රවේශ මාර්ගය පුළුල් කර හැරීම සම්බන්ධව රත්නපුර ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි විසින් මගින් ලිපියක් යොමු කර ඇති අතර ඒ අනුව කුරුවිට හා තදාසන්න ප්‍රදේශවල පානීය ජල ගැටළුවට විසඳුමක් ලෙස උක්ත ව්‍යාපාතිය ක්‍රියාත්මක කිරිමට පියවර ගත් බවත් ඒ සඳහා පුද්ගලික අයිතිකරුවන් තිදෙනෙකු සතු කුරුවිට නගරයට ආසන්න කුරුවිට ග්‍රාම නිලධාරි වසමට අයත් ගුරුබැල්කඩහේන ඉඩම හඳුනාගෙන ඇති බවත් ඒ සඳහා අඩි 20 පමන පලල ප්‍රවේශ මාර්ගයක් අවශ්‍ය බවත් දැනට ඇත්තේ අඩි 12 ක මාර්ගයක් බවත් ඒනිසා නාලන්ද එල්ලාවල මාර්ගයෙන් ආරම්භ වී ප්‍රජා ජල ටැංකිය දක්වා දිවෙන කුරුවිට පොදු සුසාන භූමි මාර්ගය අඩි 20 කට පලල් කිරිමට සහ සුසාන භූමියේ පවතින අධික වංගුව සහිත කොටස නිසා ප්‍රවාහන කටයුතු කිරීමේදි දැඩි අපහසු නිසා එම වංගු සහිත කොටස ඉවත්කර වංගුව නැතිව සුසාන භූමිය හරහා දැනට හඳුනාගෙන ඇති යෝජිත අත්පත් කරගත යුතු මාර්ගය දක්වා පුළුල් කිරිම ත් නාලන්ද එල්ලාවල මාවතේ පවතින පටු වංගු සහිත කොටස පුළුල් කිරිම කල යුතු බවත් ඒ සඳහා අවසරය හා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසත් ඉල්ලා ඇත.මාර්ගයේ දල සැලැස්ම ද ඉදිරිපත් කර ඇත.සභා තීරනයක් ගැනීමට ඉදිරිපත් කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා</u>

මෙම ප්‍රෙද්ශයට ඇති එකම පොදු සුසාන භූමිය මෙයයි.අපේ ජල ටැංකියට යන පාරේ යෝජිත ජල ටැංකියට අඩි 100 පමන දුර යායුතුයි.දැනට අඩි 10 පාර කුඩා නගර ජල ව්‍යාපෘතියට යන පාර.සුසාන භූමියත් අපේ.ජල ටැංකියත් අපේ.අනෙක් එකත් අපේ.නමුත් පාර පලල් වෙන කොට අඩි 20 ක් සුසාන භූමිය හරියත් අහු වෙනවා.මේ හරියෙත් වලදාපු මිනී තියෙනවා.ඒවා උඩින් තමා පාර කපන්න වෙන්නේ.නමුත් මේ මිහිදන් අයගේ ගෞරවයත් පාරත් දෙකම කෙරෙන්න ඕනි.මරණාදාර සමිති පහ එක්ක කතා කරමු.මහිදන් අයගේ පවුලේ අය එක්කත් කතා කරලා ඒවා වෙනත් තැනක මිහිදන් කරලා ගෞරව වෙන පරිදි කටයුතු කරන්නත් පුළුවන්.
නැත්නම් ඉඩම ගත්තෙ සල්ලි වලට නිසා ඒකට පාර ඕනි.එහෙම පාර ගන්නත් පුළුවන් වෙයි.
ගැටුම් නැතිව සාකච්ජා කරලා මේ කටයුතු කරමු.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ප්‍රෙද්ශයේ ස්වේච්ඡා සංවිධාන සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු කරමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

මිහිදන් වී ඇති අයගේ අයිතින් සම්බන්ධව එම ගෞරවය රැකෙන පරිදි අදාල නීති රීති අතුරු ව්‍යවස්ථා ආදිය අනුව කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩිලාන් රණසිංහ මහතා

මෙම කටයුත්ත මගේ භාරයේ පවතින්නේ.ජල සම්බන්ධතා 24000 පමන සම්බන්දයි මේ කටයුත්තට.පුද්ගලික ඉඩම් හිමියන්ගෙන් පවරා ගන්න කැබිනට් පත්‍රිකා අනුමත කරලා.වෙන මේ සථානයට ඇතුලු වෙන්න ස්ථාන නැහැ.තද බැවුමක්.පවුල් 24000 කට ජලය දෙන්න තියෙනවා.විශාල වාහන යන්න ඕනි මෙම ස්ථානයට.මාර්ගයට අඩි 8ක් දෙපැත්තෙන් බද්ධ උනොත් ඇති.කල් නොයවා දුන්නොත් ලබන 5 මාසය වන විට පරකඩුව ගිනි දමන දක්වා වතුර දෙන්න පුළුවන්. අවුරුදු දෙක හමාරක් ඇතුලත ජනතා අයිතියට දෙන්න සියළු කටයුතු සැලසුම් කරලා තියෙන්නේ.වෙන විකල්ප නැති නිසයි මේ මාර්ගය ඉල්ලන්නේ.විශාල ජනතා මෙහෙවරක් සඳහා.මෙම කටයුත්ත කඩිනම් කරනන.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**ඒ අනුව යෝජිත කුරුවිට ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ප්‍රවේශ මාර්ගය පුළුල් කර හැරීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන සමග සාකච්ඡා කර නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා
එම යෝජනාව ස්ථිර කරමි

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව යෝජිත කුරුවිට ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ප්‍රවේශ මාර්ගය පුළුල් කර හැරීම සම්බන්ධව ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන සමග සාකච්ඡා කර නීත්‍යානුකූලව ඉදිරි කටයුතු කිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-18 හි සත්‍ය උද්ධෘතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05- 19 කුරුවිට පොළහූමිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති යෝජනාව**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය ,සාමාන්‍යාධිකාරි මගින් මෙම සභාව වෙත ලිපියක් යොමු කර ඇති අතර ඒ අනුව කුරුවිට පොළහූමිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් රත්නපුර පොදු ජන පෙරමුන දිස්ත්‍රික් සංවිධායක හිටපු පලාත් සභා අමාත්‍ය රංජිත් බණ්ඩාර මහතාගේ ප්‍රධානත්වයෙන් කුරුවිට නගර නිර්මාණය පිලිබද පැවති සාකච්ජාවෙදී පොල භූමිය සංවර්දනය කිරිම සදහා කුරුවිට සමුපකාර සමිතිය හා කුරුවිට ප්‍රාදේශීය සභාව එක්ව ගිවිසුම්ගතව ගොඩනැගිල්ලක් ඉදි කිරිමට උපදෙස් හා එකගතාවන් දීම පිලිබද සභාවට ස්තුතිය පිරිනමා ඇත. එසේම කුරුවිට ප්‍රාදේශිය සභාව හා කුරුවිට විවිධ සේවා සමුපකාර සමිති ය එක්ව ගිවිසුම්ගතව නාගරික සංවර්ධන අධිකාරියේ උපදෙස්හා සැලසුම් අනුව පොල භූමියේ ගොඩනැගිල්ලක් ඉදි කිරිමටත් එහි බිම් මහල කුරුවිට පොල සඳහා වෙන්කරදිම ටත් දෙවන මහල රථවාහන අංගනයක් සඳහා වෙන් කිරිමටත් එහි තෙවන මහල හා සිව්වන මහල කෝප් සිටි ය,ෂොපින් සෙන්ටර් එකක් හා රෙස්ටුරන්ට් එකක් සැලසුම් කිරිම සම්බන්ධවත්**

**මේ සඳහා ඉඩම සභාවෙන් ලබා දීම හා ඉදිකිරීම් පිරිවැය සීමාසහිත කුරුවිට විවිධ සේවා සමුපකාර සමිතිය මගින් දැරිම ආදී කරුණු සාකච්ජා කිරිම සඳහා මූලික සාකච්ජාවකට දිනයක් ලබා දෙන ලෙස 2021.12.10 දිනැති ලිපියෙන් ඉල්ලා ඇත.**

**ඒ අනුව කුරුවිට පොළහූමිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කුරුවිට ප්‍රාදේශිය සභාව හා කුරුවිට විවිධ සේවා සමුපකාර සමිති ය එක්ව සාකච්ජාවක් කඩිනමින් පැවැත්විමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා
එම යෝජනාව ස්ථිර කරමි

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව**

**කුරුවිට පොළහූමිය සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් කුරුවිට ප්‍රාදේශිය සභාව හා කුරුවිට විවිධ සේවා සමුපකාර සමිති ය එක්ව සාකච්ජාවක් කඩිනමින් පැවැත්විමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

<u>**2022.01.18** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05- 20** උද්‍ධතය</u>

**05-20** කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැලි කසල ඉවත් කිරීම හා පාලනය කිරීම පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම ( **2022** වර්ෂය) සඳහා රජය මගින් පල කරනු ලබන ගැසට් පත්‍රයේ පලකිරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**2008** වර්ෂයේ මාර්තු **08** දිනැති අති විශේෂ ගැසට්පත්‍ර අංක **1541/11** හි පල කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවඅනුව උක්ත කරුනට සම්බන්ධව පහත විස්තර **2022** වර්ෂයට ගැසට් පත්‍රයේ පල කිරිමට යෝජනා කරමි.

**1.**කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශයේ බැහැර කරනු ලැබූ අපද්‍රව්‍ය ප්‍රමාණය ඝන අඩි **65-125** දක්වාවූ ප්‍රමාණයට ඉවත් කර බැහැර කිරීම වෙනුවෙන්
එක් වරකට කි.මි **02** ක් දුර ඇතුලත ප්‍රවාහනය සඳහා ගාස්තුව -රු.**1000.00**

කි.මි.**02-05** ඇතුලත ප්‍රවාහනය - රු.**15000.00**
කි.මි.**06** හෝ ඊට වැඩි ඇතුලත ප්‍රවාහනය -රු. **2000.00**

ඉහත පරිදි ගාස්තු අය කිරිමට හා කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් කලින් කලට නියමු කරනු ලබන ගාස්තු සංශෝධනයන්ට යටත් වන අතර මෙම ගාස්තුවට අමතරව රජය විසින් කලින් කලට පනවනු ලබන බදු හා ගාස්තුද එකතු කර අය කරනු ලැබේ. මෙම අතුරු ව්‍යවස්ථාවේ සදහන් කිසියම් අතුරු ව්‍යවස්තාවක් උල්ලංගනය කිරිම හේතු කොටගෙන නිසි ලබයක් ඇති අධිකරනයකින් වරදකරු කරනු ලැබූ විට රු.**750.00** ක ට වැඩි නොවැඩි දඩයක්ද එම වරද දිගින් දිගටම කරගෙන යනු ලබයි නම් එම වරද කරගෙන යන සෑම දිනයක් සඳහාම රු.**250.00** ක දඩයකටද යටත් විය යුතුය.
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>
එම යෝජනාව ස්ථිර කරමි
ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව
කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කැලි කසල ඉවත් කිරීම හා පාලනය කිරීම පිළිබඳව මහ ජනතාව දැනුවත් කිරීම සම්බන්ධව ඉහත විස්තර පරිදි ( **2022** වර්ෂය) සඳහා රජය මගින් පල කරනු ලබන ගැසට් පත්‍රයේ පලකිරීමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

**2022.01.18** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-20** හි සත්‍ය උද්‍ධතයක් බව සහතික කරමි.

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

**05-21 කුරුවිට ප්‍රාදේශීය සභාවේ PF 7449 අංක දරණ කැබ් රථයේ අලුත්වැඩියාව සම්බන්ධ යෝජනාව .**

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ PF 7449 අංක දරණ කැබ් රථයේ අලුත්වැඩියා කටයුතු කිරිමට සිදු වුනා.එය ධාවනය කිරිමට නොහැකි අතර ස්ටීරිංවීල් ඇතුළු කොටස් කීපයක් දැමීමත් සිදු කලා.**

මෙය කාර්මික කමිටුවට ඉදිරිපත් කර ඇති අතර වාහනයේ සේවා ආයතනයෙන්ම සේවා සිදු කර ඇත. මහා සභාවේ ආවරන අනුමැතියට යටත්ව මෙම වාහනය සේවා කල යුනයිටඩ් මෝටර්ස් ලංකා වෙත රු.470554.46 ක මුදලක් මහා සභාවේ ආවරන අනුමැතියට යටත්ව ගෙවීම් කල අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා දීමට යෝජනා කරමි.අදාල සියළු තොරතුරු ඉදිරිපත් කර ඇත.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා</u>**
එම යෝජනාව ස්ථිර කරමි
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

වාහන භාවිතා කිරීමේදි රියදුරු එය මනා නඩත්තුවක් යටතේ පවත්වාගත යුතුයි.ධාවනයට පෙර වාහනය සම්බන්ධව පරික්ෂා කල යුතුයි.නිසි නඩත්තුවක් නොමැති කම නිසා වාහනවලට බොහෝ විට විශාල වියදම් දැරිමට සිදුවේ. ඔයිල් නැති හේතුව මතත් අක්‍රිය වේ. වාහනයේ .ගලවා ඉවත්කල පරන කැලි වෙන්දේසියට තබන්න.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව**
**කුරුවිට ප්‍රාදේශීය සභාවේ PF 7449 අංක දරණ කැබ් රථයේ අලුත්වැඩියා කටයුතු කිරිමවෙනුවෙන්** මෙම වාහනය සේවා කල යුනයිටඩ් මෝටර්ස් ලංකා ආයතනය වෙත රු.470554.46 ක මුදලක් මහා සභාවේ ආවරන අනුමැතියට යටත්ව ගෙවීම් කල අතර ඒ සඳහා මහා සභා අනුමැතිය ලබා දීමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05- 22 උද්‍ධෘතය**

**05-22 කුරුවිට ප්‍රාදේශීය සභාවේ වරිපනම් විරෝධතා කැදවීමෙන් පසු විරෝධතාව දැක්වූ විරෝධකරුවන් සදහා තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇති තීරණ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති යෝජනාව**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ වරිපනම් විරෝධතා 2021.10.21 හා 2021.10.22 දෙදින කැඳවූ අතර විරෝධතා දැක්වීමට ඉදිරිපත්වූ සියළු විරෝධකරුවන් සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව මගින් පහත සඳහන් තීරන දන්වා එවා ඇත. ඒ අනුව වරිපනම් ඒකක 06 ක් සංශෝධනය නොකිරීමටත් , වරිපනම් ඒකක 03 ක් වරිපනම් අංක ඒකාබද්ද කිරිම ටත් , ඒකක 04 ක වාර්ෂික වටිනාකම් සංශෝධනය කිරිමටත් ඒකක 06 ක් දේපල ලැයිස්තුවෙන් ඉවත් කිරිටමටත් ලෙස තීරන එවා ඇත.වෙන වෙනම ගත් තීරන විස්තරාත්මකව පහත පරිදි වේ.**

<table>
<tr><th>අනු අංකය</th><th>විරෝධතා පරීක්ෂණ අංකය</th><th>වරිපනම් අංකය</th><th>පාර</th><th>පවතින වාර්ෂික වටිනාකම (රු.)</th><th>තීරණය</th></tr>
<tr><td>1.</td><td>01</td><td>1305</td><td>රත්නපුර පාර</td><td>2,778,516.00</td><td>වාර්ෂික වටිනාකම රු.2,500,664/= ලෙස සංශෝධනය කරන ලදී</td></tr>
<tr><td>2.</td><td>03</td><td>09</td><td>රත්නපුර පාර</td><td>500/=</td><td>සංශෝධනයක් නොකරන ලදී</td></tr>
<tr><td>3.</td><td>04</td><td>590/9</td><td>රත්නපුර පාර</td><td>4811/=</td><td>පහත පරිදි සංශෝධනය කරන ලදී
<table>
<tr><th>අභාවිත අංකය</th><th>නව අංකය</th><th>පාර</th><th>දේපල විස්තර</th><th>වාර්ෂික වටිනාකම</th></tr>
<tr><td>560/9<br>599/10</td><td>590/10</td><td>රත්නපුර පාර</td><td>ඇස්බැස්ටස් වහල සහිත නිවස</td><td>34,642</td></tr>
</table></td></tr>
<tr><td>4.</td><td>06</td><td>874/13</td><td>රත්නපුර පාර</td><td>6,786 /=</td><td>දේපල ලැයිස්තුවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී</td></tr>
<tr><td>5.</td><td>07</td><td>43/7</td><td>ඉසුරු පෙදෙස</td><td>96,226/=</td><td>වාර්ෂික වටිනාකම රු.86,603/= ලෙස සංශෝධනය කරන ලදී</td></tr>
<tr><td>6.</td><td>09</td><td>830</td><td>රත්නපුර පාර</td><td>50,038</td><td>වාර්ෂික වටිනාකම රු.6,736/= ලෙස සංශෝධනය කරන ලදී</td></tr>
<tr><td>7.</td><td>11</td><td>1881<br>1881/2<br>1881/17<br>1881/20</td><td>රත්නපුර පාර</td><td>500/=<br>5,774/=<br>1,925/=<br>18,283/=</td><td>සංශෝධනය නොකරන ලදී</td></tr>
<tr><td>8.</td><td>14</td><td>08</td><td>දෙමැද පාර</td><td>48,113/=</td><td>දේපල ලැයිස්තුවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී</td></tr>
<tr><td>9.</td><td>13</td><td>484/13</td><td>රත්නපුර පාර</td><td>13,472/=</td><td>පහත පරිදි සංශෝධනය කරන ලදී
<table>
<tr><th>අභාවිත අංකය</th><th>නව අංකය</th><th>පාර</th><th>දේපල විස්තර</th><th>වාර්ෂික වටිනාකම</th></tr>
<tr><td>484/14<br>484/13</td><td>484/14</td><td>රත්නපුර පාර</td><td>කොන්ක්රීට් වහල සහිත සිල්ලර කඩය</td><td>52,924/=</td></tr>
</table></td></tr>
<tr><td>10.</td><td>15</td><td>655</td><td>රත්නපුර පාර</td><td>4,811/=</td><td>සංශෝධනය නොකරන ලදී</td></tr>
<tr><td>11.</td><td>16</td><td>659</td><td>රත්නපුර පාර</td><td>25,396/=</td><td>වාර්ෂික වටිනාකම රු.15,396/= ලෙස සංශෝධනය කරන ලදී</td></tr>
<tr><td>12.</td><td>20</td><td>816/3</td><td>රත්නපුර පාර</td><td>15,396/=</td><td>සංශෝධනය නොකරන ලදී</td></tr>
<tr><td>13.</td><td>21</td><td>578</td><td>රත්නපුර පාර</td><td>22,132/=</td><td>පහත පරිදි සංශෝධනය කරන ලදී
<table>
<tr><th>අභාවිත අංකය</th><th>නව අංකය</th><th>පාර</th><th>දේපල විස්තර</th><th>වාර්ෂික වටිනාකම</th></tr>
</table></td></tr>
</table>

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 576 [Bracket]<br>578 | 576 | රත්නපුර පාර | ඇස්බැස්ටස් වහල සහිත නිවස | 22,132/= |
| 14. | 25<br>26 | 252<br>254 | රත්නපුර පාර | 500/=<br>21,170/= | සංශෝධනය නොකරන ලදී | | | | |
| 15. | 27 | 948/5 | රත්නපුර පාර | 16,258/= | දේපල ලැයිස්තුවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී | | | | |
| 16. | 28 | 1859/25 | රත්නපුර පාර | 53,887/= | දේපල ලැයිස්තුවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී | | | | |
| 17. | 29 | 1859/22 | රත්නපුර පාර | 21,170/= | සංශෝධනය නොකරන ලදී | | | | |
| 18. | 31 | 1108/19 | රත්නපුර පාර | 7,692/= | දේපල ලැයිස්තුවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී | | | | |
| 19. | 32 | 1859/29 | රත්නපුර පාර | 32,755/= | දේපල ලැයිස්තුවෙන් ඉවත් කිරීමට තීරණය කරන ලදී | | | | |

**ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2021 වරිපනම් විරෝධතා කැඳවීමෙන් පසු විරෝධතාව දැක්වූ විරෝධකරුවන් සඳහා ඉහත පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇති තීරණ ක්‍රියාත්මක කිරිමට මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ 2021 වරිපනම් විරෝධතා කැඳවීමෙන් පසු විරෝධතාව දැක්වූ විරෝධකරුවන් සඳහා ඉහත පරිදි තක්සේරු දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇති තීරණ ක්‍රියාත්මක කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

**2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-22 හි සත්‍ය උද්ධෘතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශීය සභාව,**
**කුරුවිට.**

**05-23 2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ විගණන හා කළමණාකරන කමිටු පිහිටුවීම සඳහා නිලධාරීන් පත් කිරීම සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ විගණන හා කළමණාකරන කමිටු පිහිටුවීම සඳහා නිලධාරීන් පත් කිරීමට අවශ්‍ය වන අතර පහත පරිදි විගනන නිලධාරීන් පත් කිරිමටත් එම කමිටුව පවත්වන දිනයන් අනුමත කිරිමටත් යෝජනා කරමි.ඒ අනුව කමිටු නිලධාරීන් ලෙස ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා,ලේකම් එස්.එච්.ආර්. වීරක්කොඩි මිය,ගිණුම් නිලධාරී නිසංසලා හිටිහාමු මිය,විෂය නිලධාරී ජේ.කේ.ආර්.මල්කාන්ති මිය,අංශ ප්‍රධානීන් ලෙස එම්.ඒ.ටී ශිරන්ති මිය,මොනාලි ජයරත්න මෙය,කේ.බී.පත්මිණී මිය පත් කිරිමටත් මෙම කමිටුවේ 1 කාර්තුව කමිටුව 2022.03.24 බ්‍රහස්පතින්දා දිනද 2 කාර්තුව කමිටුව 2022.06.23 බ්‍රහස්පතින්දා දිනද 3 කාර්තුව කමිටුව 2022.09.22 බ්‍රහස්පතින්දා දිනද 4 කාර්තුව කමිටුව 2022.12.22 බ්‍රහස්පතින්දා දිනද පැවැත්විමට ද යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

විගනන වාර්තා සභාවට දමන්න.විගනන කටයුතු පිලිබඳ දැනුමක් ඇති අය එම කමිටු වට දමන්න.විවිධ විෂයන් කල අය නොව ඊට අදාල විෂය දැනුමැති අය දමන්න.විෂය බෙදීමේදී වුව අදාල විෂයන්ට ගැලපෙන පරිදි විෂය දෙන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

අදාල දැනුම ඇති අය පත්කර ඇත.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව 2022 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ විගණන හා කළමණාකරන කමිටු පිහිටුවීම සඳහා නිලධාරීන් ලෙස ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා,ලේකම් එස්.එච්.ආර්. වීරක්කොඩි මිය,ගිණුම් නිලධාරී නිසංසලා හිටිහාමු මිය,විෂය නිලධාරී ජේ.කේ.ආර්.මල්කාන්ති මිය,අංශ ප්‍රධානීන් ලෙස එම්.ඒ.ටී ශිරන්ති මිය,මොනාලි ජයරත්න මෙය,කේ.බී.පත්මිණී මිය පත් කිරිමටත් එම කමිටුව පැවැත්වෙන දිනයන් ලෙස කමිටුවේ 1 කාර්තුව කමිටුව**

**2022.03.24 බ්‍රහස්පතින්දා දිනද 2 කාර්තුව කමිටුව 2022.06.23 බ්‍රහස්පතින්දා දිනද 3 කාර්තුව කමිටුව 2022.09.22 බ්‍රහස්පතින්දා දිනද 4 කාර්තුව කමිටුව 2022.12.22 බ්‍රහස්පතින්දා දිනද පැවැත්විමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

## 2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-24 හි උද්ධෘතය

**05-24 කුරුවිට ප්‍රාදේශීය සභා ලේඛනාගාරයේ ඇති පැරණි ලේඛණ හා ලිපිගොනු අපහරණය කිරීමට අනුමැතිය ලබා ගැනීම සම්බන්ධ යෝජනාව.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කුරුවිට ප්‍රාදේශීය සභා ලේඛනාගාරයේ ඇති ඇතැම් පැරණි ලේඛණ හා ලිපිගොනු විනාශ වීමේ තර්ජනයකට ලක්ව ඇති අතර එකි ලේඛණ ලේඛනාගාරයේ තිබිම හේතුවෙන් අනෙකුත් ලේඛන වලටද හානිදායක තත්වයක් උදාවිය හැකි වේ. මේ සම්බන්ධයෙන් සොයා බලා අදාල චක්‍රලේඛ අනුව අනවශ්‍ය ලේඛණ පමනක් අපහරණය කිරීම සඳහා පහත පරිදි කමිටුවක් පත්කර තීරන ගෙන ක්‍රියාත්මක කිරිමට යෝජනා කරමි.සාමාජිකයන් ලෙස ගරු සභාපතිතුමා, ලේකම් තුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී දයා කස්තුරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ප්‍රේමා ගම්ලත් මිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී මිය ,ගරු ජීවන් රණතුංග මහතා , ගරු විකසිත පුෂ්ප සූරිය මහතා , ගරු ඩිලාන් රණසිංහ මහතා පත් කිරිමට යෝජනා කරමි.මෙම කමිටු වාර්තාව ඉදිරි මහා සභාවට යොමු කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

**එම යෝජනාව ස්ථිර කරමි.ඔප්පු වැනි වැදගත් ලියකියවිලි විනාශ නොකල යුතුය.නවීන තාක්ෂනය භාවිතයෙන්වැදගත් ලියවිලි ආරක්ෂා කල හැකි වේ.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා ලේඛනාගාරයේ ඇති ඇතැම් පැරණි ලේඛණ හා ලිපිගොනු විනාශ වීමේ තර්ජනයකට ලක්ව ඇති අතර එකී ලේඛණ ලේඛනාගාරයේ තිබිම හේතුවෙන් අනෙකුත් ලේඛන වලටද හානිදායක තත්වයක් උදාවිය හැකි බැවින් , මේ සම්බන්ධයෙන් සොයා බලා අදාල චක්‍රලේඛ අනුව අනවශ්‍ය ලේඛණ පමනක් අපහරණය කිරීම ට කමිටුවක් පත් කර තීරන ගෙන ක්‍රියාත්මක කිරිමටත් ඒ සදහා ලෙස ගරු සභාපතිතුමා,ලේකම් තුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනවර්ධන මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිම යුරේශ් මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී දයා කස්තුරි මිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී ප්‍රේමා ගම්ලත් මිය , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීණී නයනා ජීවනී මිය ගරු ජීවන් රණතුංග මහතා , ගරු විකසිත පුෂ්ප සූරිය මහතා , ගරු ඩිලාන් රණසිංහ මහතා පත් කිරිමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

**2022.01.18** දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක **05-24** හි සත්‍ය උද්‍ධෘතයක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

**05- 25** මිහිඳු මාවත දෙල්ගමුව පදිංචි බී.සුනිල් මයාගේ නිවස අවට වැසිජලය බැසයාමට ඇති වැසිජලකාණුව අවහිර කර ඉදිකර ඇති තාප්පයේ අදාල කොටස ඉවත් කිරිම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

මිහිඳු මාවත දෙල්ගමුව පදිංචි බී.සුනිල් මයා විසින් මිහිඳු මාවතේ ජලය ගලා යන වැසි ජල කානුව ජී. පියදාස ඉඩම හරහා ගලා යන බවත් තම ඉඩමේ වැසි ජලය එම කානුවට ගලා යාම අවහිර කර ජී.පියදාස මහා බැම්මක් බැඳ ඇති බවත් එම අවහිරතාවය ඉවත් කර දෙන ලෙසත් **2021.05.04** දිනැති ලිපියෙන් ඉල්ලිමක් කර ඇත. ඒ අනුව සභාවේකාර්මික නිලධාරී විසින් පරීක්ෂනයක් ද කර ඇති අතර කාර්මික නිලධාරී උපදෙස් අනුගමනය කර නොමැතිව බැම්ම බැඳ ඇති බවත් වාර්තා කර ඇත. මේ සම්බන්ධයෙන් **2021.05.10** දින දෙපාර්ශවය ගෙන්වා සාකච්ජාවක් පැවැත්වූ අතර එහිදීද කාර්මික නිලධාරි උපදෙස් අනුව බැම්මේ අඩි **1** ක

**විශ්කම්භය සහිත සිදුරක් තබන ලෙස උපදෙස් දී ඇත.කෙසේ වුවද ජී. පියදාස මහතා විසින් එම උපදෙස් අනුව කටයුතු කර නොමැති බව දැනුම් දී ඇත.ජලය නොබසින ඉඩමේ ජලය එකතු වි නිවසේ පිටුපස කොටස ජලයෙන් යට වන බවත් කාර්මික නිලධාරි වාර්තා කර ඇත.**

**මේ සම්බන්ධයෙන් සහා නීතිඥ** ටි.එම්. ජනක සුමේධ මහතාගෙන්ද **නීති උපදෙස් ද ලබා ගත් අතර උපදෙස වූයේ ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙසයි. ඒ අනුව මිහිඳු මාවත දෙල්ගමුව ජී.පියදාස මහතා වෙත බී.සුනිල් මහතාගේ ඉඩමේ රැස්වෙන ජලය ගලා යා නොහැකි පරිදි වැසි ජල කානුව අවහිර කර ජී.පියදාස මහතා විසින් බැඳ ඇති බැම්මේ අඩි 1 ක විශ්කම්භයෙන් යුතු සිදුරක් සකස් කර එකතු වෙන වැසි ජලය බැස්සවීම සඳහා කටයුතු කරන ලෙස ලිපියක් මගින් දැනුම් දීමටත් එය ලිපිය ලැබී දින 07 ක් ඇතුලත සිදුකල යුතු බවත් එසේ නොවන්නේ නම් අප සභාව මගින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන බව දැනුම් දීමටත් යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව මිහිඳු මාවත දෙල්ගමුව පදිංචි බී.සුනිල් මයාගේ නිවස අවට වැසිජලය බැසයාමට ඇති වැසිජලකාණුව අවහිර කර ඉදිකර ඇති තාප්පය සම්බන්ධයෙන්, මිහිඳු මාවත දෙල්ගමුව ජී.පියදාස මහතා වෙත බී.සුනිල් මහතාගේ ඉඩමේ රැස්වෙන ජලය ගලා යා නොහැකි පරිදි වැසි ජල කානුව අවහිර කර ජී.පියදාස මහතා විසින් බැඳ ඇති බැම්මේ අඩි 1 ක විශ්කම්භයෙන් යුතු සිදුරක් සකස් කර එකතු වෙන වැසි ජලය බැස්සවීම සඳහා කටයුතු කරන ලෙස ලිපියක් මගින් දැනුම් දීමටත් එය ලිපිය ලැබී දින 07 ක් ඇතුලත සිදුකල යුතු බවත් එසේ නොවන්නේ නම් අප සභාව මගින් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන බව දැනුම් දීමටත් ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05- 26 තෙප්පනාව මැදගම පාන් බේකරිය හරහා පිහිටා ඇති කාණු පද්ධතිය යලි සැකසීම සඳහා නීති ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධ යෝජනාව.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

තෙප්පනාව මැදගම පාන් බේකරිය හරහා පිහිටා ඇති කාණු පද්ධතිය ජී.වී.සමන්ත ලාල් ගුණරත්න යන අය විසින් පස් දමා පුරවා අවහිර කර ඇත.ඒ හේතුවෙන් වැසි දිනවලදී ජලය රැස් වී මාර්ගය ජලයෙන් යටවී ගම් වාසීන් දැඩි අපහසුතාවයට පත්වේ.මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තාද ලබා ගෙන ඇත.මේ සම්බන්ධයෙන් සභා නීතිඥ ටි.එම්. ජනක සුමේධ මහතාගෙන්ද උපදෙස් ලබා ගත් අතර ඔහුගේ උපදෙස වූයේ ප්‍රාදේශීය සභා පනතේ 81 වගන්තිය අනුව ක්‍රියා කිරිමයි.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

ඒ අනුව තෙප්පනාව මැදගම පාන් බේකරිය හරහා පිහිටා ඇති කාණු පද්ධතිය යලි සැකසීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 81 වගන්තිය අනුව ක්‍රියා කිරිමට යෝජනා කරමි.
**<u>ප්‍රාදේශීය සභා ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>**
එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**

එම පුද්ගලයා ප්‍රකාශ කරන්නේ එම අයට අසාධාරනයක් වූ බවයි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** තෙප්පනාව මැදගම පත්බේරිය හරහා පිහිටා ඇති කාණු පද්ධතිය යලි සැකසීම සඳහා සභා පනතේ 81 වගන්තිය අනුව ක්‍රියා කිරිමට ඒකමතිකව **මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

05- 27 වටප්පිටිය වොලිබෝල් ක්‍රිඩා පිටිය අසලින් යන මාර්ගය අවහිර වන අයුරින් ඉදිකර ඇති බැම්ම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනිම සම්බන්ධ යෝජනාව.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

වටප්පිටිය වොලිබෝල් ක්‍රිඩා පිටිය අසලින් යන මාර්ගය අවහිර වන අයුරින් ඉදිකර ඇති බැම්ම සඳහා නීතිමය ක්‍රියාමාර්ග ගැනිමට අවශ්‍ය වී ඇත.බී.ඒ.ආර්.බලනායක මහතා විසින් මෙම මාර්ගය අවහිර වන පරිදි බැඳ ඇති බැම්ම අනවසර ඉදිකිරිමක් බව කාර්මික නිලධාරි විසින් වාර්තා කර ඇත.මේ සම්බන්ධයෙන් **සභා නීතිඥ** ටි.එම්. ජනක සුමේධ මහතාගෙන්ද **නීති උපදෙස් ද ලබා ගත් අතර උපදෙස වූයේ ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙසයි.** ඒ අනුව වටප්පිටිය වොලිබෝල් ක්‍රිඩා පිටිය අසලින් යන මාර්ගය අවහිර වන අයුරින් ඉදිකර ඇති බැම්ම අවහිරතාවය ඉවත් කිරිම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය අනුව ක්‍රියා කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** බී.ඒ.ආර්.බලනායක මහතා විසින් වටප්පිටිය වොලිබෝල් ක්‍රිඩා පිටිය අසලින් යන මාර්ගය

අවහිර වන අයුරින් ඉදිකර ඇති බැම්ම අවහිරතාවය ඉවත් කිරිම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 52 වගන්තිය අනුව ක්‍රියා කිරිමට ඒකමතිකව **මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05- 28 පිච්චමල් ලන්ද ග්‍රාමයේ ජල කාණු පද්ධතිය අවහිර කිරිම සම්බන්ධ නීති ක්‍රියාමාර්ග ගැනිම සම්බන්ධ යෝජනාව.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

පරකඩුව, පිච්චමල්ලන්ද ග්‍රාමයේ ජල කාණු පද්ධතිය අවහිර කිරිම සම්බන්ධ ගැටළුව පිලිබඳ කාර්මික නිලධාරි වාර්තා ලබාගෙන ඇත. ඒ අනුව බි.ජී.වික්ටර් අමරදාස මයා හා සී. රණසිංහ මිය විසින් ඔවුන්ට අයත් ඉඩමක් අනවසරයෙන් කට්ටිකර විකුණා ඇති අතර එසේ විකිණීමේදී ජලය ගමන් කිරිම සඳහා යොදා ඇති කොන්ක්‍රීටය පහත්කර සකස්කරන ලද කුඩා කාණුව ඉඩම් කට්ටි කිරිමේදි මාර්ගයක් ලෙස භාවිතයට ගෙන ඇත.

මේ නිසා ජලය එක්රැස්වි ගමනාගමනයට විශාල බාධාවක් වී ඇත.මේ සම්බන්ධයෙන් **සභා නීතිඥ** ටි.එම්. ජනක සුමේධ මහතාගෙන්ද **නීති උපදෙස් ද ලබා ගත් අතර උපදෙස වූයේ ප්‍රාදේශීය සභා පනතේ 81 වගන්තිය ප්‍රකාරව කටයුතු කරන ලෙසයි** .ඒ අනුව පිච්චමල් ලන්ද ග්‍රාමයේ ජල කාණු පද්ධතිය අවහිර කිරිම සම්බන්ධ ගැටළුව විසඳා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 81 වගන්තිය අනුව ක්‍රියා කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** පිච්චමල් ලන්ද ග්‍රාමයේ ජල කාණු පද්ධතිය අවහිර කිරිම සම්බන්ධ ගැටළුව විසඳා ගැනීම සඳහා ප්‍රාදේශීය සභා පනතේ 81 වගන්තිය අනුව ක්‍රියා කිරිමට ඒකමතිකව **මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxx**

05-29 කිරිඇල්ල නගරයේ ඉදිකර ඇති පොදු වැසිකිලි පද්ධතියේ මුහුණතේ යූ.ජී.ආර්.ජෝතිපාල මයා විසින් ඉදිකර ඇති කඩ කාමර සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර නීත්‍යානු කූල ක්‍රියා මාර්ග ගැනීම සම්බන්ධ යෝජනාව.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>**

කිරිඇල්ල නගරයේ ඉදිකර ඇති පොදු වැසිකිලි ඉදිරිපිට යූ.ජී.ආර්.ජෝතිපාල මයා විසින් අනවසරයෙන් කඩ කාමරයක් ඉදිකර ඇති අතර මෙම ප්‍රදේශය නාගරික සංවර්ධන අධිකාරිය යටතේ ගැසට් කර නොමැති නිසා ප්‍රාදේශීය සභාවට නාගරික සංවර්ධන අධිකාරි

පනත යටතේ නඩු පැවරිමට නොහැකි බවත් ඒ සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඒ හරහා නීතිමය පියවර ගැනීම සුදුසු බවත් **සභා නීතිඥ** ටී.එම්. ජනක සුමේධ මහතාගේ **නීති උපදෙස් විය.** ඒ අනුව කිරිඇල්ල නගරයේ ඉදිකර ඇති පොදු වැසිකිලි පද්ධතියේ මුහුණතේ යූ.ජී.ආර්.ජෝතිපාල මයා විසින් ඉදිකර ඇති අනවසර කඩ කාමරය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඒ හරහා නීතිමය පියවර ගැනිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව** කිරිඇල්ල නගරයේ ඉදිකර ඇති පොදු වැසිකිලි පද්ධතියේ මුහුණතේ යූ.ජී.ආර්.ජෝතිපාල මයා විසින් ඉදිකර ඇති අනවසර කඩ කාමර ගැටළුව සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කර ඒ හරහා නීතිමය පියවර ගැනිමට ඒකමතිකව **මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**05-30 තාවකාලික කඩ කාමරයක් ලබාදෙන ලෙසට කුරුවිට ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු උප සභාපති සිරිපාල වීරසේකර මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය සම්බන්ධ යෝජනාව.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා</u>

**කුරුවිට ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු උප සභාපති සිරිපාල වීරසේකර මහතා විසින් සිදු කර ඇති ඉල්ලීම ට අනුව මා විසින් ඉදිරිපත් කර ඇති මෙම යෝජනාව පිලිබඳව දිර්ග ලෙස මිට පෙර සාකච්ජා වුනා. ඒ නිසා මෙම තාවකාලික කඩ කාමරයක් ලබාදෙන ලෙසට කුරුවිට ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු උප සභාපති සිරිපාල වීරසේකර මහතාගේ ඉල්ලීම අනුව කල යෝජනාවට අදාල කඩ කාමරය සම්බන්ධයෙන්ද තව දුරටත් කරුණු සොයා බලා ඉදිරි සභාවට ඉදිරිපත් කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx** ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව තාවකාලික කඩ කාමරයක් ලබාදෙන ලෙසට කුරුවිට ප්‍රාදේශීය සභාවේ හිටපු ගරු උප සභාපති සිරිපාල වීරසේකර මහතාගේ ඉල්ලීම අනුව කල යෝජනාවට අදාල කඩ කාමරය සම්බන්ධයෙන්ද තව දුරටත් කරුණු සොයා ඉදිරි සභාවට ඉදිරිපත් කිරිමට ඒකමතිකව මහා සභා සම්මත විය.**Xxxxxxxxxxxxxx**

05- 31- <u>ඇස්තමේන්තු සම්බන්ධ යෝජනා-නොමැත.</u>

**<u>2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-32 උද්‍ධෘතය</u>**

## 05-32 කසල කලමනාකරන සැලැස්ම 2022 වර්ෂය

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

කසල කලමනාකරන සැලැස්ම (2022 වර්ෂය) සඳහා මහා සභා අනුමැතිය ලබා දිමට යෝජනා කරමි.

**ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරනු ලබන යෝජනාව අනුව_**කසල කලමනාකරන සැලැස්ම (2022 වර්ෂය) සඳහා මහා සභා අනුමැතිය ලබා දිමට **ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxxxx**

**2022.01.18 දින කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ තීරන අංක 05-32 හි සත්‍ය උද්‍ධතයක් බව සහතික කරමි.**

**එස්.එච්.ආර්.වීරක්කොඩි,**
**ලේකම්,**
**ප්‍රාදේශිය සභාව,**
**කුරුවිට.**

## 06. කාරක සභාවල වාර්තා

## 06-01 මුදල් කමිටු වාර්තාව - 2021.12.30

### ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-

21.12.30 වන දින මුදල් කමිටු වාර්තාවසඳහා සභා අනුමැතිය ලබාදීමට යෝජනා කරමි.

### ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි දයා කස්තුරි මිය :-

2021.12.30 දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීම සුදුසු බවට ස්තිර කරමි.

### ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

අංක 256 වාණිජ සංකීර්ණය විදුලි බිල මාසිකව ගෙන්වා ගැනිම විෂය නිලධාරි වගකිම වන අතර මම මෙම දඩය විසන්ධි විම නැවත ලබා දීමේ ගාස්තුව ගෙවිම සම්බන්දව විරුද්ධතාවය ප්‍රකාශ කරන අතර අනෙක් බිල ගෙවන්න.විෂය නිලදාරි වගකිව යුතුයි.
මේ සම්බන්ධයෙන් අවවාද ලිපියක්ද විෂය නිලධාරී වෙත යොමුකිරිමට සාකච්ජා විය.

එසේම අංක 259 නඩුව. තහනම් නියෝගයක් දී ඇත.ගෙවිමට මම විරුද්ධ වෙමි.අභාසලාභි උපාධිධාරි මහේෂා විත්තිය ලෙස සිටි.ඉදිකරන්න එපා කියලා තියෙන්නේ.ගමන් වියදම් ගෙවනවා.නඩු පිලිබද සොයා බලා කටයුතු කරන්න.නීතිඥයා සමග නඩු ගැන සාකච්ජාවක් දමන්න.අතුරු නියෝග තිබියදී දිගට කටයුතු කිරිම වැරදියි.

එසේම 269 අංක 28 කඩ කාමරය.හිග විදුලි ගාස්තු .භාවිතා කලේ වෙන අයෙක්.ගෙව්වා නැද්ද සොයා බැලුවේ නැත්තේ ඇයි.වගකීම විෂය ලිපිකරු.අංක 278 නඩු ගාස්තු ගෙවීම පිලිබදව මා විරුද්ධ වෙමි.මෙම අත්තිවාරම දැමු අවස්ථාවේ තහනම් නියෝග ගත්තාද?ඒ ඉදි කිරිම සති ගානක් තියෙන්නට ඇත.

### ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා

හිටිය කෙනා ගෙවිය යුතුයි.ඇප තැන්පතු නැද්ද? ඒවා තියා ගත යුත්තේ මෙවැනි කටයුතු වලට වේ.

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**</u>

මෙය පැරණි හිඟයක් වේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

ගිය සභාවේ මා දැනුම් දුන්නා වලදුර පාරේ ගස් අදින බව.අක්කර 4 ක පමන ගස්.ඇප මුදල් ගන්න.කාර්මික නිලධාරිට කීවා.දැන් පාර විනාශ වෙමින් තියෙනවා.

අංක 279 ප්‍රවේශ පත්‍ර මුද්‍රනය.මෙම මුදල වැඩියි.හොඳ කොල වලින් ගැහුවත් මුදල වැඩියි.යන්ත්‍රෝපකරනයෙන් කැදෙව්වාද?

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**</u>

එමගින්.මිල කැදෙව්වද එම ආයතනයෙන් මෙම ටිකට් පත් මුද්‍රණය නො ාකරන බව දැනුම් දුනි. එසේම ඩෙක්මා ආයතනයේ ගානද වැඩියි.එවැනි තත්වයක් මත ලියාපදිංචි ආයතන මගින් මිල ගනන් කැදවා ඇත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා</u>

විගනන වාර්තා අපිටත් දෙන්න. විදුලි හිග දඩ බිල් ගෙවීම ගැටළුවකි.එසේම නඩු 1 දිනකට ගෙවීම් මුදල විශාල මුදලක්වේ.මාස්ක් මිල රු.6 .00 ක් වැනි මුදලක් වේ.මුදල් අපතේ යයි.මෙම මුදල වැඩියි.නගරේ ඔර්ලොසු කනුව ලග ලාබෙට ඇත.එසේම 266 රාක්ක ගැසීම තීන්ත සභාවෙන් ගානවනම් මුදල් ඉතිරිවේ.ලී අඩිය රු.100.00ට ගත හැක.මෙම මුදල වැඩියි.

<u>**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**</u>

මාස්ක් එම ලාභයට ඇති ස්ථාන දෙන්න.තවත් මිලදි ගැනීමට ඇත.බිල් සීල් අවශ්‍ය වේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා</u>

අඩුම මිල ගනන කැදවා ලබා ගැනීම විෂය ලිපිකරුගේ කටයුත්තක් වේ .අපි සාමාජිකයන් ලෙස සිදු කරනුයේ මුදල් කමිටුවට ඉදිරිපත් කරන මිල ගනන් වලින් අඩුම මිල ලබා ගැනීමයි.එසේම මෙම මුදල් කමිටු කටයුතු වල වැරදි පමනක් පෙන්වා දෙන අතර මෙම මුදල් කමිටුවේ සාමාජිකත්වයගෙන වගකීමක් දැරීමට හෝ වැරදි පෙන්වන අය අකැමැතියි.කරුණාකර කමිටුවේ සාමාජිකත්වය ගෙන එම කටයුතු වලට සහාය වන්න.එය වගකීමකි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණි නයනා ජීවනි මිය</u>

බිල්පොත් මුද්‍රනයෙදී අපි තේරුවේ අඩුම මිල එහි තිබුන.මේ කොටේෂන් කැඳවීමේදි ඒ පිලිබඳ දැනුවත් කරන්න.සබාව දැනුවත් කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**

සාමාන්‍ය මිල ගනන් පිලිබද කව්රුත් දන්නවා.අඩුම මිල පමනක් නෙවේ .ගුනාත්මක තත්වයත් බැලිය යුතුයි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

ජයරත්න මන්ත්‍රිතුමා පවසන ආකාරයට අඩුම මිලේ ඒවාත් ඇති නමුත් ඒවායේ තත්වයද බැලිය යුතුයි.එසේම මිල ගානක් කැදවීමේද සභාව දැනුවත්කර ලිපි ගහලා කටයුතු කිරිම ප්‍රායෝගික නොාවෙන අතර එසේ කටයුතු කිරීම සිදු කල නොහැක.එසේම මහා සභාවේ බලය මුද්ල කමිටුවට දී ඇත.තීරන ගැනිමට මුදල් කමිටුවට අයිතිය ඇත.යම් වරදක් ඇත්නම් සකසා ගමු.

**ගරුඋප සභාපති අනිල් ලියනගේ මහතා :-**

විවේචන තාර්කික විය යුතුයි ප්‍රායෝගික විය යුතුයි.එසේම මහා සභාවෙදි මෙ තීරන විශ්ලේෂනය කර සාකච්ජා කල හැකියි.සභාවේ ලියා පදිංචි පිරිසගෙන් මිල ගනන් කැදවීම වඩාත් සුදුසු වේ.හොඳම උචිතම දේ කරමු.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**Xxxxxxxxxxxxxxx 2021.12.30 වන දින මුදල් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්ම කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

මෙම අවස්ථාදෙ **ගරු ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රි අසංක දිල්ෂාන් මහතා නැවත සභාවට සහභාගී විය.**

## 06-02 කාර්මික කමිටු වාර්තාව -

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

2021.12.03 දින **කාර්මික කමිටු වාර්තාව** සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

21.12.03 දින කාර්මික කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි..

**ගරු ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

ගලි දෙක භාවිතා නොකරන නිසා පුද්ගලික අයෙකුට හෝ දෙමු. එසේම වාහන පිලිබද කටයුතු කිරිමට වැඩ ඒකකයක් ඇමීම වැදගත්.නැත්නම් වියදම් අධික සේම වාහන ඉක්මනින් විනාශ වේ.වාහන පිලිබද විධිමත්ව කටයුතු කිරිමට වැඩ ඒකකයක් ස්තාපිත කරන්න.

නගර සබාවේ වාහන හදනවා.අපේ වාහනත් අරන් හදනවා.තියෙන තනතුරක් යටපත් කරලා හෝ නව තනතුරක් හදලා වැඩ ඒකකයක් දාමු.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුළ මහතා :-**

විමල් ඇගෝ එකෙන් හදලා දිලා තියෙන්නේ.අක්කර 10 භූමිය තුල ඉදිරියේ ප්‍රයෝජනයට ගත හැකියි. ඒනිසා අළුත් වැඩියා කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.ජයරත්න මහතා**

ඇනයක් සවිකිරිමටත් ගෙවීම් කර ඇත.රියදුරුට ඇනයක් පවා සවි කර ගැනීමට නොහැකිවිම තුලින් කිසිදු ඵලදායි බවක් නොමැති බව පෙනේ.වියදම් අඩු කල යුතුයි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

**2021.12.03 දින කාර්මික කමිටු වාර්තා ව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

06-03 -පරිසර හා පහසුකම් කමිටුවාර්තාව -2022.01.12

**ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා-**

21.01.12 දින පරිසර හා පහසුකම් කමිටු වාර්තාව සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කිරීමට හා එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරමි..

**ගරු ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ආර්.සෝමරත්න මහතා-**

එම යෝජනාව ස්ථිර කරමි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**

ජල කම්ටු වාර්තාවද සබාව වෙත ලබා දෙන්න.මෙය මා කිප වතාවක් ඉල්ලා සිටියා.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

21.01.12 දින පරිසර හා පහසුකම් **කම්ටු වාර්තා ව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමට ත් එහි සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමත් සුදුසු බවට ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxx**

## 07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ

**07-01 2021 ඔක්තෝම්බර් මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය**

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**
2021 **ඔක්තෝම්බර්** මස මාසික ඒකාබද්ධ වැය සාරාංශය/ලැබීම් සාරාංශය/ ආදායම් අයකිරීමේ ප්‍රගතිය සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා :-**
එම යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා :-**
මෙම වාර්තා අදාල මාසයට අදාලව කඩිනමින් දෙන්න.විෂය මාසයට අදාලව දිය යුතුයි.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

මේ සම්බන්ධයෙන් යම් ප්‍රමාදයක් පවතින අතර තොරතුරු දැන ගැනිමට කාරක සභාවක් බවට පත් විමට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා :-**
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව කාරක සභා අවස්ථාවෙදි අදාල විෂය නිලධාරි අදහස් දක්වමින් වාර්තාව සැකසිම සඳහා තොරතුරු දියයුතු නිලධාරීන් එව්වා ලබා දිම ප්‍රමාද විම හේතුවෙන් මාසිකව **ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ සැකසීමේ දුෂ්කරතාවය සිදු වන බව දැනුම් දෙන ලදි.තව දුරටත් සියළු උපකාර්යාල හා නිලදාරින්ගේ ආදායම් වියදම් ලබා ගැනීමටත් යම් ක්‍රමවේදයක් සකසා මෙම ප්‍රකාශය නිසිපරිදි එම අදාල මාසයන්තුල සභා වාර්තාව සමගම ලබා දිමට කටයුතු කිරිමටත් සාකච්ඡා විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර් සෝමරත්න මහතා :-**
කාරක සභාව මහා සභාව බවට පත්කිරිමට යෝජනා කරමි.

**ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-**

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxxx 2021 <u>ඔක්තෝම්බර්</u> මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ආදායම් ඇස්තමේන්තුව,ඒකාබද්ධ වැය සාරාංශය, වියදම් ඇස්තමේන්තුව, ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

**මෙම අවස්ථාවේ ප.ව.2.00ට පමණ ගරු ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් අදහස් දක්වමින් 2022.02.11 දින ගරු නාලන්ද එල්ලාවල මැතිතුමාගේ 25 වන ගුණසමරුව යෙදී ඇති බවත් එදින ප.ව. 5.00ට කටුසියඔලාව පන්සලේදී බෝධිපූජාවක්ද ප.ව. 7.00ට ස්මාරකය අසල පහන් දල්වා ගුනසමරුව සිදුකරන බැවින් ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාට සහභාගීවන ලෙස ආරාධනා කරමින් අත්‍යාවශ්‍ය පුද්ගලික කරුනක් සඳහා මහා සභා වේ අවසරය ගෙන සභා සර්භයෙන් පිටවිය.**

## 07-02 <u>2021 දෙසැම්බර් මස ගෙවීම් වාර්තාව</u>

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

2021 <u>**දෙසැම්බර්**</u> මස ගෙවීම් වාර්තාව සඳහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි.

<u>ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා :-</u>
2021 <u>දෙසැම්බර්</u> මස ගෙවීම් වාර්තාව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන් අශෝක මහතා :-</u>
එම යෝජනාව ස්ථිර කරමි.

.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය.

> **Xxxxxxxxxxxxxx 2021 <u>දෙසැම්බර්</u> මස ගෙවීම් වාර්තාව ඒකමතිකව මහා සභා සම්මත විය.Xxxxxxxxxxxx**

## <u>08- වෙනත් කරුණු</u>

### <u>08-01 ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

**පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව-2022 අධ්‍යන වර්ෂය මෙම පාඨමාලාව පිළිබඳ විස්තර ගරු සභාව වෙත ඉදිරිපත්කරමි.අදාල අයදුම් පත්‍රද යොමු**

**කර ඇත.එසේම ප්‍රජා සංවර්ධනය පිලිබඳ ඩිප්ලෝමා පාඨමාලාව පිලිබද විස්තරද යොමු කරමි.අවශ්‍ය පිරිස අවධානය යොමු කරන්න.**

**08-02** **<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධනංජය වීරසේකර මහතා -</u>**

ජාතික නිදහස් දිනට සමගාමීව සුහද ක්‍රිකට් තරගයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාෙද්ශිය සභා කණ්ඩායම අතර පැවැත්වීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා සිටිමි.20021.01.28 දිනට.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු මැදිහත්වි සිදු කරන්න.

**2022.01.18 දින** කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ වෙනත් කරුනු 8-3 හි උද්‍ධෘතය

08-03 **ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

කැලි කසල ඉවත්කිරිම සම්බන්දයෙන් හිග්ගස්හේන සද්ධාතිස්ස මාවතේ පි.ඩි.සුනිල් කුමාර මයා සහ ඩි.ටි.නයෝමි මිය සබාවට මුදල් ගෙවන අතර මේ වන විට පවුල් 12 පමන මුදල් ගෙවා කසල ඉවත් කිරිමට ගෙවීම් කිරිමටකැමැත්ත පල කර ඇති නිසා ගෙවිම් කරන මසකට රු.1000.00 මුදල් අඩු කර දෙන ලෙස ඉල්ලා ලිපියක් යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තා ගෙන ඉදිරි කටයුතු කරමු.

**2022.01.18 දින** කුරුවිට ප්‍රාදේශිය සභාවේ පැවති මහා සභාවේ වෙනත් කරුනු 8-3 උද්‍ධෘතයේ සත්‍ය පිටපතක් බව සහතික කරමි.

එස්.එච්.ආර්.වීරක්කොඩි,
ලේකම්,
ප්‍රාදේශිය සභාව,
කුරුවිට.

08-4 ගල්ලෙන් විහාර මාවත සංවර්ධනය

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි දයා කස්තූරි මිය</u>**

කදන්ගොඩ ගල්ලෙන් විහාර මාවත ගල්ලෙන් විහාරයේ කොත් පැලදවීමේ අත්සවය වෙනුවෙන් පාර සකසාදෙන ලෙස ගරු ස්වාමීන් වහන්සේ ඉල්ලීම කල අතර පාර සෝදා පාළුවට ලක්ව ඇත. පාර කොන්ක්‍රිට් කර නැත.දෙපස කානු ගොඩ දමා පස්ටික වලවල් වලට දමා ගැනිමට යම් ප්‍රතිපාදනයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

කාර්මික නිලධාරි වාර්තා ගෙන කටයුතු කරමු.

08-05 ගල් පුස්සැල්ල බහු කාර්ය ගොඩනැගිල්ලට යන මාර්ගය සැකසීම

**<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>**

ගල් පුස්සැල්ල බහු කාර්ය ගොඩනැගිල්ලට යන මාර්ගය සැකසීමට එක් දිනක් ජේසීබි යන්ත්‍රය ලබා දෙන ලෙස ජනසරන ග්‍රාම සංවර්ධන සමිතිය ඉල්ලීමක් කර ඇත. කාර්මික නිලධාරි වාර්තා ගෙන කටයුතු කරමු.

<u>08-06 ගලුකාගම වැරනියගොඩ සිට ජානක පුර දක්වා මාර්ගය පලල් කිරිම</u>

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.පී.ජීවන් රනතුංග මහතා -</u>**

ගලුකාගම වැරනියගොඩ සිට ජානක පුර දක්වා මාර්ගය නියමිත ප්‍රමානයට පලල්කර සකස්කිරිම සඳහා ප්‍රාදේශිය සභාවේ මැදිහත්වීම ලබා දෙන ලෙස ඉල්ලමි.මෙම මාර්ගය කෙටි

මාර්ගයක් වන අතර ඇතැම් ස්ථාන වලදී පටු වේ.අඩි 14 පමන හෝ පලල් කිරිම කල යුතුය.පුද්ගලික ඉඩම් හිමියන් පාර ඉඩම අල්ලා ඇත.

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-**

කාර්මික නිලධාරි වාර්තා ගෙන කටයුතු කරමු.

08-07- ගරු මන්ත්‍රිතුමන්ලා සඳහා නය ලබා ගැනිම

**ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා**

නය ඉල්ලිම් න්‍යාය පත්‍රයට ඇතුලත් කර ඉල්ලන්න.

08-08 **ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා**

දෙහෙරගොඩ හයිරෝඩ් යටතේ මාර්ග 2ක් අවසන් කලා.දංලන්දේ මාර්ගයේ බෝක්කුවක් නිසා ගැටළුවක්. මෙය අනතුරක් විය හැකි නිසා කාර්මික නිලධාරිබලල අවශ්‍ය පියවර ගන්න.

ගරු පවිත්‍රා ඇමතිතුමියත් ගරු වාසුදේව ඇමතිතුමාත් විවෘත කරන්නේ.දංලන්ද වංගුව පේන්නෙ නෑ.මිනිස්සු ගස් හිටවලා.ගමේ මිනිස්සු කීවොත් හරි නෑ.

## 09- හදිසි යෝජනා

09-01 මාර්ගය පුළුල් කිරිම

**ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා**

කුරුවිට නගර සංවර්ධනයේදි මංතීරු 4 කින් මාර්ගය පුළුල් කිරිමට කටයුතු කරයි.

මේ වන විට අදාල කටයුතු සිදු කරමින් පවතී.මන්තිරු 4 සංවර්ධනය කිරීමේදි කුරුවිට නගර මධ්‍යයේ ඇති ඔර්ලෝසු කණුව බාධාවක් වි ඇති නිසා ඉවත්කිරිමටඅවශ්‍ය වේ.ඒ අනුව කුරුවිට නගර සංවර්ධනය යටතේ මාර්ගය මං තීරු 4 කින් මාර්ගය පුළුල් කිරිමට බාධාවක් වි ඇති ඔර්ලෝසු කණුව අදාල අංශ දැනුවත් කර නීත්‍යානු කූලව ඉවත්කිරිමට යෝජනා කරමි.මෙය හදිසි යෝජනා යටතේ ඉදිරිපත් කරන අතර යෝජනාව මා ඇතුළුව ගරු මන්ත්‍රිතුමන්ලා පිරිසක් අත්සන යොදා ඇත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ආර්. සෝමරත්න මහතා -**

එම යෝජනාව ස්ථිර කරමි. එම ස්ථානයේ නැවත බැම්ම ඉදි කරන්නේ ඇයි?යූ.ඩී.එකට හා ආර්.ඩි එකට කීවා. මුදල් අපතේ යන ක්‍රියාවක්.මෙම කණුව ඉවත් කරන්න වෙනවා.මාර්ගය

පළල් කිරීම කාටත් අවශ්‍යයි. වසර සිය ගනන් පැරණි ඉදි කිරීමක් නොවන අතර ඉවත් කල යුතු කණුව වටා බැම්මක් ඉදි කිරීම නිෂ්ඵල කටයුත්තකි.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

මේ සම්බන්ධයෙන් ආර්.ඩී හා යූ .ඩී සමග කතා කල යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අසංක දිල්ෂාන් මහතා

**1998 වසරේදි ගරු හිටපු ජනපති ආර්. ප්‍රේමදාස මැතිතුමා විසින් හයිඩ්‍රාමනී ආයතනය ට සමගාමීව මෙම ඔර්ලෝසු කණුවත් විවෘත කිරිමත් කර ඇත.එය නඩත්තුව භාරකාරත්වය හයිඩ්‍රාමනී ආයතනය සතුයි. ඒනිසා නියම ක්‍රම වේදයට සියළු පාර්ශව දැනුවත් කර මෙම කණුව ඉවත් කිරීම සුදුසුයි.නගරයට ඔර්ලෝසු කණුවක් අවශ්‍ය නම් ත්‍රිකෝන මාන ලෙස ඉදිකල කනුවක් සුදුසුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි නයනා ජීවනි මිය

**මෙවැනි තීරන එකවර නොගතයුතු අතර සොයා බලා අවශ්‍යම වෙනම් පමනක් ඉදිරි කටයුතු කරන්න.මාගේ අදහස හයිඩ්‍රාමනි ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන මෙම කණුව සම්බන්ධව අදාල පාර්ශව දැනුවත් කරන්න.ඒ ආයතනය මේ ප්‍රෙද්ශයට මිනිසුන්ට තිබෙන විශාලම ජීවනෝපාය.කනුව මාර්ග සංවර්ධනයට බාධාවක් නොවන ලෙස මංතීරු අතරින් තබාගත නොහැකිද?නමුත් වැඩි මතය කණුව මාර්ග සංවර්දනයට බාධා නිසා ඉවත් කලයුතු බවනම් මාද ඊට එකග වෙමි.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා

**කණුව අතරින් මංතීරු සැකසීම ප්‍රායෝගික නොවේ.වැව් වැනි ස්ථාන සැකසීමේදි පවා බුදුපිළිම ආදියද ජලාශ වලට ද යටවේ.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දිප්ති චන්දන මහතා -

**අනාගත පරපුර වෙනුවෙන් ගතයුතු තීරන ගන්න.සභා අනුමැතිය දි ඇති අතර අවශය වේ නම් පිරිස සමග සාකච්ඡා කර ඉදිරි කටයුතු කඩිනම් කරන්න.**

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

> **Xxxxxxxxxxxxxxx** <u>හදිසි යෝජනා</u> **යටතේ ඉදිරිපත් කරන ලද** යෝජනාව අනුව කුරුවිට නගර සංවර්ධනය යටතේ මාර්ගය මං තීරු 4 කින් යුතුව පුළුල් කිරිමට බාධාවක් වි ඇති නගර මධ්‍යයේ ඇති ඔර්ලෝසු කණුව අදාල අංශ දැනුවත් කර නීත්‍යානු කූලව ඉවත්කිරිමට **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxxxxxx**

<u>09-02-කිරිඇල්ල වෙළඳ සංකිර්ණ ය පිලිබඳ සාකච්ජාව</u>

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

කිරිඇල්ල වෙළඳ සංකිර්ණ සාකච්ජාව තිබුණා.දැනට මාළු කඩ වලට වෙන් කල ස්ථානයේ කඩ 3 ක් වෙන් කර ඇත.අදහසක් ආවා අඩි 10 පමන පස්සට කර මාළු කඩ මස් කඩ ඉදි කලොත් මේ කඩ 3 න් ප්‍රයෝජනයක් ගත හැකි බවට. සභා අනුමැතියක් මත හැකියි මෙය සිදු කිරිමට.නියෝජය ප්‍රධාන ඉංජිනේරුත් එදින ආවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි අසංක එරන්ද මහතා -</u>

මං මෙම කටයුත්තට විරුද්ධයි.මාත් කඩ හිමියෙක්.තව කාලයක් අපිට ඉන්න වෙයි.ඒ කඩෙත් හදන තුරු.

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-</u>

කඩිනමින් හදලා ඉවර කරනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රංජන් ප්‍රදීප් මහතා -</u>

කුළුන ගහන තැන ඉදිකිරිම කුමක්ද?වතුර කසල කානු හැමතැනම.මස් කඩ මාව කඩ හැමතැනම.මුහුනතේ හදලා.අසංක මන්ත්‍රිතුමාගේ නෙමේ වෙනත් පැත්තක හැදිලා තියෙන්නේ මස්මාළු කඩ. මූතතේ අපි යෝජනා කල ලෙස නෙමේ හැදිලා තියෙන්නේ.දැන් පටත් ගත්ත තැනම ඒවා ඉදිවෙලා.ප්‍රධාන වෙලා තියෙන්නේ ඒවා.නගරේ ආසන්න මන්ත්‍රිලා ලෙස අපිට දැනුම් දිමක් කලේ නෑ මේ සාකච්ජාව පිලිබදව.මෙම ඉදිකිරිම ගැටළුවක් වෙයි.ස්ථානීය පරීක්ෂාවක් කරන්න.

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

අපි එම ස්ථානයට ගියේ වැඩ ප්‍රමාද නිසා.එය බලන්න.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

මෙමකර්මාන්තය විහිළුවක් බවට පත්ව ඇත. ගිවිසුම් කාලය අනුව කරලා නෑ.මුදල් වෙන් කර මුදල් දුන්නත් වැඩ ඉවර නෑ. මේ භූමිය ට රථගාලක් අවශ්‍යයි.මස් මාළු කඩ වල ජලය පාසැල මැදින් ගියොත් එය විශාල ගැටළුවක්වේ.

මෙය සැලැස්ම අනුව කරන්න.වෙනස් කිරිම් කරන්නේ නම් සභා අනුමැතිය ගත යුතුයි.

වැඩ ඉතාමත් ප්‍රමාදයි.මස්කඩ වල ජලය බැහැර වෙන්නේ කොහාටද?අතිරේක වියදම් දරන්නේ කව්ද?වැඩ ප්‍රමාද නිසා කී වතාවක් සංශෝදනය කලාද?

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

30 වන විට අපිට හදලා භාර දෙන්න කීවා.ඒ ඇස්තමේන්තු වියදම් කොන්ත්‍රාත්කරුම දරනවා. මස්මාළු කඩ වලජලය බැහැර කිරිම පිළිබඳ සාකච්ජා කලා. ලබන 25 සම්බන්ධීකරනකමිටු දිනදි හෝ 26 හෝ බලමු. රන්ජන් **මන්ත්‍රි,ධනවර්ධන මන්ත්‍රි,ජයරත්න මන්ත්‍රිතුමන්ලාත් එන්න.ඒ සදහා .**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා

**අපි තීන්දු ගන්නාවිට ඒකපාර්ශවික වුවහොත් වැරදි ලෙස දැකිය හැකියි. කිරිඇල්ල සම්බන්ධිකරනයේදි සභාදේපොල ගැන අවධානය යොමු කරන්න.සුබෝධ මහතා හට මාර්ගය දිම සම්බන්දව ගැටළු පවති.මෙම ගැටළු පිළිබදව අවධානය යොමු කරන්න. අසංක මන්ත්‍රිතුමාත් ලිපියක් දීලා.වගකීම ගත යුතුයි.සියළු ගැටුම් නිරාකරනය කර ගමු.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි රංජන් ප්‍රදීප් මහතා -

**මෙතන යම් මතයක් තියෙනවා.සුබෝධට ප්‍රවේශ මගක් දුන් නිසා වැව්ට සාප්පුවත් ඉල්ලයි කියලලු මාලු කඩ හැදුවේ .දෙනවානම් සේරටම දෙන්න.සභාව අනුමැතිය දීමෙන් අප්‍රසාදයට පත්ව ඇත.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ජී.එම්.ජයරත්න මහතා

**ප්‍රතිපත්තියක් නැත.මාලුකඩ හැමතැනම ඇත.**

ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා:-

**මාස ගනනාවක් ගියද ඉල්ලුවේ නැත.30දින වන විට අපිට පහල මහල ලැබෙනවා.සැලුන් ට්‍රේලර් නොතාරිස් උඩට දාන්න වෙනවා.සභාව දැනුවත් කරලයි සුබෝද්දට පාර දුන්නේ.**
ජනතාව කවුරුන් හෝ දියුනු වීම සතුටක්.කාට හරි යහපතක් සිදු වේ.දිය හැකි දේ දෙමු. ඒ අනුව කිරිඇල්ල වෙළඳ සංකිර්ණ මස් කඩ මාළු කඩ සදහා වෙනත් කඩ කාමර 3ක් සැකසිම සම්බන්ධයෙන් ලබන සදුදා හෝ අගහරුවාදා දින එම ස්ථානය පරීක්ෂාවක් කර තීරණයක් ගැනීමට යෝජනා කරමි.එම දිනදි රන්ජන් **මන්ත්‍රි,ධනවර්ධන මන්ත්‍රි,ජයරත්න මන්ත්‍රිතුමන්ලාත්** සහභාගීවෙන්න.
මෙ යෝජනාව හදිසි කටයුත්තක් බැවින් හදිමි යෝජනා යටතේ ඉදිරිපත් කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභාවේ මතය විමසීමෙන් පසු පහත තීරණය ඒකමතිකව මහ සභා සම්මත විය

> **Xxxxxxxxxxxxxxx**_ගරු සභාපතිතුමා විසින් හදිසි යෝජනා යටතේ **ඉදිරිපත් කරන ලද** කිරිඇල්ල නගරයේ වෙළඳ සංකිර්ණය අසල මස් කඩ මාළු කඩ සදහා වෙනත් කඩ කාමර 3ක් සැකසිම සම්බන්ධ යෝජනාව පිලිබඳව ලබන සදුදා හෝ අගහරුවාදා දින එම ස්ථානය පරීක්ෂාවක් කර තීරණයක් ගැනීමට **ඒකමතිකව මහා සභා සම්මත විය. Xxxxxxxxxxxxxxx**

- **ස්තූතිය.**

<u>ගරු සභාපති ප්‍රේමරත්න මල්කැකුල මහතා :-</u>
මහජන කටයුතු වෙනුවෙන් මෙම අවදානම් සමයේ වුවද සෞඛ්‍ය නීති අනුගමනය කරමින් සහභාගිවී සහය ලබාදුන් සියළු දෙනා හට ස්තූතිය පල කරමි.
සභාවේ කටයුතු ප.ව. 2.45 ට පමණ අවසන් කරන ලදී.

ප්‍රේමරත්න මල්කැකුළ
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කුරුවිට.

පිටපත් : -
06.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
07.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)

08.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
09.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන්
සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන්
හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
10.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී
- (දැ.ගැ.පි)